ශ්‍රී ලංකාවේ

# කෘෂිකාර්මික අංශයට අඛණ්ඩව
# ජීවය ලබා දෙමින්...

**කෘෂිකර්ම අමාත්‍යාංශය**
80/5, "ගොවි ජන මන්දිරය"
රජමල්වත්ත මාවත,
බත්තරමුල්ල,
ශ්‍රී ලංකාව.

| | |
|---|---|
| දුරකථන අංකය | : 011 - 2 869 553 |
| ෆැක්ස් අංකය | : 011 - 2 868 910 |
| ඊමේල් | : ituagrimin@gmail.com |
| වෙබ් | : www.agrimin.lk |

Concept, Creative Write, Photography, Layout & Design

613/3, High Level Road, Gangodawila,
Nugegoda, Sri Lanka.
+94 11 302 4950 | +94 71 224 11 00
kalawainfo@gmail.com

# වාර්ෂික වාර්තාව

2016

සීමාසහිත ලංකා පොහොර සමාගම

**සීමාසහිත ලංකා පොහොර සමාගම**
ලක් පොහොර ස්වර්ණ ජයන්ති මාවත,
හුණුපිටිය, වත්තල, ශ්‍රී ලංකාව.

දුරකථන අංකය : 011-2 930 298/ 99 | ෆැක්ස් අංකය : 011-2 947 763
ඊමේල් : lakpohora@sltnet.lk | වෙබ් : www.lakpohora.lk

# සම්මාන




CNCI Achivers Awards 2014
ජාතික මට්ටමේ කුසලතා
සම්මානය




වාර්ෂික වාර්තා සම්මාන
2014 අනුකූලතා සම්මානය




ජාතික කෘෂි ව්‍යාපාර
සම්මාන 2014 රිදී සම්මානය




ISO14001:2004 පාරිසරික
තත්ත්ව සහතිකය




JASTECA CSR සම්මාන 2014
කුසලතා සම්මානය




අකිමොටෝ එස්5 සම්මාන
2014 කුසලතා සම්මානය



ජාතික ව්‍යාපාරික විශිෂ්ටතා
සම්මාන 2014 -
රන් සම්මානය




SLCBCC ව්‍යාපාරික තරුව
2014 රිදී සම්මාන




මානව සම්පත් කළමනාකරණ
සම්මාන 2014 රිදී සම්මානය




ජාතික ඵලදායිතා සම්මාන -
2013/ 14 දෙවන ස්ථානය




ජාතික තත්ත්ව සම්මාන 2014
කුසලතා සම්මානය

# පටුන


| | |
|---|---|
| මේ තාක් ආ ගමන් මඟ | 08 |
| ආයතනික තොරතුරු | 09 |
| දැක්ම හා මෙහෙවර | 12 |
| මූල්‍ය ප්‍රකාශන | 15 |
| පසුගිය වසර දහයේ මූල්‍ය තත්ත්වයේ සමාලෝචනය | 16 |
| සභාපතිතුමාගේ පණිවුඩය | 18 |
| සාමාන්‍යධිකාරීතුමාගේ ප්‍රකාශය | 20 |
| අධ්‍යක්ෂ මණ්ඩලය | 24 |
| කළමනාකරණ කණ්ඩායම | 30 |
| කළමනාකරණ විවරණය හා විශ්ලේෂණය | 34 |
| මානව සම්පත්  කළමනාකරණය | 40 |
| ආයතනික ප්‍රජාව | 45 |
| ආයතනික යහපාලනය | 51 |
| ආයතනික ව්‍යුහය | 53 |
| අවදානම් කළමනාකරණය | 54 |
| විගණන හා අවදානම් කළමනාකරණ කමිටුවේ වාර්තාව | 56 |
| අපගේ භූගෝලීය පැතිරීම | 59 |
| මූල්‍ය ප්‍රකාශන | 61 |
| අධ්‍යක්ෂවරුන්ගේ වගකීම් පිළිබද ප්‍රකාශය | 63 |
| සභාපතිතුමාගේ සහ මූල්‍ය කළමනාකරුගේ වගකීම පිළිබද ප්‍රකාශය | 64 |
| ස්වාධීන විගණකගේ වාර්තාව | 65 |
| විස්තීරණ ආදායම් ප්‍රකාශය | 70 |
| මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය | 71 |
| හිමිකම් වෙනස්වීම් පිළිබඳ ප්‍රකාශය | 72 |
| මුදල් ප්‍රවාහ ප්‍රකාශය | 73 |
| මූල්‍ය ප්‍රකාශවලට සටහන් | 74 |
| පෙරකලාසි ආකෘතිය | 98 |



# වී වගාව සඳහා භාවිතා කරන සෘජු පොහොර

යූරියා, මියුරිකේට් පොටෑෂ්, ට්‍රිපල් සුපර් පොස්පේට් සහ සින්ක් පොස්පේට් යන සෘජු පොහොර වර්ග අප ගොවීන් හට සපයනු ලබයි.



# මේ තාක් ආ ගමන් මඟ

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ ජර්මානු රජයේ මූල්‍ය හා තාක්ෂණීය ආධාර ඇතිව 1964දී සීමාසහිත ලංකා පොහොර සමාගම ස්ථාපිත කරන ලදි. මෙය කෘෂිකාර්මික අමාත්‍යාංශය යටතේ ක්‍රියාත්මක වන අතර එහි පූර්ණ හිමිකාරිත්වය ශ්‍රී ලංකා රජය සතුයි.

එහි මූලික කාර්යභාරය වන්නේ ශ්‍රී ලාංකික කාෂිකාර්මික ක්ෂේත්‍රයේ පොහොර අවශ්‍යතා සපුරාලීම වන අතර මෙම වගකීම අප විසින් ඉටු කරමින් සිටින අතර එහිදී අපගේ ප්‍රමුඛ අවධානය යොමු කරන්නේ නිමවුමේ ගුණාත්මකභාවය පිළිබඳවය. මෙම වගකීම අප කාලාන්තරයක් තිස්සේ රසායනික පොහොර ආනයනය කිරීම, ගුණාත්මක පොහොර නිපදවීම සහ මිශ්‍ර කිරීම තුළින් සිදු කරන අතර අපගේ ප්‍රාදේශීය පොහොර ගබඩා ඒකක සහ බලය ලත් බෙදාහැරීම් ජාලය ඔස්සේ අපගේ පොහොර නිෂ්පාදන ලංකාව පුරාම බෙදාහැරීම ද සිදු කරයි.

එවකට රාජ්‍ය ප්‍රතිපත්තිය වූ රජය සතු සංස්ථාපිත ආයතන, 1987 අංක 23 දරන සමාගම් පනත රජයේ හිමිකාරිත්වය ඇති සමාගම් බවට පත් කිරීමේ වැඩපිළිවෙල යටතේ, අප ආයතනය එහි ආරම්භක නාමය වෙනස් නොකර පෙර කී සමාගම් පනත යටතේ 1992 සැප්තැම්බර් 15 දින නැවත අප සමාගම ප්‍රතිස්ථාපිත කරන ලදි. මේ වනවිට අප සමාගම 2007 අංක 7 දරන සමාගම් පනත යටතේ ලියාපදිංචි කර ඇත.

# ආයතනික තොරතුරු

### සමාගම් නාමය

සීමාසහිත ලංකා පොහොර සමාගම

### සමාගම් ලියාපදිංචි අංකය

PB 499

### නෛතික ස්වභාවය

ශ්‍රී ලංකාව තුළ සංස්ථාපනය කරන ලද මහා භාණ්ඩාගාරයේ ලේකම්ගේ පූර්ණ හිමිකාරිත්වය සහිත වගකීමෙන් සීමිත සමාගමකි.

### ලියාපදිංචි කාර්යාලය සහ ලිපිනය

සීමාසහිත ලංකා පොහොර සමාගම
ලක්පොහොර ස්වර්ණ ජයන්ති මාවත, හුණුපිටිය, ශ්‍රී ලංකාව
දුරකථන : 011 2 930 298 / 99 | ෆැක්ස් : 011 2 947 763
විද්‍යුත් තැපෑල : lakpohora@sltnet.lk | වෙබ් අඩවිය : www.lakpohora.lk

# අධ්‍යක්ෂ මණ්ඩලය

සභාපති

**රෝෂන වඩුගේ මහතා**

ක්‍රියාකාරී අධ්‍යක්ෂ

**චන්දන පැල්පිට මහතා**

**මාධව වත්තේගම මහතා**

අධ්‍යක්ෂවරු

**ජේ.එම්.එස්.ඩී. රත්නායක මහත්මිය**
අතිරේක අධ්‍යක්ෂ ජනරාල්
ජාතික ප්‍රතිපත්ති සැලසුම්
දෙපාර්තමේන්තුව

**අනෝජා හේරත් මහත්මිය**
අධ්‍යක්ෂ - සංවර්ධන
කෘෂිකර්ම අමාත්‍යංශය

**හේමක ලසිත් බාලසූරිය මහතා**

**උපුල් පීරිස් මහතා**

සමාගම් ලේකම්

**මොරවක මහතා**
නීතිවේදී,
මහජන නොතාරිස්

**සංජය අමරතුංග මහතා**
එස් ඇන්ඩ් ඒ කන්සල්ටන්ට්ස්
(පෞද්ගලික) සමාගම

# කළමනාකරණ කණ්ඩායම

**පී.ආර්. සමරවීර**
සාමාන්‍යාධිකාරී (වැඩබලන)
කළමනාකරු (මූල්‍ය)

**බී.ඩී.එල්. කුමාරසිරි මහතා**
ප්‍රධාන අභ්‍යන්තර විගණක

**ඉංජිනේරු ඩී.එම්.එන්.ඒ. දිසානායක**
කළමනාකරු (තාක්ෂණික)

**ආර්.ඒ.පී. පෙරේරා මහතා**
කළමනාකරු (බෙදාහැරීම්)

**ආර්.පී.එස්. බොධිපාල මහත්මිය**
කළමනාකරු (විකුණුම් සහ අලෙවි ප්‍රවර්ධන)

**සී.පී.පී. බුලත්සිංහල මහතා**
කළමනාකරු (වැඩබලන)
(පරිපාලන සහ මානව සම්පත්)

**පී.පී. සමන් මහතා**
කළමනාකරු (වැඩබලන)
සම්පාදන සහ ආනයන



# තේ වගාව සඳහා

T-65, T-200, T-750, UT-1625, UT-397, UT-752, VPLC-880, VPLC-945, VPUM-910, U-625, ST/UM-400, STUVA-435, U-709



# දැක්ම

ශ්‍රී ලාංකික පොහොර වෙළෙඳපොළ නියමුවා ලෙස කෘෂි ක්ෂේත්‍රය හා ඒ ආශ්‍රිත නව නිපැයුම් සේවා හා යෙදවුම් සපයන විවිධාංගීකරණය වූ නව ලොවට ගැළපෙන ප්‍රමුඛතම ආයතනය වීම.



# මෙහෙවර

රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ලක් පොහොර පවුලේ උපරිම දායකත්වයෙන් ශ්‍රී ලංකාවේ කෘෂිකර්ම හා ගොවිජන සේවා ක්ෂේත්‍රයේ නිෂ්පාදන, ආදායම හා ලාභදායිත්වය වැඩි කිරීම සඳහා බහුවිධ වෙළෙඳපොළ ඉල්ලුමට සරිලන පොහොර නිෂ්පාදනය හා අලෙවිය තුළින් සමාගමේ ලාභදායී තිරසාර පැවැත්ම තහවුරු කිරීම.

# අනෙකුත් භෝග සඳහා

එළවුළු, පලතුරු, අල වර්ග, මිරිස්, කව්පි, රටකජු, මුං ඇට සහ ඉරිඟු යනාදිය සඳහා විශේෂයෙන්ම මිශ්‍ර කරන ලද පොහොර



# මූල්‍ය අවධාරණයන්




| ආදායම් අවධාරණයන් හා අනුපාත | | 2016 | 2015 | වෙනස |
|---|---|---|---|---|
| | | රුපියල් | රුපියල් | % |
| ආදායම | රු. | 4,242,769,733 | 3,835,989,834 | 11% |
| බදු පෙර ලාභය | රු. | 836,604,005 | 520,200,738 | 61% |
| ආදායම් බදු වියදම් | රු. | 233,331,176 | 134,184,888 | 74% |
| වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම | රු. | 603,272,829 | 386,015,851 | 56% |
| ලාභාංශ | රු. | 30,000,000 | 115,804,755 | (-74%) |
| කොටසක ඉපැයුම | රු. | 12.01 | 7.68 | 56% |
| වත්කම් මත ප්‍රතිලාභ | රු. | 165% | 87% | - |
| හිමිකම් මත ප්‍රතිලාභ | රු. | 12.8% | 9.2% | - |
| | | | | |
| **මූල්‍යම තත්ත්ව අවධාරණයන් හා අනුපාත** | | | | |
| මූල්‍ය වත්කම් | රු. | 36,603,359,337 | 44,549,598,217 | (-18%) |
| මුළු හිමිකම් | රු. | 4,728,367,363 | 4,205,441,355 | 12% |
| නිකුත් කළ කොටස් සංඛ්‍යාව | සංඛ්‍යාව | 50,245,608 | 50,245,608 | - |
| කොටසකට ශුද්ධ වත්කම් | රු. | 94.11 | 83.70 | 12% |

# පසුගිය දස වසර තුළ මූල්‍ය අවධාරණයන්

| | 2007 | 2008 | 2009 | 2010 | 2011 | 2012 | 2013 | 2014 | 2015 | 2016 |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| | ශ්‍රී.ල.ගි.ප්‍ර | ශ්‍රී.ල.ගි.ප්‍ර | ශ්‍රී.ල.ගි.ප්‍ර | ශ්‍රී.ල.ගි.ප්‍ර | ශ්‍රී.ල.ගි.ප්‍ර | ශ්‍රී.ල.ගි.ප්‍ර | ශ්‍රී.ල.ගි.ප්‍ර | ශ්‍රී.ල.ගි.ප්‍ර | ශ්‍රී.ල.ගි.ප්‍ර | SLFRS |
| | | (මාස 7ක් සඳහා) | (මාස 7ක් සඳහා) | | | | | | | |
| **විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය** | | | | | | | | | | |
| ආදායම | 1,597,921,714 | 900,461,713 | 1,370,080,315 | 1,904,299,851 | 2,246,402,738 | 2,496,268,383 | 2,450,132,816 | 2,563,549,727 | 3,835,989,834 | 4,242,769,733 |
| දළ ලාභය | 236,228,785 | 204,414,682 | 221,286,371 | 322,826,103 | 414,124,001 | 310,189,751 | 621,684,097 | 575,467,461 | 855,558,167 | 1,097,447,923 |
| වෙනත් ආදායම් | 146,931,059 | 76,899,044 | 130,892,642 | 132,287,779 | 157,164,017 | 197,912,757 | 108,809,998 | 93,172,755 | 142,197,667 | 122,926,594 |
| බදු පෙර ලාභය | 3,599,741 | 26,957,610 | 35,088,271 | 42,411,705 | 73,979,009 | 159,544,495 | 199,894,319 | 241,328,764 | 520,200,738 | 836,604,005 |
| බදු | (13,771,790) | (19,766,392) | (25,092,763) | (35,000,000) | (43,666,668) | (52,315,944) | (73,037,738) | (62,869,312) | 134,184,888 | (233,331,176) |
| බදු පසු ලාභය | (10,172,049) | 7,191,217 | 9,995,508 | 7,411,705 | 30,312,341 | 107,228,551 | 126,856,581 | 178,459,452 | 386,015,851 | 603,272,829 |
| **මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය** | | | | | | | | | | |
| ප්‍රකාශිත ප්‍රාග්ධනය | 444,456,080 | 444,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 | 502,456,080 |
| ප්‍රත්‍යාගණන සංචිත | 1,616,307,519 | 1,616,307,519 | 1,616,307,519 | 1,986,087,280 | 1,986,087,280 | 1,836,179,780 | 1,835,723,580 | 1,835,723,580 | 1,833,071,080 | 1,833,071,080 |
| ආදායම් සංචිත | 184,198,282 | 191,389,499 | 201,385,007 | 208,796,713 | 224,109,054 | 1,285,578,730 | 1,397,891,510 | 1,500,363,432 | 1,869,914,195 | 2,392,840,203 |
| මුළු හිමිකම් | 2,244,961,881 | 2,252,153,098 | 2,320,148,607 | 2,697,340,072 | 2,712,652,414 | 3,624,214,590 | 3,736,071,170 | 3,838,543,092 | 4,205,441,355 | 4,728,367,363 |
| දේපළ, පිරියත හා උපකරණ | 1,647,477,060 | 1,642,814,214 | 1,686,442,553 | 1,902,075,430 | 1,895,412,152 | 1,908,557,760 | 1,882,887,059 | 1,879,174,306 | 1,865,055,225 | 1,838,655,988 |
| නොනිමි ප්‍රාග්ධන වැඩ | 17,895,434 | 17,895,434 | 20,024,735 | 15,934,103 | 542,901 | - | - | - | 29,982,587 | 32,152,294 |
| විලම්භිත බදු වියදම | - | - | - | - | - | 4,862,949 | 73,037,738 | 5,561,375 | 37,484,888 | - |
| භාණ්ඩාගාර බිල්පත්වල ආයෝජනය | 132,782,037 | 146,109,366 | 172,614,796 | 332,205,456 | 434,767,955 | 471,025,753 | 338,620,163 | 471,894,936 | 489,125,747 | 514,903,604 |
| අස්පෘශ්‍ය වත්කම් | - | - | - | - | - | - | 669,017 | 344,717 | 115,417 | 79,667 |
| විලම්භිත බදු වත්කම් | - | - | - | - | 76,814,523 | 71,951,574 | - | - | - | - |
| ශුද්ධ ජංගම වත්කම් | 582,772,763 | 592,829,041 | 610,949,150 | 12,476,640,540 | 6,975,143,544 | 1,706,541,296 | 1,915,693,141 | 2,025,842,182 | 2,417,551,302 | 2,963,028,124 |
| විලම්භිත බදු බැරකම් | - | - | - | - | - | - | 1,086,164 | 6,647,539 | 44,132,427 | 40,928,542 |
| කෙටි/ දිගුකාලීන ණය | - | - | - | 11,837,929,928 | 5,369,929,928 | - | - | 17,728,367,618 | 31,304,325,268 | |
| **මුදල් ප්‍රවාහ ප්‍රකාශනය** | | | | | | | | | | |
| මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | (5,537,840,553) | (9,812,750,171) | (23,925,719) | (12,169,047,254) | (16,012,155,140) | 12,695,227,509 | (9,517,159,808) | (5,094,105,859) | (9,560,794,959) | (738,963,570) |
| ආයෝජන ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | 5,347,791,109 | 9,796,712,574 | (85,865,511) | 12,216,587,459 | (36,565,665) | (8,458,411) | 83,232,936 | (508,688,188) | (1,021,212,231) | (1,086,700,012) |
| මූල්‍ය ක්‍රියාකාරකම්වලින් ශුද්ධ මුදල් ප්‍රවාහය | (40,493,187) | (19,176,247) | 46,739,763 | (159,725,222) | 16,168,483,382 | (13,079,312,780) | 9,575,483,282 | 5,654,013,585 | 10,614,850,014 | (3,843,885,272) |
| **වෙනත් තොරතුරු** | | | | | | | | | | |
| කොටසක ඉපැයුම (රු.) | (0.23) | 0.16 | 0.22 | 0.17 | 0.60 | 2.13 | 2.52 | 3.55 | 7.68 | 12.01 |
| කොටසකට ලාභාංශය (රු.) | - | - | 0.06 | 0.06 | 0.18 | 0.18 | 0.76 | 1.05 | 2.3 | 3.60 |
| කොටසකට ශුද්ධ වත්කම් (රු.) | 51 | 51 | 46 | 54 | 54 | 72 | 74 | 76.4 | 83.7 | 94 |
| ජංගම අනුපාතය (වාර ගණන) | 1.10 | 1.07 | 1.04 | 2.09 | 1.29 | 1.08 | 1.08 | 1.06 | 1.06 | 1.09 |

# පොල් සඳහා

YPM (W) / (D),  APM (W) / (D),
Toddy tapping (W) / (D)





# සභාපතිතුමාගේ පණිවිඩය

ආයතනික දිගුකාලීන තිරසරභාවය සඳහා සුවිශේෂී කාර්යසාධනය සහ අනාගත ඉලක්කයන් තේරුම් ගැනීම පිළිබඳ අප විශ්වාස කරන්නෙමු.

අප පොහොර සමාගමේ කාර්යභාරය වනුයේ රාජ්‍ය ප්‍රතිපත්තියට අනුකූලව ශ්‍රී ලාංකික කාෂිකාර්මික ප්‍රජාවගේ අවශ්‍යතා සපුරාලීමයි. අපට පැහැදිලි වන්නේ අප ආයතනය, රටේ කෘෂිකාර්මික ක්ෂේත්‍රය බලගැන්වීම සඳහා වූ පුළුල් රාජ්‍ය නිර්දේශයන්ට හා වැඩසටහන් හා තදින් අනුබද්ධ වූ අපගේ ක්‍රියාකාරකම් ඔස්සේ 2016 වසර තුළ සුවිශේෂී ප්‍රගතියක් අත්පත් කරගැනීමට හැකි වූ බවයි. මෙකී කරුණ මූලිකකොට, අප සමාගමේ ස්ථාවරය පිළිබද පැහැදිලි භාවයක් සේම, අප ආයතනයේ පුළුල් උපක්‍රමිකයන් හා අනුකූල හා සැසඳෙන ක්‍රමවේද ඔස්සේ අනාගත සංවර්ධන අරමුණු කරා අපට දායක විය හැකි ආකාරය පිළිබද පැහැදිලිතාවයක් අත්පත් කර ගැනීම ද අත්‍යවශ්‍ය වේ.

වෙනත් රටවල කෘෂිකාර්මික ක්ෂේත්‍රය මුහුණ දී ඇති අභියෝග හා ප්‍රශ්න සලකා බලන කල, ශ්‍රී ලංකාව කෘෂිකාර්මික ක්ෂේත්‍රය දියණු කිරීමේදී අග්‍රගණ්‍ය ප්‍රගතියක් අත්පත් කරගෙන ඇත. එසේම රට තුළ ධනාත්මක ආර්ථික සංවර්ධනයක් අත්පත් කර ගැනීමට දායක වූ ක්ෂේත්‍ර අතර, කෘෂිකාර්මික ක්ෂේත්‍රයට ප්‍රමුඛ පෙළේ ස්ථානයක් හිමි වී ඇත.

මා විශ්වාස කරන්නේ අප ආයතනය සතු පුළුල් බෙදාහැරීමේ ජාලයක් ඔස්සේ පොහොර අඛණ්ඩව රටපුරා බෙදාහැරීමේ හැකියාව, රටේ ආර්ථික සංවර්ධනයට සේම අප සමාගමේ වර්ධනයටද සුවිශේෂී ලෙස දායක වන බවයි. අතිගරු ජනාධිපති මෛත්‍රීපාල සිරිසේන මැතිතුමා ලබා දුන් ආශීර්වාද සහ උපදෙස් වෙනුවෙන් මම එතුමාට හෘදයාංගම අවංක ස්තුතිය පුද කර සිටින්නෙමි. ඒ වගේම කෘෂිකර්ම අමාත්‍ය දුමින්ද දිසානායක මහතා ලබා දුන් මඟපෙන්වීම සහ සහයෝගය වෙනුවෙන් මා ඉතා කෘතඥ වෙමි. ආයතනයේ අරමුණු ඉටු කර ගැනීම වෙනුවෙන් අමාත්‍යංශ ලේකම්තුමාගේ සහ අමාත්‍යංශයේ ප්‍රධාන නිලධාරීන්ගෙන් ලැබුණු නොමසුරු සහයෝගය ද මා අගය කරමි.

ආයතනයේ ශුද්ධ වත්කම් ප්‍රමාණය රුපියල් මිලියන 4,728ක් දක්වා 2016 මාර්තු 31න් අවසන් වන මූල්‍ය වසර තුළ ඉහළ ගිය අතර ආයතනික ඉතිහාසය තුළ වාර්තා වූ වැඩිම බදු පෙර ලාබ වැඩි වීම වන රුපියල් මිලියන 316ක්, එනම් බදු පෙර ලාබය රුපියල් මිලියන 520 සිට රුපියල් මිලියන 836 දක්වා මෙම වසර තුළ වැඩි විය.

වර්තමානයේ, ආයතනය රුපියල් බිලියන 36.6ක වත්කම් සමුදායකින් සමන්විත වූ ශක්තිමත් ශේෂ පත්‍රයකට හිමිකම් කියන අතර මා සතුටින් දැනුම් දෙන්නේ අපගේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතනයේ එකම කොටස්කරු වන භාණ්ඩාගාරය වෙත රුපියල් මිලියන 30ක ලාභාංශ ගෙවීමට තීරණය කර ඇති බව.

2016 මූල්‍ය වර්ෂය තුළ ගෙවන ලද සමස්ත බදු ප්‍රමාණය රුපියල් මිලියන 233ක් වේ. අප සමාගම රජයේ ඒකාබද්ධ අරමුදලින් කිසිදු මූල්‍ය සහයෝගයක් නොමැතිව ලාභ ලබන ආයතනයක් ලෙස මෙහෙයුම් කටයුතු කිරීමට සමත් වී ඇත.

අප විසින් බෙදාහැරීම් කටයුතු සඳහා බලය ලත් බෙදාහරින්නන් 1500කගෙන් සමන්විත ජාලයක් ස්ථාපිත කර ඇති අතර මීට අමතරව අපගේ ප්‍රාදේශීය පොහොර ගබඩා 50ක් ඔස්සේ නිෂ්පාදන බෙදාහැරීම තුළින් ගනුදෙනුකරුවන් හා සෘජුව කටයුතු කිරීමේ හැකියාව ඇති කරගෙන ඇත. වෙළෙඳපොළ කොටස වැඩි කරගැනීම සඳහා ක්‍රියාවේ යෙද වූ කාර්යක්ෂම උපක්‍රමික ක්‍රියාවලිය හේතුකොට ගෙන අපගේ අලෙවි ධාරිතාවය වර්ධනය විය. තරඟකාරී වෙළෙඳපොළ තුළ අපගේ අලෙවි ඉලක්කයන් සපුරාලීමේ ප්‍රතිඵලයක් ලෙස සමාගමේ ආදායම හා ලාභය රුපියල් මිලියන 217කින් ඉහළ ගියේය.

කෙටි කාලීන හා දිගු කාලීන උපක්‍රමික අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ශ්‍රම බළකාය වඩා ඵලදායී ලෙස කළමනාකරණය කරන ලදි. කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සේවකයින් බඳවා ගැනීමේ හා උසස් කිරීමේ ක්‍රමවේදයන් අප විසින් අනුගමනය කරන අතර, මේ ඔස්සේ සියලු සේවකයන් හට සිය කුසලතාවන් සහ සුදුසුකම් මත උසස් වීම් ලබාගැනීමේ අවස්ථා ඇති කරන ලදි.

තොරතුරු තාක්ෂණය වඩාත් සුමට ලෙස භාවිත කිරීම උදෙසා ආයතනය විසින් වඩාත් ඵලදායී කළමනාකරණ තොරතුරු පද්ධතියක් පවත්වාගෙන යන අතර ආයතනයේ සේවකයන් හට ආයතනය තුළ සිදුවන ක්‍රියාවලීන්ගේ කාර්යක්ෂමතාව වැඩි කිරීම සඳහා නවතම පරිගණක මෘදුකාංග භාවිතය පිළිබඳ පුහුණු වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කරන ලදි. අප ආයතනය සෑම විටම ප්‍රජාවගේ සුබසිද්ධිය සඳහා කටයුතු කරන අතර එය ආයතනයේ සමාජ වගකීමක් ලෙස සලකයි. අප ආයතනය විශ්වාස කරන්නේ අනාගත ආයතනික තිරසරභාවය සඳහා ප්‍රධාන කාර්ය සාධනයන් සහ අනාගත අභිමතාර්ථ තේරුම්ගැනීම මහෝපකාරී වන බවයි. මේ දෙසට, අප ආයතනය විසින් උපක්‍රමයන් වර්ගීකරණය කර ඒවා කෙටි කාලීන හා දිගු කාලීන ක්‍රියාකාරකම් ලෙස වෙන්කොට හඳුනාගෙන මාර්ග සිතියමක් සකසමින් සිටී.

ආයතනය නව යුගයක් වෙත පිය නැංවීම සඳහා ශක්තිමත් හා පිරිපුන් නායකත්වයක් සැපයීම වෙනුවෙන්, අපගේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ මණ්ඩලයට මම මාගේ විශේෂ ස්තුතිය මේ අවස්ථාවේ පුද කර සිටින්නෙමි. එසේම අප ආයතනයේ කළමනාකාරිත්වය සහ සේවක මඩුල්ල විසින් ආයතනයේ විධායක මණ්ඩලයේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරිත්වය ගන්නා තීරණ ආයතනයේ අරමුණු හා ඉලක්ක කෙරෙහි දැඩි කැප වීමෙන් යුතුව ක්‍රියාත්මක කරලීම වෙනුවෙන් මම මාගේ ස්තුතිය ඔවුන් සැමට පුද කර සිටින්නෙමි.

**රෝෂන වඩුගේ**
සභාපති



# සාමාන්‍යාධිකාරීතුමාගේ ප්‍රකාශය

ලක්පොහොර සමාගම ශ්‍රී ලංකාවේ
ගොවිජන ප්‍රජාව වෙනුවෙන් වසර
50කට වඩා සේවය සැපයූ රජය සතු
කීර්තිමත් ආයතනයක් ලෙස
පිළිගැනීමට ලක්ව ඇත.

තවත් සාර්ථක මූල්‍ය වර්ෂයක් අවසාන වූ අවස්ථාවේ, විගණනයට ලක්කරන ලද වාර්ෂික මූල්‍ය ප්‍රකාශන හා වාර්ෂික වාර්තා ඔබ වෙත ගෙන එන්නේ හා අපගේ වටිනා කොටස්කරුවන් වන ඔබ සියලු දෙනා ආමන්ත්‍රණය කරන්නේ හද පිරි සතුටිනි. ඔබ සියලු දෙනා දන්නා පරිදි ලක් පොහොර සමාගම ශ්‍රී ලංකාවේ ගොවි ප්‍රජාව වෙනුවෙන් වසර 50කට වැඩි කාලයක් සේවය සැපයූ රජය සතු කීර්තිමත් ආයතනයක් ලෙස පිළිගැනීමට ලක්ව ඇත.

අප පොහොර ආනයනය කර, මිශ්‍ර කර සාර්ථකව ලංකාවේ භෝග වෙනුවෙන් කදිමට ගැළපෙන, ලාංකික තත්ත්වයන් යටතේ වැඩි ප්‍රතිඵල ගෙන දෙන පොහොර නිෂ්පාදන බෙදාහැරීමට සමත් වී ඇත. මා සතුටින් ප්‍රකාශ කර සිටින්නේ නවීන තාක්ෂණය සඳහා අපගේ ඇති නිරන්තර අභිරුචිය අපගේ නිර්මාණශීලී ක්‍රමවේදයන් සහ ගුණාත්මකභාවය පාලනය කිරීමේ ක්‍රමවේදයන් නිසා අපගේ නිෂ්පාදන පාරිභෝගික මනස තුළ ඉහළින්ම ස්ථාපිත වී ඇති බවයි.

රටේ පවතින ව්‍යාපාර වටපිටාව තුළ අප ආයතනය විසින් අපගේ ව්‍යාපාර අරමුණු උපරිම ඵලදායී ලෙස සාක්ෂාත් කරගැනීම සඳහා ක්‍රමවේදයන් සමුදායක් භාවිතා කරන ලදි. මේ අතරට, අපගේ පොහොර ගබඩා ජාලයේ ධාරිතාව වැඩි කිරීම හා ඒවායේ ඵලදායිතාව හා ලාභ ලැබීමේ හැකියාව වැඩි දියුණු කිරීම යනාදිය ඇතුළත් විය. මෙතුළින් ප්‍රාදේශීය ගබඩාවලින් ඉහළ ලාභ අත්පත් කර ගැනීමට සමත් විය.

මෙම වසර තුළ අපගේ මෙහෙයුම් නව්‍යකරණයට ලක් කිරීමේ අපගේ උත්සාහය මත, අප විසින් විශේෂඥ හැකියාවන් වර්ධනය කිරීමට මෙන්ම එය මධ්‍යගත කිරීම තුළින් ආයතනයේ ව්‍යසායකත්ව විභවය සහ ආයතනයේ ධාරිතාව වැඩිදියුණු කිරීම වෙනුවෙන් සුවිශේෂී වැඩකොටසක් සිදු කරන ලදි.

තවදුරටත් අපගේ ප්‍රාදේශීය ගබඩා හි බාහිර හා අභ්‍යන්තර සැකැස්ම හා අවට පරිසරයන් වෙනස් කිරීම තුළින් ගනුදෙනුකරුගේ අත්දැකීම වැඩි දියුණු කිරීමට ද අපගේ සන්නම් නාමය ගොඩනැඟීම කෙරෙහිද අප අවධානය යොමු කරන ලදි. අප විසින් නුදුරු අනාගතයේදී කෘෂිකාර්මික ක්‍රියාකාරකම්වල සීඝ්‍ර වර්ධනයක් බලාපොරොත්තු වෙතැයි අපේක්ෂා කරන ප්‍රදේශවල අපගේ වෙළෙඳ නාමය ස්ථාපිත කිරීම ඉතා වැදගත් වේ.

අපගේ සේවක මඬුල්ල අප විසින් තිරසර සංවර්ධනය කරා ළඟා වීමට දරන උත්සාහයේ නියමු බළකාය පමණක් නොව ඉතා තරඟකාරී සහ ඉක්මනින් වෙනස්වන ස්වභාවයෙන් යුතු පොහොර වෙළෙඳපොළ තුළ අපි ඉහළ තරඟකාරී සමාගමක් ලෙස අප රඳවා තබන ප්‍රධාන සාධකය වේ. එකිනෙකා සාමූහිකව ආයතනයට අගය එකතු කිරීම සඳහා හා අපගේ ආයතනික දැනුම පද්ධතිය සීමා මායිමකින් තොරව වර්ධනය කිරීමට, අප විසින් ආයතනය තුළ ඉගෙනීමේ, බෙදාහදාගැනීමේ, හා උපදේශනයේ සංස්කෘතියක් ගොඩනැඟීමට හැකි විය. මෙම චින්තනය තවදුරටත් ඉදිරියට ගෙන යමින්, අපගේ සේවකයන් සිය පෞද්ගලික වෘත්තීය අරමුණු සාක්ෂාත් කරගත හැකි පරිදි ඔවුන්ව සක්‍රීය කිරීමට අප නිරන්තරව වෑයම් කරන්නෙමු.

මේ අතර, අපගේ සේවක කාර්ය සාධනය ඉහළ නැංවීමේ ප්‍රයත්නයේ ප්‍රතිඵල පුළුල් කිරීමට සහ නායකත්ව කුසලතාවයන් ආයතනයේ සෑම මට්ටමකම සේවකයන් අතර වර්ධනය කිරීමට අප පුහුණුව හා සංවර්ධනය සඳහා වෙන් කළ අරමුදල් යොදා ගැනීමට පියවර ගත්තේය. අපට එකහෙළා ප්‍රකාශ කළ හැක්කේ මෙම උත්සාහයන් නිර්මාණශීලී අදහස් ජනිත කිරීමට සහ කළමනාකරණයේ ඵලදායිතාවය වැඩිදියුණු කිරීමට, ලාභදායිතාව වැඩිදියුණු කිරීමට සහ ආයතනයේ සමස්ත ව්‍යාපාර මෙහෙයුම් නවීකරණය කිරීමට අවශ්‍ය පසුබිම සකස් කළ බවයි. එම නිසා මම විශ්වාසයෙන් යුතුව ප්‍රකාශ කරන්නේ අපි කෘෂි ක්ෂේත්‍රයේ ඉදිරියෙන්ම සිටින්නේ ආයතනික දැක්ම වටා එකමුතු වී කටයුතු කිරීමට අප කණ්ඩායමේ ඇති නොනිම් කැපවීම මතය.

ISO – 9001 - 2008 සහතිකය ඉහළ ගුණාත්මක සේවාව සහ පරිපාලනය වෙනුවෙන් 2011දී අත්පත් කරගත් අතර, ISO/IEC 17035 - 2005 සහතිකය අපේ පොහොර පරීක්ෂණ විද්‍යාගාර සඳහා ලබාගත් අතරම, අපි 2015 වසරේ දී ISO 14001 - 2004 පාරිසරික අනුකූලතා සහතිකය අත්පත් කර ගැනීම තුළින් විජයග්‍රහණයක් ලබා ගත්තෙමු.
2016/2017 වසර තුළ රජයේ සංවර්ධන සැලසුම්වලට අනුකූලව අප සමාගමේ සංවර්ධන සැලසුම් තවදුරටත් ඉදිරියටත් ගෙන යෑමට බලාපොරොත්තු වේ. මෙහි දී අපගේ අභිලාසය වන්නේ සංවර්ධනය වන වෙළෙඳපොළවල් තුළ අපගේ ව්‍යාපාර කටයුතු පුළුල් කිරීමයි. අපි විශ්වාස කරන්නේ අප පරිසරය තුළ ඇති අනේක විධ අභියෝගයන් හඳුනාගැනීමට හා ඒවා ජය ගැනීමට අවශ්‍ය ධාරිතාව හා හැකියාව අප සතු බවයි. අපගේ සංවර්ධන උපක්‍රමය තුළ ඇති ප්‍රධාන සාධකයක් වන්නේ ERP පද්ධතියක් හඳුන්වා දී අපගේ තොරතුරු තාක්ෂණ සම්පත් නව්‍යකරණයට හා යාවත්කාලීන කිරීමට කටයුතු කිරීම තුළින් ඵලදායිතාව වැඩිදියුණු කිරීම හා කාර්යක්ෂමතාව හා ලාභදායිතාව ඉහළ නැංවීමය. 2015/2016 වසර තුළ අපගේ උපක්‍රමය වන්නේ සමාන්තර භෝග වෙළෙඳපොළ වර්ධනය කිරීම වන අතර මේ කෙරෙහි සුවිශේෂී අවධානයක් යොමු කිරීමට බලාපොරොත්තු වේ. එතුළින් අපගේ ක්‍රියාකාරකම් වෙළෙඳපොළ යථාර්ථයන් හා ගතිකත්වයන් පිළිඹිබු වන බවට තහවුරු කිරීම අපේක්ෂා කරයි. අප තුළ පාරිභෝගික අවශ්‍යතා සඳහා ප්‍රශස්ත වේගයෙන් ප්‍රතිචාර දැක්වීමට ඇති තාක්ෂණික

හැකියාව යන කාරණය හා අප ඉහළ වර්ධන වේගයක් බලාපොරොත්තු වන තත්ත්වයක් සමඟ, රාජ්‍ය ප්‍රතිපත්තිය තිරසර කෘෂිකර්මාන්තය කෙරෙහි යොමු වීමත් සමඟ අප සමාගම කාබනික යෙදවුම් නිපදවීම හා ප්‍රචලිත කිරීමේ නියමු වැඩසටහන් කෘෂිකාර්මික ක්ෂේත්‍ර කිහිපයක ක්‍රියාත්මක කරයි.

රජයේ දැක්ම වන කෘෂි රසායන සඳහා ඇති වන නැඹුරුව ගොවි ජන ප්‍රජාව තුළ අවම කිරීම හා අප ආයතනය අනුගත වීමට සහ එම දැක්ම ප්‍රචලිත කිරීමට අප අපගේ අලෙවි ප්‍රවර්ධන උත්සාහයන් උපරිමයෙන් යෙදවීමට බලාපොරොත්තු වේ. වැඩි වැඩියෙන් තරඟකාරී වන වෙළෙඳපොළට වඩා හොඳින් සූදානම් වීමට හා ප්‍රතිචාර දැක්වීම සඳහා අවශ්‍ය හැකියාවන් සමුදාය වර්ධනය කිරීමට, අප විසින් තාක්ෂණය, මෘදු කුසලතා සහ නායකත්ව පුහුණු වැඩසටහන් සඳහා ආයෝජනය කිරීමට බලාපොරොත්තු වේ.

නැඟී එන වෙළෙඳපොළවල්හි සංවර්ධන වේගය අවම වූ නිසා ගිය වසරේ ව්‍යාපාරික අරමුණු මෙම වසරේදී ද වෙනස් නොකර එලෙසම පවත්වාගෙන යයි. අපගේ ආයතනික උපක්‍රමිකයන් ඔස්සේ ලාභ ආන්තික ඉහළ නැංවීම 2015/16 වසර සඳහා ඇති අපගේ අභිමතාර්ථයකි. මේ නිසා අප දකින්නේ 2016/17 වසර අභියෝගාත්මක වසරක් ලෙසය.

කෙසේ වුවද අප තුළ ඇති තවත් අනාගත අභිමතාර්ථයක් වනුයේ අපගේ කොටස්කරුවන් වෙනුවෙන් ආදායම් ඉපදවීමයි. ආදායම් ඉපදවීම සඳහා වූ ජාතික ප්‍රතිපත්තියට අනුකූල වූ ආයතනික උපක්‍රමයක් ඔස්සේ, අපි ශ්‍රී ලංකාවේ ආර්ථික හා සංවර්ධන අරමුණ වෙනුවෙන් කැප වී ඒවා අත්පත් කර ගැනීම වෙනුවෙන් දායකත්වය සැපයීම සිදු කරන්නෙමු.

අපගේ පළපුරුදු සහ කාර්යක්ෂම සේවක කණ්ඩායම සමඟ අපි සැමවිට නව සංවර්ධන අවස්ථාවන් තහවුරු කිරීමට කටයුතු කරන්නෙමු. නව ව්‍යාපාරික වසර තුළ, පුළුල් දැක්මක් සහිතව සංවර්ධනයේ නව යුගයක් සනිටුහන් කිරීමට, පෙර වසරේ සිදු කළා මෙන් සභාපතිතුමාට සහ අධ්‍යක්ෂ මණ්ඩලයට අවශ්‍ය නායකත්වය, දැක්ම හා උපක්‍රමික දිශාව පෙන්වීමට මම කැප වන්නෙමි.

අපහසුතා හා බාධක මැද්දේ 2015/16 වසර තවත් එක් සුවිශේෂී ජයග්‍රහණවලින් පිරුණු වසරක් බවට පත් කිරීමට අඛණ්ඩව මඟපෙන්වීම හා සහාය ලබාදුන් සභාපතිතුමාට හා අධ්‍යක්ෂ මණ්ඩලයට මම මාගේ හෘදයාංගම කෘතඥතාව පුදකර සිටින්නෙමි. අප සමාගමේ දැක්ම ළඟා කරලීම සඳහා අඛණ්ඩව කැප වී ක්‍රියාකර ලක් පොහොර පවුලේ සියලු සාමාජිකයින් හා කළමනාකරණ කණ්ඩායමට මම මාගේ ස්තුතිය පුද කර සිටිමි.

අප කෙරෙහි විශ්වාසය තබා ඇති පාරිභෝගිකයින් අපගේ සාර්ථකත්වයට පදනම් වන අතර අප වඩ වඩාත් ඉදිරි වර්ෂ වලදී ඔවුන්ගේ අවශ්‍යතා ඉටු කිරීමට කැප වන බව මම සහතික කරන්නෙමි. අවසානයේදී නමුත් කිසිම අඩුවකින් තොරව අපට සහාය දක්වා සෑම විටම අප සමග රැඳීසිටි අපගේ කොටස්කරුවටද, මාගේ ප්‍රශංසාව සහ කෘතඥතාව හිමිවිය යුතුය.

අපි අධිෂ්ඨානයකින් හා කැපවීමකින් යුතුව එළඹෙන නව වසර පිළි ගන්නෙමු.

**ප්‍රියන්ත සමරවීර**
සාමාන්‍යාධිකාරී

# රබර් වගාව සඳහා

R A – 465, R U – 462, R U - 465, R/Y B, R /S A වැනි විශේෂ මිශ්‍රිත පොහොර



# අධ්‍යක්ෂ මණ්ඩලය

**ජේ.එම්.එස්.ඩී. රත්නායක මහත්මිය**
අධ්‍යක්ෂ

**උපුල් පීරිසි මහතා**
අධ්‍යක්ෂ

**හේමක ලසිත් බාලසූරිය මහතා**
අධ්‍යක්ෂ

**රෝෂන වඩුගේ මහතා**
සභාපති

**අනෝජා හේරත් මහත්මිය**
අධ්‍යක්ෂ

**මාධව වත්තේගම මහතා**
ක්‍රියාකාරී අධ්‍යක්ෂ





# අධ්‍යක්ෂ මණ්ඩලය



**රෝෂන වඩුගේ මහතා**
සභාපති

කොළඹ මහානාම විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙක් වන ඔහු ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ඩිප්ලොමාවක් ඕස්ට්‍රේලියාවේදී සම්පූර්ණ කළ අතර, ජපානයේදී මෝටර් කාර්මික ශිල්පය පිළිබඳ වෘත්තීය පුහුණු පාඨමාලාවක් හැදෑරුවේ ය.

ඔහු වයස අවුරුදු 15න් හා 17න් පහළ පාසල් ක්‍රිකට් කණ්ඩායමේ නායකයා විය. ඔහු සිංහ සමාජයේ සභාපති තනතුර මෙන්ම පාසල් ගුවන්විදුලි සංගමයේ උප සභාපති තනතුර දරා ඇත.

ඔහු කෝට්ටේ සිංහ සමාජයේ සභාපති ලෙස වසර 3ක් එම සමාජයේ සාමාජික අධ්‍යක්ෂ ලෙස වසර තුනක් සහ දිස්ත්‍රික් 306C ජාත්‍යන්තර සිංහ සමාජයේ අධ්‍යක්ෂක ලෙස ද කටයුතු කරයි.

සමාජ සුබසාධනය උදෙසා ඔහු ''ආර්ය ලංකා පදනම'' නම් වූ රාජ්‍ය නොවන සංවිධානය ස්ථාපිත කළ අතර, එහි සභාපති ලෙස ද කටයුතු කරයි. ලංකා ඒකාබද්ධ ප්‍රවාහකයන්ගේ සංගමයේ සභාපති තනතුර හා වාහන ආනයනය කරන්නන්ගේ සංගමයේ උප සභාපති තනතුරු ද ඔහු දරයි.

2006 වසරේ දී ඔහුට ශ්‍රී ලංකා එක්සත් ජාතීන්ගේ මිත්‍රත්ව සංවිධානය විසින් 'ජිවන සුරි' සම්මානය පුදන ලදී.



**චන්දන පැල්පිට මහතා**
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

කොළඹ අශෝක විද්‍යාලයේ හා කොළඹ ආනන්ද විද්‍යාලයෙන් ඔහු ප්‍රාථමික අධ්‍යාපනය ලැබුවේය. ඔහු කාර්මික සබඳතා හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඉන්දියාවේ, දිල්ලි විශ්වවිද්‍යාලයෙන් ශාස්ත්‍රපති උපාධිය ලැබුවේ ය.

ඔහු ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ඉන්දියාවේ ශ්‍රම අධ්‍යයනය හා කළමනාකරණය සඳහා වූ ජාතික ආයතනයෙන් ලබා ගත්තේ ය. ඔහු වසර 15ක් තිස්සේ ඉන්දියාවේ හා ශ්‍රී ලංකාවේ විවිධ ජ්‍යෙෂ්ඨ කළමනාකරණ තනතුරු දරමින් කළමනාකරණය පිළිබඳ අත්දැකීම්වලින් සන්නද්ධ වී ඇත.



**මාධව වත්තේගම මහතා**
ක්‍රියාකාරී අධ්‍යක්ෂ

සිය ද්විතීයික අධ්‍යාපනය කොළඹ නාලන්දා විද්‍යාලයෙන් ලබා ගත් ඔහු ව්‍යාපාර කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධිය නිව් කාසල් විශ්වවිද්‍යාලයෙන් ලබා ගත්තේය. ඔහු ලන්ඩනයේ ව්‍යාපාර විධායකයන්ගේ සංගමය විසින් පවත්වන මට්ටම් I හා II යන විභාග සමත් වී ඇත. ඔහු ඩිප්ලෝමා පාඨමාලාවන් කිහිපයක් සම්පූර්ණ කර ඇති අතර ඒවා අතරට බටහිර ඕස්ට්‍රේලියාවේදී ලබා ගත් ඔටෝකැඩ් පිළිබඳ ඩිප්ලෝමාවද, ඔටෝකැඩ් වින්ඩෝස් පිළිබඳ ඕමානයේ සුල්තාන් රාජ්‍යයේ අරාබි පරිගණක ආයතනයෙන් ලබා ගත් ඩිප්ලෝමාවද ඇතුළත් වේ.

ඔහු වර්තමානයේදී සිල්වර් බර්ඩ් ඉන්ටර්නැෂනල් ආයතනයේ, ඉන්ඩිපෙන්ඩන්ස් ආකිටෙක්චරල් හෝම්ස් සහ ග්ලෝබල් ශිපිං යන ආයතන වල සභාපති/ විධායක අධ්‍යක්ෂ ලෙස කටයුතු කරයි. ඒ වගේම ඔහු මධ්‍යම සංස්කෘතික අරමුදලේ ක්‍රියාකාරී අධ්‍යක්ෂවරයෙකු ලෙස කටයුතු කර ඇත.



**හේමක ලසිත් බාලසූරිය මහතා**
අධ්‍යක්ෂ

ඔහු ව්‍යාපාර පරිපාලනය පිළිබඳ පශ්චාත් උපාධිය වේල්ස් විශ්වවිද්‍යාලයෙන් ද, අලෙවිකරණය පිළිබඳ පශ්චාත් උපාධි ඩිප්ලෝමාවත්, වරලත් අලෙවිකරුවන්ගේ සංගමයෙන් ලබා ගත්තේය.

ඔහු ශ්‍රී ලංකා ජාතික කළමනාකරණ ආයතනයේ සික්ස් සිග්මා (six sigma) සංකල්පය යටතේ කළුපටි ධාරියෙක් වේ. ඔහු වසර දහසයක් පුරා විවිධ ක්ෂේත්‍ර නියෝජනය කරමින් පුළුල් වෘත්තීය නිපුණතාවක් ගොඩනඟාගෙන ඇත. ඔහු නියෝජනය කළ ක්ෂේත්‍ර අතරට දුරකතන සන්නිවේදන ක්ෂේත්‍රය තුළ ඉදිරි පෙළ මෙහෙයුම්, ව්‍යාපාර ක්‍රියාවලීන්, අලෙවි කළමනාකරණය, කණ්ඩායම් කළමනාකරණය, ගනුදෙනුකරුවන් රඳවා ගැනීම, ව්‍යාපාර සැලසුම් සහ පරිපාලනය, දැනුම් කළමනාකරණය සහ ගනුදෙනුකාර අත්දැකීම් කළමනාකරණය යන ඒවා ඇතුළත්ය.

# අධ්‍යක්ෂ මණ්ඩලය



**උපුල් පීරිස් මහතා**
අධ්‍යක්ෂ



**ශිරන්ති ධම්මිකා රත්නායක මහත්මිය**
අධ්‍යක්ෂ

ගල්කිස්ස ශාන්ත තෝමස් විද්‍යාලයේ ආදි ශිෂ්‍යයෙක් වන මෙතුමා වැවිලි සංස්ථාවේ හා ඉඩම් ප්‍රතිසංස්කරණ හා සංවර්ධන මණ්ඩලයේ අධ්‍යක්ෂවරයෙක් ලෙස කටයුතු කරයි.

ඔහු ඌව පළාතේ හිටපු මහ ඇමැතිගේ සම්බන්ධීකරණ ලේකම් ලෙස ද කටයුතු කළ අතර ලක් පොහොර සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ සාමාජිකයෙකු ලෙස 2015 පෙබරවාරි 4 දින සිට කටයුතු කරයි.

ඇය කැලණිය විශ්වවිද්‍යාලයෙන් සිය විද්‍යාවේදී උපාධිය ලබා ගත් අතර ඇය එතැනින් නොනැවතී අනෙකුත් අංශවලින් උසස් අධ්‍යාපනය ලබමින් කොළඹ විශ්වවිද්‍යාලයෙන් ආර්ථික සංවර්ධනය පිළිබඳව ද, ජපානයේ අයිඩියාස් පාසලෙන් සංවර්ධන අධ්‍යයනය පිළිබඳව හා මෙල්බර්න් විශ්වවිද්‍යාලයෙන් රාජ්‍ය ප්‍රතිපත්ති හා කළමනාකරණය පිළිබඳව පශ්චාත් උපාධීන් අත්පත් කරගෙන ඇත.

ශ්‍රී ලංකා ආර්ථික විද්‍යා සංගමයේ සාමාජිකත්වය සහ ශ්‍රී ලංකා ප්‍රතිපත්ති සැලසුම් කිරීමේ සංගමයේ සාමාජිකත්වය දරයි. ඇය 1993 හා 1994 වසරවල ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනයේ ප්‍රමිති නිලධාරිනයක් ලෙස කටයුතු කළාය. 1994 - 2004 කාලය තුළ ඇය මූල්‍ය හා ජාතික ක්‍රියාත්මක කිරීමේ දෙපාර්තමේන්තුවේ සහාය අධ්‍යක්ෂවරයෙක් ලෙස කටයුතු කළාය. එසේම ඇය සහාය අධ්‍යක්ෂවරයෙක් ලෙස මූල්‍ය සංවර්ධන දෙපාර්තමේන්තුවේ කටයුතු කළාය. ඇය ග්‍රාමීය මූල්‍ය ක්ෂේත්‍ර සංවර්ධනය කිරීමේ වැඩසටහනේ ව්‍යාපෘති අධ්‍යක්ෂක ලෙස ද කටයුතු කළාය. තවදුරටත් ඇය 2011 සිට 2013 කාලය තුළ අයවැය සැකසීමේ අධ්‍යක්ෂ ලෙසද කටයුතු කළාය. වර්තමානයේ ඇය ජාතික ක්‍රියාත්මක කිරීමේ අමාත්‍යංශයේ අධ්‍යක්ෂ ජනරාල් (ආර්ථික) ලෙස කටයුතු කරයි.

ඇය විවිධ ජාතික හා ජාත්‍යන්තර විශ්වවිද්‍යාලවල පර්යේෂණ සඳහා දායක වි ඇත. මේ අතරම ඕස්ට්‍රේලියාවේ මෙල්බර්න් විශ්වවිද්‍යාලයේ, ජපානයේ අයිඩියාස් පාසල හා කොළඹ විශ්වවිද්‍යාලය ද ඇතුළත්ය.



**අනෝජා හේරත් මහත්මිය**
අධ්‍යක්ෂ

කොළඹ දේවි බාලිකා විද්‍යාලයේ ආදි ශිෂ්‍යාවක් වන ඇය කෘෂිකර්මය පිළිබඳ විද්‍යාවේදි විශේෂ උපාධිය, පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ලබා ගත්තාය. සමාජ විද්‍යාව පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය කැලණිය විශ්වවිද්‍යාලයෙන් ද ලබා ගත්තාය. ඇයගේ වෘත්තීය ජිවිතය ආරම්භ කරනුයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ කථිකාචාර්යවරියකු ලෙසිනි. පසුව ඇය පර්යේෂණ සහායිකාවක් ලෙස පාරිසරික කටයුතු හා ස්වභාවික සම්පත් අමාත්‍යංශය හා එක්විය. 2003 සැප්තැම්බර්හි දී ඇය ශ්‍රී ලංකා පරිපාලන සේවයට බැඳුණේ අභ්‍යාසලාභී නිලධාරිනියක් විලසය.

ඇය ඉඩම් හිමිකම් නිරවුල් කිරීමේ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂවරියක ලෙසද පරිසර හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යංශයේ සහාය අධ්‍යක්ෂිකාවක් ලෙස හා තාක්ෂණ හා පර්යේෂණ අමාත්‍යංශයේ අධ්‍යක්ෂවරියක ලෙසද කටයුතු කර ඇත. වර්තමානයේ ඇය කෘෂිකර්ම අමාත්‍යංශයේ අධ්‍යක්ෂවරියක් ලෙස කටයුතු කරයි. දේශගුණ විපර්යාස පිළිබඳ අනුගතවීමේ හා අවම කිරීමේ තාක්ෂණික අවශ්‍යතා හඳුනාගැනීමේ ව්‍යාපෘතියේ, ව්‍යාපෘති සම්බන්ධීකාරක ලෙස ද ඇය කටයුතු කළාය. ඇය ශ්‍රී ලංකාව නියෝජනය කරමින් පරිසර සහ සංවර්ධන පිළිබඳ විවිධ ජාත්‍යන්තර සම්මන්ත්‍රණ සඳහා විශේෂඥයෙකු ලෙස සහභාගි වී ඇත. විශේෂයෙන් ම දේශගුණ විපර්යාස පිළිබඳ වූ එක්සත් ජාතීන්ගේ එකඟතා රාමුවේ සැසි සඳහා ඇය ශ්‍රී ලංකාව නියෝජනය කරමින් සහභාගි වෙමින් සිය සක්‍රීය දායකත්වය සැපයුවාය.

එසේම ඇය ලංකාවේ කාබනික තේ පිළිබඳ පර්යේෂණ සිදුකොට ඒවා එළිදක්වා ඇත.



**එස්.පී. මොරවක මහතා**
ලේකම්

නිතීඥවරයෙකු ලෙස බුද්ධිමය දේපළ පිළිබඳ ප්‍රංශය, ජර්මනිය හා ස්විට්සර්ලන්තය වැනි රටවල අත්දැකීම් ලබා ඇති මොහු ලංකා පොහොර සමාගමේ හිටපු ලේඛකාධිකාරී තනතුර දැරුවේය. සමාගම් ලේකම් ලෙස ඔහු ලක් පොහොර සමාගමේ පසුගිය වසර 11 පුරා කටයුතු කළේය.



# කළමනාකරණ කණ්ඩායම

**ආර්.ඒ.පී. පෙරේරා මහතා**
කළමණාකරු

**ඉංජි.ඩී.එම්.එන්.ඒ. දිසානායක**
කළමණාකරු

**බී.ඩී.එල් කුමාරසිරි මහතා**
ප්‍රධාන අභ්‍යන්තර විගණක



| | | | |
|---|---|---|---|
| **පී.ආර්. සමරවීර මහතා** | **සී.පී.පී. බුලත්සිංහල මහතා** | **පී.පී. සමන් මහතා** | **ආර්.පී.එස්. බෝධිපාල මහත්මිය** |
| සාමාන්‍යාධිකාරී | වැඩබලන කළමනාකරු | වැඩබලන කළමනාකරු | කළමනාකරු |

# කළමනාකරණ කණ්ඩායම







### පී.ආර්. සමරවීර මහතා

සාමාන්‍යාධිකාරී(වැඩබලන) සහ කළමනාකරු (මූල්‍ය), ඔහු වාණිජවේදී විශේෂ උපාධිය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් ලබාගෙන ඇත.
ඔහු රාජ්‍ය මූල්‍ය හා සංවර්ධනය සඳහා වූ ගණකාධිකාරීවරුන්ගේ ආයතනයේ, වරලත් ව්‍යාපාර පරිපාලකයන්ගේ ආයතනයේ, ශ්‍රී ලංකා රාජ්‍ය මූල්‍ය ගණකාධිකාරීවරුන්ගේ සංගමය යන ආයතනවල ඉහළ තනතුරු දරන අතර ශ්‍රී ලංකා වෘත්තීය ගණකාධිවරුන්ගේ ආයතනයේ යොමු සාමාජිකත්වය ද හොබවයි. ඔහු 1987 ලක් පොහොර සමාගම හා එක් වී දිගු ගමනක් පැමිණ ඇති අතර වර්තමානයේ ආයතනය සතු ජ්‍යෙෂ්ඨතම කළමනාකරු වේ.

### බී.ඩී.එල් කුමාරසිරි මහතා

ප්‍රධාන අභ්‍යන්තර විගණක, මොහු ආයතනයේ ප්‍රධාන අභ්‍යන්තර විගණක වේ. මොහු කැලණිය විශ්වවිද්‍යාලයෙන් වාණිජ්‍යය පිළිබඳ විශේෂ උපාධියක් ලබා ඇත. මොහු රාජ්‍ය මූල්‍ය ගණකාධිවරුන්ගේ සංගමයේ හා රාජ්‍ය මූල්‍ය හා සංවර්ධන ගණකාධිකාරිවරුන්ගේ ආයතනයේ සාමාජිකත්වය දරයි. ඔහු අභ්‍යන්තර විගණනය පිළිබඳ සහතිකය, රාජ්‍යය ගිණුම් හා මූල්‍ය ආයතනයෙන් හා අභ්‍යන්තර විගණකයින්ගේ ආයතනයෙන් ලබා ඇත. ඔහු ප්‍රධාන ගණකාධිකාරී හා ප්‍රධාන අභ්‍යන්තර විගණක ලෙස ජාතික උපකරණ හා යන්ත්‍රෝපකරණ ආයතනයේ සේවය කර ඇත.

### ඉංජි. ඩී.එම්.එන්.ඒ දිසානායක

කළමණාකරු (තාක්ෂණික), ඔහු විද්‍යාවේදී ඉංජිනේරු උපාධියක් පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ද, ව්‍යාපාර පරිපාලනය (මූල්‍ය) පිළිබඳ ශාස්ත්‍රපති උපාධියක් කැලණිය විශ්වවිද්‍යාලයෙන් ලබා ඇත. ශ්‍රී ලංකා ඉංජිනේරුවන්ගේ සංගමයේ සාමාජිකත්වය දරන මොහු එම ආයතනයේ ඉංජිනේරු අංශයේ කමිටු සාමාජිකයෙකු වේ.



## ආර්.ඒ.පී. පෙරේරා මහතා

කළමනාකරු (බෙදාහැරීම්), ඔහු සමාජ විද්‍යාව පිළිබඳ කොළඹ විශ්වවිද්‍යාලයෙන් විශේෂ උපාධියක් ලබාගෙන ඇත. මීට අමතරව ඔහු කළමනාකරණය හා තොරතුරු තාක්ෂණය පිළිබඳ ඩිප්ලෝමාවක් දරයි. තවදුරටත් ඔහු ඵලදායිතාව පිළිබඳ ඩිප්ලෝමාවක් ජාතික ඵලදායිතා ලේකම් කාර්යාලයෙන් ලබාගෙන ඇත. එසේම ඔහු මානව සම්පත් කළමනාකරණ කාර්මික, සෞඛ්‍ය හා සුරක්ෂිතභාවය, ගිනි ආරක්ෂණය, යන්ත්‍රෝපකරණ හා උපකරණ නඩත්තු කිරීම පිළිබඳ ප්‍රවීණයෙක් වේ.



## ආර්.පී.එස් බෝධිපාල මහත්මිය

කළමනාකරු (අලෙවි හා විකුණුම්), ඇය කෘෂිකර්මය (වැවිලි කළමනාකරණය) පිළිබඳ විද්‍යාවේදී විශේෂ උපාධියක් සබරගමුව විශ්වවිද්‍යාලයෙන් ද, ව්‍යාපාර පරිපාලනය පිළිබඳ ශාස්ත්‍රපති උපාධිය පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ද, කෘෂිකාර්මික විද්‍යාව පිළිබඳ වූ පශ්චාත් උපාධි ආයතනයෙන් ද, ලබාගෙන ඇත. ඇය සතුව වැවිලි අංශයේ කළමනාකරණය පිළිබඳ හසළ දැනුමක් ඇත.



## සී.පී.පී. බුලත්සිංහල මහතා

වැඩබලන කළමනාකරු (පරිපාලන හා මානව සම්පත්), ඔහු ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් කලා උපාධියක් හා මානව සම්පත් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් කළමනාකරණ පුහුණු ආයතනයෙන් ලබාගෙන ඇත. ඔහු වසර 35ක් පුරාම ආයතනය තුළ රැකියාවේ නියුතුව සිටී. එසේම ඔහු මුළු දිවයිනටම සාමවිනිසුරුවරයකු වේ.



## ජී.ජී. සමන් මහතා

වැඩබලන කළමනාකරු (ක්‍රමසම්පාදන හා ආනයන), ඔහු කොළඹ විශ්වවිද්‍යාලයේ කලා උපාධිය හදාරා ඇත. වර්තමානයේ ඔහු මිලදී ගැනීම් හා ගිවිසුම් කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමාවක් ශ්‍රී ලංකාවේ සංවර්ධන පරිපාලන ආයතනයේ හදාරයි.




# කළමනාකරණ සමාලෝචනය සහ විශ්ලේෂණය

## කෘෂිකාර්මික ක්ෂේත්‍රය හා සබැඳි සාමාන්‍යය ආර්ථික තත්ත්වය

තරඟකාරී දේශීය විදේශීය පරිසරය තුළ, 2015 වසරේදී ශ්‍රී ලංකාවේ ආර්ථික වර්ධනය 2014 දී පැවැති 4.8% දක්වා අඩු වීමක් වාර්තා විය. ආර්ථික වර්ධනය සඳහා මහෝපකාරී වූයේ දේශීය ඉල්ලුමේ පැවැති වැඩි වීමයි. ආහාර ද්‍රව්‍ය හා පෙට්‍රෝලියම් නිෂ්පාදිත මිල අඩු වීම සහ වැටුප් වර්ධනය කිරීම් නිසා වැය කළ හැකි ආදායම වර්ධනය වීම මත දේශීය පරිභෝජනයේ වර්ධනයක් දිස් විය. කෘෂිකාර්මික, කාර්මික සහ සේවා යන ආර්ථිකයේ සියලු නිෂ්පාදන අංශයන් 2015 වසරේදී සමස්ත ආර්ථික වර්ධනය කෙරෙහි ධනාත්මකව දායක විය. සේවා වියුක්තිය 5% කට අඩු මට්ටමක පැවතුණි. කොළඹ පාරිභෝගික මිල දර්ශකය තුළින් ගණනය කරන සාමාන්‍යය වාර්ෂික උද්ධමනය (CCPI – 2006/7 පදනම් වර්ෂය) 2014 වසර අගදී පැවැති 3.3 % සිට ඒකක 0.9% ක අඩු වීමක් 2015 අගදී වාර්තා විය. වැඩි දියුණු වූ දේශීය සැපයුම් වාතාවරණය සහ වෙළෙඳ භාණ්ඩවල මිල අඩුවීම නිසා කොළඹ පාරිභෝගික මිල දර්ශකය පිට පිට හත් වන වරටත් තනි ඉලක්කමක අගයක් පවත්වාගෙන යාමට හැකි විය.
කෘෂිකාර්මික හා සේවා අංශ පිළිවෙලින් 5.5% ක් හා 5.3% ක් මඟින් වසර තුළදී වර්ධනය විය. මේ අතරින් දළ දේශීය නිෂ්පාදිතය වෙනුවෙන් 7.9% කින් දායක වූ කෘෂිකාර්මික අංශයේ වර්ධනයට ප්‍රධාන ලෙස දායක වූයේ සහල් නිෂ්පාදනයේ වැඩිවීම ( 23.3%) සහ එළවළු නිෂ්පාදනයේ වැඩිවීම (-10.1%) ක් හා (-2.6%) බැගින් සෘණ වර්ධනයක් වාර්තා විය.

2015 වසර වැඩිම වී නිෂ්පාදනය වන මෙට්‍රික් ටොන් 6,761,803 ක් වාර්තා විය. වසර කිහිපයක් තිස්සේ සිදු වූ සාපේක්ෂ ඉහළ වී අස්වැන්න නිසා පොහොර ලබා ගත් සමස්ත ගොවීන් සංඛ්‍යාව හා නිකුත් කරන ලද සමස්ත පොහොර ප්‍රමාණයේ අඩු වීමක් දක්නට ලැබුණු අතර වී අස්වනු නෙළන ලද ශුද්ධ භූමි ප්‍රමාණයේ වැඩි වීමක් හා වී නිෂ්පාදනයේ වැඩි වීමක් වාර්තා විය.

2015 වසර තුළ ගොවීන්ට අනෙකුත් බෝග වගාව සඳහා ලබාදෙන පොහොර සහනාධාරය යටතේ පොහොර මෙට්‍රික් ටොන් 463,672 ක් නිකුත් කරන ලදි. මෙයින් පොහොර මෙට්‍රික් ටොන් 390,549ක් භාවිතා කර ඇත. මෙම සහනාධාරය ගොවීන්ට එක් භෝගයක සිට භෝග කිහිපයක් වැවීමේ හැකියාව ලබා දී ඇති අතර, වී හැර අනෙකුත් බෝගවල ඵලදායිතාව ඉහළ නැංවීමටද මෙය ඉවහල් විය. රජය විසින් ලබාදෙන පොහොර සහනාධාරය කි.ග්‍රෑ. 50 සෘජු පොහොර මිටියක වෙළෙඳපොළ මිලෙන් ප්‍රතිශතයක් ලෙස 28% - 80%ක් අතර මට්ටමේ පැවතුණි. තේ සඳහා මෙට්‍රික්

ටොන් 189,068 (48%)ක් පොහොර ද, රබර් සඳහා මෙට්‍රික් ටොන් 100,532ක් (26%) ක්, එළවළු සඳහා මෙට්‍රික් ටොන් 64,584 (17%)ක්, පොල් සඳහා මෙට්‍රික් ටොන් 29,287ක් (7%)ක් සහ අනෙකුත් බෝග මෙට්‍රික් ටොන් 70,077 (2%) ක් ලෙස සහනදායී පොහොර නිකුත් කරන ලදි.

පොහොර සහනාධාරය වෙනුවෙන් රජය දරන ලද මුළු වියදම 2015 දී 2014ට සාපේක්ෂව 56%කින් වැඩි විය. 2014 දී එම අගය රුපියල් මිලියන 31,802ක් වූ ක් වූ අතර 2015 දී එය වාර්තා වූයේ රුපියල් මිලියන 49,570ක් සේය. එසේම 2015 වසර මේ දක්වා පොහොර සහනාධාරය සඳහා වැඩිම වියදමක් දැරූ වර්ෂය ලෙස වාර්තා වේ. මෙයට ප්‍රධාන හේතුව වනුයේ 2015 වසර තුළදී පෙර වසරවල පැවැති හිඟ ශේෂයන් පියවීමට කටයුතු කිරීමයි. පොහොර සහනාධාරය සඳහා වාර්ෂික අයවැය වෙන් කිරීම්වලින් 99%කට ආසන්න ප්‍රමාණයක් වැය විය.

## ආයතනික විශ්ලේෂණය

ගොවියාගේ අවශ්‍ය අවස්ථාවන්හි මිතුරකු ලෙස සලකන අප සමාගම පොහොර ආනයනය කර මිශ්‍ර කර හා මිශ්‍ර නොකර බෙදාහැරීම සිදු කරයි. අපගේ මූලික අරමුණ වනුයේ කෘෂි කර්මාන්තයේ වර්ධනයට දායක වන රාජ්‍ය ආයතනයක් ලෙස කටයුතු කිරීමයි.

අප රට පුරාම සෑම විටම ගුණාත්වයෙන් යුතු පොහොර බෙදාහැරීමට පූර්ණ ලෙස කැපවී සිටින අතර, අප ආනයනය කරන පොහොරවල ගුණාත්මකභාවය තහවුරු කිරීම සඳහා සියලු ආනයනික පොහොර කාර්මික තාක්ෂණ ආයතනය හරහා තත්ත්ව පරීක්ෂාවකට ලක් කරයි. එසේම සෑම පොහොර වර්ගයකම නියැදි පරීක්ෂාවක් අපගේ විද්‍යාගාරවල දී සිදු කරයි. අපගේ මෙම විද්‍යාගාර සඳහා ශ්‍රී ලංකා ප්‍රතීතන මණ්ඩලයේ අනුමැතිය සහ ISO/IEC/17025:2005 සහතිකය ලබාගෙන ඇත.

## සහනදායී පොහොර විකුණුම්

| වර්ෂය | විකුණුම් ( මෙට්‍රික් ටොන්) | |
|---|---|---|
| | වී | වෙනත් බෝග |
| 2014/2015 | 199,359.240 | 116,491.416 |
| 2015/2016 | 222,474.315 | 126,645.583 |

අප ආයතනයේ මධ්‍යම ගබඩා ඒකකය වත්තල හුණුපිටියේ පිහිටා ඇති අතර එහි ධාරිතාවය මෙ. ටොන් 67,000කි. ප්‍රධාන ප්‍රාදේශීය ගබඩා 51කින් සමන්විත වන අතර ඒවායේ සමස්ත ධාරිතාවය මෙට්‍රික් ටොන් 20,000කි.

මිශ්‍රිත පොහොර නිෂ්පාදනය එක් එක් බෝගයට ගැළපෙන පරිදි රජයේ නිර්දේශිත අනුපාතයටත් යටත්ව මධ්‍යම ගබඩා සංකීර්ණය තුළ සිදු කරයි. එස් පහ සංකල්පය අපගේ ප්‍රධාන කාර්යාලයට හඳුන්වාදීම තුළින් අපගේ සේවකයන්ගේ හා ආයතනයේ ඵලදායිතාව ඉහළ ගොස් ඇති අතර, අප සමාගම ISO 9001 : 2008 ගුණාත්මක කළමනාකරණ පද්ධති සහතිකය ද ලබා ඇත.

අපගේ කාර්යභාර්ය වී වගාවට අවශ්‍ය සෑජු පොහොර නිපදවීමට සීමා නොකොට තේ, පොල්, රබර්, එළවළු, පලතුරු හා වෙනත් බෝග සඳහා අවශ්‍යය විශේෂිත පොහොර වර්ග සැපයීම ද සිදු කරයි. එසේම අප විසින් සංස්ථා කොම්පෝස්ට් නාමය යටතේ කාබනික පොහොර නුදුරේදීම ගොවීන්ට ලබා දීමට බලාපොරොත්තු වේ.

## සහනාධාරිත පොහොර විකුණුම් - 2015/16




අපගේ නිෂ්පාදන ලංකාව පුරා විසිරුණු අලෙවි ජාලය ඔස්සේ අලෙවි කරන අතර ආර්පිකෝ, කීල්ස්, කාගිල්ස් වැනි සුපිරි වෙළෙඳසැල් ලක් පොහොර වෙළෙඳ නාමය පුළුල් ක්ෂේත්‍රයක පැතිරුණු පාරිභෝගිකයන් අතරේ ජනප්‍රිය කරවීමට කටයුතු සිදු කරයි.

අපගේ නියෝජිතයින් විසින් පොහොර නිෂ්පාදන සහ ඒවා භාවිත කරන ක්‍රම පිළිබඳව නිරන්තරයෙන් පාරිභෝගිකයන්ට අධ්‍යාපනය ලබා දීම හා දැනුවත් කිරීම සිදු කරන අතර එම උත්සාහයන්ගේ ප්‍රතිඵලයක් ලෙස අප විසින් 2015/16 වසරේ අලෙවි කරන ලද අනෙතුත් බෝග සඳහා භාවිත කරන සහනාදායී පොහොර ප්‍රමාණය වාර්ෂික පදනම මත 8%කින් එනම් 2014/15 වසරේ මෙට්‍රික් ටොන් 116,491 සිට 2015/16 දී මෙට්‍රික් ටොන් 126,645 ක් දක්වා වැඩි වී ඇත.

අප සමාගම සංස්ථා කොම්පෝස්ට් වෙළෙඳ නාමය යටතේ කාබනික පොහොර වෙළෙඳපොළට හඳුන්වා දීමටත් අවශ්‍ය සියලු කටයුතු සිදු කරමින් සිටී.

## මිශ්‍රිත පොහොර විකුණුම්

| භෝගය | විකුණුම් ( මෙට්‍රික් ටොන්) | |
|---|---|---|
| | 2014/2015 | 2015/2016 |
| තේ | 15,646.031 | 11,874.699 |
| රබර් | 1,562.215 | 2,279.61 |
| පොල් | 5,138.631 | 5,559.962 |
| එළවුළු | 1,547.215 | 2,229.486 |
| පලතුරු | 633.038 | 1,038.527 |
| මල් | 53.982 | 28.806 |
| අපනයන | 1,039.605 | 1,002.323 |
| අනෙකුත් ආහාර බෝග | 2,538.707 | 3,827.104 |
| | **28,159.424** | **27,840.517** |

අනෙකුත් බෝග සඳහා පොහොර විකුණුම්




## මූල්‍ය සමාලෝචනය

අප සමාගම රු.බිලියන 4.24 ක ආදායමක් වී, සඳහා සහ අනෙකුත් බෝග සඳහා පොහොර අලෙවි කිරීමෙන් ලබා ඇත. මෙය පෙර වසරට සාපේක්ෂව 10%ක වැඩි වීමකි.

ආදායම




මෙම වසරේ වර්ධන වේගය පෙර වසරට සාපේක්ෂව අඩු වීමක් පෙන්නුම් කරන අතර එයට හේතුව වන්නේ ගොවීන්ගේ පොහොර මිල දී ගැනීමේ රටාවේ සිදු වූ වෙනස්කම්ය. ගොවීන් වැඩි ප්‍රමාණයක් විකල්ප පොහොර සඳහා යොමු වීම ද, දැකගත හැකි විය. කෙසේ වුව ද 10% ක වර්ධනයක් අත්පත් කර ගැනීමට සහනදායී පොහොර විකුණුම් දායක විය.

### දළ ලාභය

සමාගම 2015/16 මූල්‍ය වර්ෂය තුළ රු. මිලියන 1,097 ක දළ ලාභයක් උපයා ඇත. එය පෙර වසරට සාපේක්ෂව 28.27% ක වැඩිවීමකි. වෙනත් බෝග සඳහා යොදන සහන මිල පොහොර විකුණුම් වැඩිවීම මෙම ඉහළ යාමට සුවිශාල ලෙස දායක වී ඇත.

දළ ලාභය




### පරිපාලන වියදම්

සමාගමේ පරිපාලන වියදම රු.මිලියන 539.86ක් වූ අතර එය පසුගිය වර්ෂයට සාපේක්ෂව 7. 5% ක වැඩි වීමකි.

පරිපාලන වියදම්




### බෙදාහැරීමේ වියදම්

සමාගමේ බෙදාහැරීමේ වියදම රු.මිලියන 12ක් දක්වා අඩු විය. මෙයට හේතුව වූයේ කාර්යක්ෂම හා ඵලදායී කළමනාකරණ ක්‍රමවේදයක් අනුගමනය කිරීම සහ බෙදාහැරීමේ ජාලය පුළුල් කිරීම සේම එහි කාර්යක්ෂමතාව වැඩිදියුණු කිරීමය.

බෙදාහැරීමේ වියදම්




### මූල්‍ය ආදායම් සහ වියදම්

මෙම වර්ෂය තුළ ආයතනයේ මූල්‍ය ආදායම රු.මිලියන 170 දක්වා වැඩි විය. අභ්‍යන්තර කාර්යක්ෂමතාව ප්‍රගුණ කිරීම තුළින් ආයතනයේ මූල්‍ය වියදම් ශීඝ්‍ර ලෙස රු.මිලියන 1.76ක් දක්වා අඩු විය. මෙය 53%ක අඩු වීමකි.

මූල්‍ය ආදායම් හා වියදම්



## බදු පෙර ලාභය

සමාගමේ වැඩිම බදු පෙර ලාභය වන රු.මිලියන 837ක් මෙම වසරේ වාර්තා වූ අතර එය පෙර වසරට සාපේක්ෂව 60.8% ක වැඩි වීමකි.

බදු පෙර ලාභය




## බදු

මූල්‍ය වර්ෂය සඳහා අදාළ ආදායම් බදු ප්‍රමාණය රු.මිලියන 233කි. 2014/15 වර්ෂයේ එය රු. මිලියන 134කි. විලම්බිත බදු වගකීම වන රු. මිලියන <3.2> ආදායම් බදු පිරිවැය තුළ ඇතුළත්ය. 2006 අංක 10 දරන ආදායම් බදු පනත අනුව පසුව සිදු කරන බදු සංශෝධනයන් නිසා සමාගම <1%> ආදායම් බදු ණය වගකීමකට යටත්ය.

## කොටස මත ඉපයුම්

සමාගම වැඩිම කොටස් මත ඉපයුම් වටිනාකම වන රු.12 මෙම වසරේදී වාර්තා කළේය. එය පෙර වසරට සාපේක්ෂව 56.38% ක වැඩි වීමකි.

කොටස මත ඉපයුම්




## කොටසකට ලාභාංශ

මෙම මූල්‍ය වසර තුළ කොටසකට ලාභාංශ අගය රු. 3.60ක් ලෙස වාර්තා වූ අතර එය සමාගම වාර්තා කළ වැඩිම අගය වේ.

කොටසකට ලාභාංශ




## වත්කම් මත ප්‍රතිලාභය

සමාගම 1.65% ක ප්‍රති-ලාභයක් සියලු වත්කම් මත ඉපයීමට සමත් විය. එය පෙර වසරට සාපේක්ෂව <90%>% ක වැඩිවීමකි.

හිමිකම් මත ප්‍රතිලාභ




## හිමිකම් මත ප්‍රතිලාභ

සමාගම හිමිකම් මත ප්‍රතිලාභ 13%ක් දක්වා වැඩි දියුණු කළ අතර එය පෙර වසරට සාපේක්ෂව <38%> ක වැඩි වීමකි.

කොටස් මත





## වත්කම් පදනම

2016 මූල්‍ය වර්ෂය අවසානයේ සමස්ත වත්කම්හි අගය රු.බිලියන 36.6 කි. මෙයින් 5%ක් ජංගම වත්කම් වන අතර 95% ක් ජංගම නොවන වත්කම් වේ.

සමස්ත ජංගම නොවන වත්කම් සමුදාය සමන්විත වනුයේ ආයතන දේපළ හා උපකරණ වන අතර ඒවායේ වටිනාකම රු.බිලියන 1.87ක් ලෙස මෙම වසරට ඇස්තමේන්තු කර ඇත.

සමස්ත වත්කම් ප්‍රමාණය මෙම වසරේදී පෙර වසරට සාපේක්ෂව 17.8% ක අඩු වීමක් දක්නට ලැබුණි.

**වත්කම් සමුදාය**




## මූල්‍ය ප්‍රවාහය හා ද්‍රවශීලතාවය

මෙහෙයුම් ක්‍රියාකාරකම් හා ආයෝජන ඔස්සේ ජනනය කරන මුදල් ආයතනයේ ප්‍රධාන මූල්‍ය ප්‍රවාහ ප්‍රභවයන් වේ. මෙහෙයුම් තුළින් රු.බිලියන 4.8 ක මූල්‍ය ප්‍රමාණයක් ජනනය කළ අතර ආයෝජනය හරහා ජනනය වූ ශුද්ධ මුදල් ප්‍රමාණය බිලියන 1.08 කි. ආයතනයේ මූල්‍ය ක්‍රියාකාරකම් ඔස්සේ සලකන වර්ෂය තුළ ජනනය කරන ලද මුළු මුදල් ප්‍රමාණය රුපියල් බිලියන 3.8කි.

## සේවා මූල්‍ය අවශ්‍යතා හා කාරක ප්‍රාග්ධන අවශ්‍යතා

සමාගම ප්‍රාග්ධන පිරිවැය දැරීමට හා ලාභාංශ ගෙවීමට ප්‍රමාණවත් පරිදි මූල්‍ය ප්‍රවාහය පවත්වාගෙන යාමට හැකි විය.

## කොටස්කරුවන්ගේ අරමුදල්

සියලුම කොටස් හිමිකාරීත්වය දරන්නේ මහා භාණ්ඩාගාරය විසිනි. නිකුත් කරන ලද සමස්ත කොටස් ප්‍රමාණය 50,245,608කි.



# ගෙවතු වගා සඳහා

පලතුරු, එළවළු හා මල් සඳහා කුඩා ඇසුරුම් පොහොර අපි සපයන්නෙමු.

# මානව සම්පත් කළමනාකරණය



### මානව සම්පත් කළමණාකරන ප්‍රතිපත්තීන් හි ප්‍රසස්ත ක්‍රියාකාරකම්

අපගේ මානව සම්පත් කළමනාකරණ උපක්‍රමිකයන් නිවැරැදිව සාප්පු හා කාර්යාල සේවක පනත, පඩි පාලක සභා ආඥාවන්, මහා භාණ්ඩාගාරය හා රේඛීය අමාත්‍යංශ විසින් නිකුත් කරන මාර්ගෝපදේශයන් හා දැනට ලංකාව තුළ භාවිත කරන සියලු කාර්මික නීති රීතීන්වලට අනුකූලව සකස් කර ඇත. එසේම සම්මත ඉහළම පරිපාලන රෙගුලාසීන්ට හා රජයේ ආයතන සංග්‍රහයට අනුකූලව, අප සමාගම අපගේ මානව සම්පත් උපරිම ඵලදායී ලෙස සේවය යෙදවීමට කටයුතු කරන අතර මෙහිදී අප ආයතනික ව්‍යුහය සකස් කිරීමේ දී, යථායෝගී ප්‍රවේශයකින් විනිවිදභාවයෙන් යුතුව කටයුතු කිරීම, ආයතන ව්‍යුහයේ ඇති සේවක ඇබෑර්තු හඳුනාගෙන ඒවා වැටුප් හා සේවා සංඛ්‍යා කොමිෂන් සභාවේ විධානවලට අනුකූලව බඳවා ගැනීම් සිදු කිරීම සහ කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ සම්මතයන් හා විධිවිධානවලට අනුකූලව සේවක උසස්වීම් ලබා දී ඊට ගැළපෙන සේවක ප්‍රතිලාභ පැකේජයන් ලබා දීමට අප කටයුතු කරයි.

### සේවය ප්‍රතිලාභ සැලැස්ම

රජයේ විධිවිධානවලට යටත්ව සේවකයන් වෙනුවෙන් සමාගම සේවකයන්ගේ දළ වැටුපෙන් 12% ක් සේවක අර්ථසාධක අරමුදලට සහ 3%ක් සේවා නියුක්තියන්ගේ භාරකාර අරමුදලට බැර කරයි.

### සේවක ප්‍රතිලාභ සැලසුමක් හඳුන්වා දීම

ගිණුම්කරණ සිද්ධාන්තවලට අනුකූලව සුදුසුකම් ලත් තක්සේරුකරුවෙක් විසින් මූල්‍ය ප්‍රකාශවල සඳහන් සේවක ප්‍රතිලාභ වගකීම් සෑම වසරකම ගණනය කරනු ලබයි. මේ අතර සේවක විශ්‍රාම වැටුප් වගකීම් සඳහා ප්‍රතිපාදන වෙන් කරනු ලබන්නේ සෑම සේවකයෙක්ම සේවයට බැඳුණු පළමු වසරේ සිට ගණනය කිරීම් සිදුකොටයි.

### සේවක අභිප්‍රේරණය

අප සමාගම සේවක අභිප්‍රේරණය පිළිබඳ දැඩි අවධානයක් යොමු කරයි. සේවක අභිප්‍රේරණය තුළින් ඔවුන්ගේ කාර්යසාධනය හා ඵලදායිතාව ඉහළ නැංවීම අරමුණුකොට යහපත් වැඩ පරිසරයක් නිර්මාණය කිරීම, සේවක පහසුකම් වැඩිදියුණු කිරීම, සේවක ආතතිය අවම කිරීම හා එදිනෙදා ක්‍රියාකාරකම්වල හිමිකාරී හැඟීමක් සේවකයන් තුළ ජනිත කිරීම යන දෑ අප සිදු කරයි.

### මූල්‍ය ප්‍රතිලාභ

- ඒක් එක් සේවකයාගේ කාර්ය සාධනය ඇගයීම සඳහා ජාත්‍යන්තර පිළිගත් නිර්ණායකවලට අනුකූලව ඇගයීම් වැඩසටහනක් හා අභිප්‍රේරණ වැඩසටහනක් ස්ථාපිත කර ඇත.

- මූල්‍ය ආතතිය අවම කිරීම සඳහා සුදුසුකම් ලත් සේවකයන් හට තේ,ආහාරපාන, හා ඇඳුම් සඳහා දීමනා ලබා දේ.

- භාවිතා නොකළ ලෙඩ නිවාඩු දින වෙනුවෙන් මූල්‍ය ගෙවීම් සිදු කිරීම තුළින් වැඩි දින ගණනක් සේවා ස්ථානයේ රඳවා තබා ගැනීමට පෙළඹ විය.

- අදාළ සේවකයන් හට ජංගම දුරකතන ලබාදෙන අතර ජංගම දුරකතන බිල් ආයතනය මගින් පියවීම සිදු කරයි. මෙහි අරමුණ වනුයේ ආයතනය වෙනුවෙන් මෙහෙයුම් ක්‍රියාකාරකම්වල නිරත සේවකයන්ගේ මූල්‍ය පීඩනය අවම කිරීමයි.

- සේවය සඳහා වේතන ලබා දීමට එහාගිය වගකීම්සහගත ස්වභාවයේ අප කටයුතු කරන අතර ජාතික, ජාත්‍යන්තර මට්ටමේ අධ්‍යාපනික, ක්‍රීඩා හා සංස්කෘතික අංශයන්ගේ දක්ෂතා දක්වන සේවකයන්ගේ දරුවන්ට මූල්‍ය ආධාර ලබා දේ.



### වෙනත් ප්‍රතිලාභ

- රාජකාරී වාහන ප්‍රාදේශීය කළමනාකරුවන් හට ලබා දීම.
- දිස්ත්‍රික් අලෙවි විධායකයන්ගේ වෙහෙසකර බව අවම කිරීමට සහ ඵලදායිතාව ඉහළ නැංවීමට ඔවුනට මෝටර් සයිකල ලබා දීම.
- සියලු සේවකයන් හා ඔවුන්ගේ පවුලේ අයට වෛද්‍ය රක්‍ෂණාවරණයක් ලබාදෙන අතර මෙය ස්ථාපිත කිරීමේ අරමුණ වන්නේ සේවකයන් හට සෞඛ්‍ය සේවා පහසුකම් පුළුල් කිරීමය.
- ඉහළ විකුණුම් ඉලක්ක සපුරන සේවකයන් අභිප්‍රේරණය කිරීමට විදේශ සංචාර ලබා දීම.
- සේව්‍යයා පීඩනයට පත් නොකරන ආතතියෙන් නිදහස් සේවා සංස්කෘතියක් ගොඩනඟා ඇත. මෙහිදී විවෘත සන්නිවේදන ප්‍රතිපත්ති තුළින් පහළ සිට ඉහළට තොරතුරු නිදහසේ හා සෘජුව ගලායාමට ඉඩහසර සපයා ඇත.
- ආධ්‍යාත්මික හා කුසලතා වර්ධන වැඩසටහන් අපගේ සේවකයන් හට නිරන්තරව ලබා දේ. මෙමඟින් බලාපොරොත්තු වන්නේ සේවකයන්ගේ මානසික සෞඛ්‍ය හා කුසලතා වැඩි දියුණු කිරීමයි.

### විශේෂ වැඩසටහන්

- ලක් පොහොර පවුලේ දිනය 2015 නොවැම්බර් 20 දින දක්වා ඇක්වා පර්ල් ලේක් රිසෝට් හිදී පැවැත්විණි. මෙහිදී සේවකයන් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයන්ට නිදහසේ විනෝද වීමට අවස්ථාව ලද අතර එතුළින් සේවකයන් තුළ ආයතනය පිළිබඳ හැඟීම ශක්තිමත් කරලීමට හැකි විය. සේවක පවුල්වල සාමාජිකයන් 1000ක් මේ සඳහා සහභාගි විය. මෙම අවස්ථාවේදී අවුරුදු 25ක සේවා කාලයක් සපිරූ සේවකයන් තිදෙනකුට ඔවුන්ගේ සේවය අගයමින් රන් තිළිණ ලබාදෙන ලදී.
- අපගේ මානව සම්පත් කළමනාකරණ උපක්‍රමයක් වන සේවක කුසලතා හඳුනාගැනීම හා වර්ධනය කිරීම තුළින් ඔවුන්ගේ ධාරිතා වැඩිදියුණු කිරීම යටතේ, අප සමාගම ජාතික ආධුනිකත්ව සහ කාර්මික පුහුණු ආයතන හා එක්ව ජාතික වෘත්තීය පුහුණු සුදුසුකම් ලැබීමේ අවස්ථා හඳුනාගත් වෘත්තීය කුසලතා ඇති සේවකයන් හට ඔවුන් තාක්ෂණික අංශයක සේවයේ යෙදෙනවාද, නොයෙදෙනවාද යන්න සැලකිල්ලට බඳුන් නොකර සැමට අවස්ථාව ලබා දේ.
- රු.මිලියන 4ක් සේවක පුහුණුවීම් හා සංවර්ධනය වෙනුවෙන් හා කාර්යක්ෂමතා කඩඉම් විභාගය වෙනුවෙන් වෙන්කොට ඇත.
- රු.මිලියන 1.4ක් සේවක පුහුණු වීම් හා සංවර්ධනය වෙනුවෙන් වෙන්කොට ඇත.

### අපේ සේවක සංයුතිය

අපගේ සාර්ථකත්වයේ රහස වන්නේ අපගේ සාමාජිකයන් තුළ වූ ලක් පොහොර සමාගමේ ඉලක්ක වෙනුවෙන් ඇති පූර්ණ කැපවීමයි. අප සතුව සේවකයන් 429ක ගෙන් යුතු කණ්ඩායමක් ඇති අතර ඔවුන් ආයතනයේ සුවිශේෂී ඉලක්ක සහ අරමුණු අත්පත් කර ගැනීම සඳහා ආයතනයේ උපක්‍රමික සැලසුම් ක්‍රියාත්මක කිරීමට බැඳී සිටී. අපගේ සේවා වර්ගීකරණය, ඔවුන්ගේ සේවා පදනම, සේවා ක්ෂේත්‍රය, ප්‍රදේශය හා ස්ත්‍රී පුරුෂ බව පහත පරිදිය.

**සේවා පදනම**




**පළාත් පදනම අනුව සේවකයන්**




**සේවක වර්ගීකරණ පදනම මත**




**ස්ත්‍රී පුරුෂ පදනම මත**




## සේවක සෞඛ්‍යය හා ආරක්ෂාව

සේවක සෞඛ්‍යය හා ආරක්ෂාව සමාගමේ අඛණ්ඩ කාර්යසාධනයට ඉතා වැදගත් සාධකයක් වන අතර අපගේ ව්‍යාපාර ක්‍රියාවලීන් ප්‍රශස්තිකරණ ක්‍රියාවලියේ පදනම වන්නේ සේවක සෞඛ්‍ය හා ආරක්‍ෂාව ප්‍රමුඛතාගත කිරීමයි. මෙමඟින් අප ආයතනය ඉහළ කාර්සාධනයක් හා ඵලදායී ප්‍රතිඵල අත්කරගෙන ඇති අතරම සේවකයන්ගේ දුක්ගැනවිලි අවම කිරීමට හා ආයතනයේ ප්‍රතිපත්ති සහ උපක්‍රමයන් කෙරෙහි සේවකයන්ගේ විශ්වාසය තහවුරු කිරීමට ද මෙය හේතු වී ඇත. අපගේ මෙම උත්සාහය වැඩබිමේ සුරක්ෂිතභාවය කෙරෙහි ඇති ජාත්‍යන්තර ප්‍රමිතයන් හා සමපාත වන අතර අප සේවකයන්ගේ සෞඛ්‍යය, ආරක්ෂාව හා යහපැවැත්මට බලපෑම් වන යම් සිදු වීමක් සිදු වුවහොත් එය සමාලෝචනය කර නැවත එවැනි සිද්ධියක් සිදු වීමේ ඉඩකඩ ඇහිරීමට අවශ්‍ය සියලු පියවර අරගන්නෙමු.

## මානව සම්පත් හා සුබසාධනය

සේවකයන්ගේ කාර්යසාධනය උපරිම කිරීමට උදව් වන හා පහසුකම් සපයන, සේවකයන්ගේ ස්වයං වර්ධනයට හිතකර, නායකත්ව කුසලතා ගොඩනැගෙන හා සේවකයන් තුළ අභියෝගයන්ට සාර්ථකව මුහුණ දීමට ඉඩහසර සලසන ආයතනික වටපිටාවක් ගොඩනැගීමේ වැදගත්කම අපි වඩා හොඳින් අවබෝධ කරගෙන සිටින්නෙමු. සමාගම තුළ මෙවැනි වටපිටාවක් ගොඩනැගීම සඳහා අප තුළ ඇති කැපවීම, කළමනාකරණ කණ්ඩායමේ අඛණ්ඩ හා ඉහළ වගකීමක් ලෙස සැමදා සලකයි.

මීට අමතරව අපගේ සමස්ත මානව සම්පත් කළමනාකරණ ක්‍රියාකාරකම් එකතුවේ කොටසක් ලෙස අප බොහෝ අංශවල, ක්ෂේත්‍රවල හා තේමාවන් හි කටයුතු කරන අභ්‍යන්තර හා බාහිර වෘත්තිකයන්ගේ සේවාව ලබාගෙන, අපගේ සේවකයන්ගේ තාක්ෂණික හා නායකත්ව හැකියාවන් වර්ධනය කරන අතරතුර සේවකයන් අභිප්‍රේරණය කිරීමට, අත්දැකීම් ඔස්සේ ඉගෙනගැනීමට පෙලඹ වීමට හා සේවකයන්ගේ උපදේශන හැකියාවන් වර්ධනය කිරීමට අප කටයුතු කරයි. අප සමාගම සේවකයන්ට අවශ්‍ය හොඳම ඉගෙනුම් වටපිටාව සැකසීමට ඉදිරි දැක්මකින් යුතුව කටයුතු කරන අතර මෙහි ප්‍රතිඵලයක් ලෙස සේවකයන්ට දැනුම යාවත්කාලීන කිරීමට හා වැඩිදියුණු කිරීමට අවශ්‍ය පුස්තකාල පහසුකම් සපයා ඇත.

නූතන නවීන විද්‍යාගාරවල කටයුතු කරන අපගේ විද්‍යාගාර සේවක කණ්ඩායම්හට කාර්යක්ෂම හා තාක්ෂණිකව ස්ථාවර පොහොර විශ්ලේෂණයන් සිදු කිරීමට අවශ්‍ය විශේෂ පුහුණු වැඩසටහන් අප විසින් සංවිධානය කරයි.

## සේවකයන් රඳවා තබාගැනීම

අප සමාගම අභිමානයෙන් යුතුව පවසන්නේ අප හට සේවක පිරිවැය අවම මට්ටමක පවත්වාගෙන යාමට සේම සේවකයන්



සේවය හැරයාම අවම මට්ටමක පවත්වාගෙන යාමට මෙම වසර තුළ හැකි වූ බවයි. මෙයට හේතුව වූයේ අප විසින් සේවක තෘප්තිමත්භාවය උදෙසා සේවක සංවර්ධනය, මිත්‍රශීලී බව, සේවක ඉගෙනුමට හිතකර වටපිටාවක් ඇති කිරීම හා ඒ සඳහා අවශ්‍ය පහසුකම් හා ප්‍රතිලාභ ලබාදීම තුළින් සේවක වෘත්තීය ප්‍රවීණතාව උපරිම කරලීමට හැකිවන ලෙස කටයුතු කිරීම යන පියවරයන්ය.

**සේවක පිරිවැටුම - වයස මත**

| | සේවක සංඛ්‍යාව | % |
|---|---|---|
| වයස 30ට අඩු | 31 | 3.23 |
| වයස 31- 49 අතර | 266 | 0.38 |
| වයස 50 හා ඉහළ | 103 | 7.77 |

**ස්ත්‍රී පුරුෂ බව අනුව සේවක පිරිවැටුම**

| | සේවක සංඛ්‍යාව | % |
|---|---|---|
| පුරුෂ | 9 | 2.87 |
| ස්ත්‍රී | 1 | 1.16 |
| සමස්ත හැරයාම (%) | | 4.03 |

## සේවක ආධ්‍යාත්මික සංවර්ධනය

සමාගමේ සේවකයන්ගේ ආධ්‍යාත්මික සංවර්ධනය සඳහා විශේෂ වැඩසටහන් අප සංවිධානය කරනු ලැබීය.

බෞද්ධ සමිතියේ මඟ පෙන්වීම හා ආශිර්වාද සහිතව ආගමික වැඩසටහන් ආයතන පරිශ්‍රයේ පිහිටි බුදු පිළිමය ඉදිරිපස සහ හුණුපිටියේ පිහිටි මධ්‍යම ගබඩා සංකීර්ණයේදී පවත්වන ලදී. ආගමික සහජීවනය වර්ධනය කිරීමට පූජාවන් ආයතන පරිශ්‍රය ඉදිරිපස පිහිටා ඇති ගණදෙවි පිළිරුවට පවත්වන ලදී. එසේම සෑම වසරක් තුළම අපේ සේවකයන් හා ඔවුන්ගේ පවුලේ සාමාජිකයින් එකට එකතු වී ලක් පොහොර පවුලේ දිනය සමරනු ලබන්නේය.








ලක්පොහොර






ලක්පොහොර
පවුලේ







# අපගේ ප්‍රජාව

**අපගේ ආයතනික සමාජ වගකීම**

රටේ තිරසාර සංවර්ධනය කෙරෙහි, අපගේ ආයතනික සමාජ වගකීම ඉටු කිරීම සේම එම වගකීම් ඉටු කිරීමට මෙහෙයවන ආයතනික ප්‍රතිපත්තිය ද දායක වේ. ඒ සමඟ, අප ගැන උනන්දුවක් දක්වන සියලුදෙනා හා සමස්ත සමාජයම ආදරය දක්වන හා විශ්වාස කරන සමාගමක් ලෙස අපි වර්ධනය වන්නෙමු.



## අපගේ ප්‍රජාව

- ගුණාත්මක නිෂ්පාදන හඳුන්වා දීමේදී පිළිගත් විද්‍යාගාර පරීක්ෂණ සිදු කිරීම.
- අනුග්‍රාහක වැඩසටහන්.
- විවිධත්වයට ගරු කිරීම.
- විශ්වවිද්‍යාල සිසුන්ට රැකියා කේන්ද්‍ර කොටගත් පුහුණු වැඩසටහන්.
- පොහොර භාවිතය පිළිබඳ අධ්‍යාපනය ලබා දීමට පාරිභෝගිකයන් හට පුහුණු වැඩසටහන්

## අපගේ පරිසරය

- කෘෂිකාර්මික ක්ෂේත්‍රය සංවර්ධනයට දායක වීම.
- සෘජු සහ වක්‍ර රැකියා අවස්ථාවන්.
- බදු ගෙවීම.
- කොටස්කරුවන්ට ප්‍රතිලාභ.
- ආයතනික යහපාලනය.

## අපගේ ආර්ථිකය

- බලශක්ති භාවිතය අවම කිරීම.
- පරිසර හිතකාමී නිෂ්පාදන හඳුන්වා දීමට ප්‍රමිතිගත විද්‍යාගාර පරීක්ෂණ.
- කාබනික පොහොර පිළිබඳ ජාතික වැඩසටහනට දායක වීම
- හරිත පාරිසරික අපද්‍රව්‍ය කළමනාකරණය

# තාක්ෂණික අංශය
# වාර්තාව

ලක් පොහොර සමාගම යනු ලංකාවේ පොහොර ආනයනය කර බෙදාහරින ප්‍රමුඛ රාජ්‍ය ආයතනය යන කරුණ නැවත නැවතත් ප්‍රකාශ කිරීමට හෝ පැහැදිලි කිරීමට අවශ්‍ය නැත. සමාගමේ තාක්ෂණික අංශය ලෙස අප පොහොර ආනයනය කරන අවස්ථාවේ සිට පොහොර පාරිභෝගිකයාට ලබාදෙන අවස්ථාව දක්වා මැදිහත් වී පාරිභෝගික තෘප්තිමත්භාවය උපරිම කිරීමට කටයුතු කරයි. මෙම අවසාන අරමුණ දෙසට තාක්ෂණික අංශය, ප්‍රතිසම්පාදන, මූල්‍ය, සිල්ලර සහ බෙදාහැරීමේ අංශ හා එක්ව ආයතනික මූලික අරමුණු උපරිම කිරීමට හා දින හත පුරාම ක්‍රියාත්මක සදාචාරාත්මක වැඩ ප්‍රතිපත්තීන් තුළින් සේවකයන්ට වඩාත්ම හිතකර පරිසරයක් ඇති කරයි.

අප ගුණාතමකව කණ්ඩායම 20 දෙනකුගෙන් පමණ සමන්විත වන අතර එම කණ්ඩායම අපගේ වැටුප් අංශය වෙත, සියලු ලියාපදිංචි ප්‍රවාහන පහසුකම් සපයන්නන් සහ ඔවුන්ගේ නියෝජිතයන් වෙත, ලියාපදිංචි සියලු සිල්ලර බෙදාහරින්නන් වෙත සහ අප ආයතනය හා එක්ව විවිධ සේවා සපයන සියලුදෙනා වෙනුවෙන්, අනභිභවනීය සේවාවක් ඉටු කරයි. අප විසින් මිත්‍රශීලී සේවයක් සැපයීම සෘජුව ලාභය ඉහළ යාමට හේතු වන බව හඳුනාගෙන ඇති අතර, අප සෑම අවස්ථාවකම ඉහළ ගුණත්වයෙන් යුතු සේවයක් සැපයීමට කැපවී සිටී.




අප නිවැරැදි බර කිරීමේ වේදිකාවක් පවත්වාගෙන යාම තුළින් අප නිකුත් කරන පොහොර ප්‍රමාණයන් නිවරැදි බවට තහවුරු කරයි.



අපගේ ගබඩා පහසුකම් තුළ ඇසුරුම් කිරීමේ යන්ත්‍ර ස්ථාපිත කිරීම තුළින් කාර්යක්ෂමතාව උපරිම කිරීමට හා ගබඩා පහසුකම් කොළඹ පවත්වාගෙන යාමේ පිරිවැය අඩු කිරීමට හේතු විය.



ආයතනය භූමිය සහ ගොඩනැගිලි නඩත්තු කිරීම සහ නවීකරණය කිරීම.



කාර්යමණ්ඩලයට අඛණ්ඩව ජලය හා විදුලි බලය ලබා දීම සහ අභ්‍යන්තර දුරකතන පද්ධතිය නඩත්තු කර පවත්වාගෙන යාම.

# බෙදාහැරීමේ අංශය




බෙදා හැරීමේ අංශයේ ප්‍රධාන කාර්යයන් වන්නේ ආනයනය කරන පොහොර හුනුපිටිය පිහිටි ගබඩා සංකීර්ණයේ ගබඩා කොට තබා පලාත් ගබඩා, බලයලත් නියෝජිත ආයතන හා බලයලත් බෙදාහරින්නන් ඔස්සේ ඒවා බෙදා හැරීමයි.

මීට අමතරව, පර්යේෂන ආයතන විසින් නිකුත කරන ලද විධානයන් හා සම්මතයන්ට අනුකූලව පොහොර මිශ්‍ර කිරීමද බෙදාහැරීමේ අංශයේ කාර්යයකි. රටපුරා විහිදුනු ගබඩා 52ක් බෙදා හැරීමේ අංශය විසින් මෙහෙයවන අතර ඒවායේ සමස්ත ධාරිතාවය දළ වශයෙන් මෙට්‍රික් ටොන් 150,000කි.

**ගබඩා කිරීමේ ධාරිතාව**







තේ, රබර් සහ පොල් පර්යේෂණ ආයතන පොහොර මිශ්‍ර කිරීම සදහා නිර්දේශ කරන අනුපාතවලට අනුකූලව, 2015/2016 වර්ෂය තුළ මෙට්‍රික් ටොන් 24,774ක් පොහොර සම්මිශ්‍රණ නිපද වූ අතර මෙම පොහොර කාර්යක්ෂමව බෙදාහැරීම සඳහා ද අවශ්‍ය කටයුතු සිදු කළේය.

2015/16 වසර තුළ මිශ්‍රිත පොහොර විශාල ප්‍රමාණයක් (49%) තේ කර්මාන්තය වෙනුවෙන් නිපද වූ අතර අනෙකුත් බෝග සඳහා පොහොර 24% ක්ද, පොල් සඳහා 19% ක්ද, රබර් සඳහා 8% ක් බැගින් ද නිපදවන ලදී.

# මිලදී ගැනීමේ/ සම්පාදන අංශය

ආයතනයේ මූලික පරමාර්ථ ඉටු කිරීමේදී මිලදී ගැනීමේ ක්‍රියාවලිය සුමටව සිදු කිරීම අත්‍යවශ්‍ය වේ. අපගේ සම්පාදන කණ්ඩායම 15 දෙනෙකුගෙන් සමන්විත වන අතර ඔවුන් මෙම කර්තව්‍යය කෘෂිකාර්මික සහ ගොවිජන ප්‍රජාවගේ බලවත් ඉල්ලුමක් සහිත පුළුල් සහ විවිධාංගීකරණයෙන් යුතු වෙළෙඳපොළට, පොහොර නිපදවීම හා අලෙවි කිරීම තුළින් මනාව ඉටු කිරීමට පුහුණු කර ඇත.

## මිලදී ගැනීමේ අංශය 15 දෙනකුගෙන් සමන්විත වන අතර එය සමන්විත වනුයේ පහත පරිදිය.



මිලදී ගැනීමේ අංශයේ වගකීම වනුයේ ආයතනයේ නිෂ්පාදන නිර්දේශයන් හා මිලදී ගැනීම් මාර්ගෝපදේශය සහ අත්පොත අනුව භාණ්ඩ, සේවා, වැඩ සහ උපදේශන සේවයන් අත්පත් කර ගැනිමය.  ප්‍රධාන වශයෙන් අපි පොහොර ආනයනයට අවධානය යොමු කරන අතර එම ක්‍රියාවලිය ආයතනයේ කොටසක් ලෙස සලකන මිලදී ගැනීමේ මාර්ගෝපදේශය අනුව සිදු කරයි.

කැබිනට් මණ්ඩලය අනුමත කළ මිලදී ගැනීම් ක්‍රියාවලියට අනුව ඇමැති මණ්ඩලය විසින් පත් කරන ලද අමාත්‍යංශ ලේකම්වරුන්ගෙන් සමන්විත කමිටුවක් මඟින් අදාළ මිලදී ගැනීමට නිර්දේශ ඉදිරිපත් කරන අතර මෙම කමිටුවට සහාය සඳහා තාක්ෂණික ඇගයීම් කමිටුවක් පිහිටුවා ඇත.

ලක් පොහොර සමාගම කිසිදු ආකාරයෙන් රජයේ ඒකාබද්ධ අරමුදලෙන් අරමුදල් ලබා නොගනී. අප සමාගම රටේ වී සඳහා අවශ්‍ය සමස්ත පොහොර අවශ්‍යතාවයෙන් 65% - 75% ක් අතර ප්‍රමාණයක් සපුරාලයි.

පහත සඳහන් ප්‍රස්තාරයෙන් පෙන්වන්නේ වාර්ෂික පොහොර ආනයනය 2013 - 2015 කාලය තුළ සමස්ත ආනයනවල ප්‍රතිශතයක් ලෙස,




පසුගිය වසර තුන තුළ  ප්‍රවාහනයේදී ප්‍රමාද නොවීමේ මුදල්, නැව් ආරක්ෂණ වන්දි නොගැනීමේ ප්‍රතිදාන සහ ඇපකර හිමිකම් සහ යන මාර්ගවලින් උපයන ලද අතිරේක ආදායම පහත වගුවේ දක්වයි.






# තොරතුරු තාක්ෂණ අංශය

තොරතුරු තාක්ෂණ අංශයෙන් බලාපොරොත්තු වන්නේ තොරතුරු තාක්ෂණ ප්‍රතිපත්ති හා සැකසුම් කිරීමට අදාළ කටයුතු සිදු කිරීම, මෘදුකාංග භාවිතය හා පවත්වාගෙන යාම, දෘඪාංග අත්පත්කර ගැනීම සහ පවත්වාගෙන යෑම, පරිගණක ජාලගත කිරීම හා පවත්වාගෙන යෑම, කාර්යක්ෂම හා ඵලදායී දත්ත/ තොරතුරු කළමනාකරණ කිරීම, වෙබ් පිටුව පවත්වාගෙන යාම හා දත්ත ආරක්‍ෂාව තහවුරු කිරීම් යන කාර්යයන් ඉටු කිරීමය.

- හඳුන්වා දුන් ආයතන සම්පත් සැලසුම් (Enterprise Resource Plan) මෘදුකාංගය අප සමාගමේ ප්‍රධාන කාර්යාලය තුළ ක්‍රියාවේ යෙදවීම.
- මෙම ERP මෘදුකාංගය ඔස්සේ පොළොන්නරුව, වීරවිල, කුරුවිට, මතුගම වැනි ස්ථාන 10ක් පුරා පිහිටා ඇති ප්‍රාදේශීය ගබඩා VPN ජාලය ඔස්සේ සම්බන්ධ කිරීම.
- දැනට පරිගණක 110ක් සම්බන්ධ වී ඇති ප්‍රධාන කාර්යාලයේ ස්ථාපිත කර ඇති පෙදෙසි ජාලයට සම්බන්ධ පරිගණක ප්‍රමාණය 200 දක්වා වැඩි කිරීම.
- රාජකාරි ජංගම දුරකතන හා ලැප්ටොප් සඳහා ආරක්ෂිත වයිෆයි ජාලයක් හඳුන්වා දීම.



# ආයතනික යහපාලනය




අප සමාගම ආයතනගත කර ඇත්තේ ශක්තිමත් චර්යාධර්ම පද්ධතියක් සේම මානව සම්පත් කළමනාකරණ මූලධර්ම මත දිවෙන කළමනාකරණ ධූරාවලියක් සමගය.

ඉහළම කළමනාකරණ ප්‍රමිතීන්ට අනුකූලව, අප ආයතනය තුළ ආයතනික යහපාලනය පවත්වාගෙන යාමේ පූර්ණ වගකීම පැවරී ඇත්තේ අධ්‍යක්ෂ මණ්ඩලයටයි. ආයතනික යහපාලනය පහත සඳහන් නීති, රෙගුලාසි හා විධිවිධානවලට යටත්ව ක්‍රියාත්මක කරයි.

1. 2007 අංක 7 දරන සමාගම් පනත.

2. පොදු ව්‍යවසාය දෙපාර්තමේන්තුව මඟින් සකසන ලද යහපාලනය සඳහා වූ මාර්ගෝපදේශයන්

3. පොදු ව්‍යවසාය දෙපාර්තමේන්තුවේ ප්‍රශස්තම ආයතනික යහපාලන පරිචයන් සංග්‍රහය

## අධ්‍යක්ෂ මණ්ඩලය

අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වන්නේ රාජ්‍ය ප්‍රතිපත්තීන්ට අනුකූලව අප සමාගම කාර්යක්ෂම හා ඵලදායී ලෙස කළමනාකරණයට ලක් කිරීමයි. මෙය ළඟා කරගත හැක්කේ, ආයතනික සම්පත් ආරක්ෂා කිරීම, නිවැරදි ගිණුම්කරණ ක්‍රමවේදයක් පවත්වාගෙන යාම, නිවැරදිව මිලදී ගැනීම් සිදු කිරීම හා කළමනාකරණයට අදාළ නීති ප්‍රකාර සියලු නෛතික හා අනෙකුත් බැඳීම් නිසියාකාරව ඉටු කිරීම තුළිනි.

ආයතනය සතුව උපක්‍රමික අභිමතාර්ථ ඇති බවට හා ආයතනය ඒවා ළඟාකර ගැනීමට කටයුතු කරන බවට විධායක මණ්ඩලය තහවුරු කරයි. අප ආයතනයේ අභ්‍යන්තර පාලනය සහ කළමනාකරණ ක්‍රමවේදයන් ස්ථාපිත කර ඇති බවට, කළමනාකරණ ක්‍රියාකාරකම් ඵලදායී ලෙස සිදුවන බවට සහ සම්පත් ඵලදායී ලෙස භාවිතා වන බව ක්‍රමානුකූලව අධීක්ෂණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සිදු කරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වාර්ෂිකව සාමාන්‍යාධිකාරීතුමන්ගේ සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරුවන්ගේ කාර්ය සාධනය ඇගැයීමට ලක් කරයි. එසේම ඔවුන් විසින් අප සමාගම කෙරෙහි උනන්දුවක් දක්වන පාර්ශ්වයන්ට අවශ්‍ය මූල්‍ය තොරතුරු ලබාදීම, එවැනි තොරතුරු නිරාවරණය කළ යුත්තේ කෙසේ, කවර අවස්ථාවන්හි ද යන්න පිළිබඳව විධිමත්ව උපදෙස් දීම සිදු කරයි.

විගණක සහ අවදානම් කළමනාකරණ කමිටුව පත් කිරීමේ වගකීම අධ්‍යක්ෂ මණ්ඩලය දරයි. අප සමාගම පාලනය සඳහා සම්මත යහපාලන මඟ පෙන්වීම්, චර්යාධර්ම පද්ධතියක් හා ආයතනික යහපාලනය සඳහා උපක්‍රමිකයන් හඳුන්වා දී ඇත.
සමාගමේ මෙහෙයුම් ක්‍රියාකාරකම් සහ අයිතිය පිළිබඳ කිසිඳු ගැටීමක් ඇති නොවන පරිදි රජයේ සියලු ව්‍යවස්ථාපිත විධිවිධාන හා මඟපෙන්වීම්වලට අනුව සමාගම ක්‍රියාත්මක කරන බව තහවුරු කිරීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කරයි.

## අධ්‍යක්ෂවරු පත් කිරීම

රජය විසින් අධ්‍යක්ෂවරු පත් කිරීමේ දී එම පත්වීම් පිළිගත් ක්‍රමවේදයන්ට අනුකූලව, තරඟකාරී ලෙස හා වගකීමෙන් යුතුව සිදු කරයි. අධ්‍යක්ෂවරුන්ගේ බැඳීම්, රාජකාරීන් සහ වගකීම් ඔවුන් නිකුත් කරන පත්වීම් ලිපියේ බලය ලත් පුද්ගලයකු විසින් පැහැදිලිව සටහන් කරයි. පත් කරන ලද අධ්‍යක්ෂවරුන්ට ආයතනයේ උපක්‍රමික ඉලක්කයන්, ආයතනික අභිමතාර්ථ, ආයතනික යහපාලනය, කළමනාකරණ හා පරිපාලන පද්ධතීන් හා ක්‍රියාවලීන්ට අදාළ වගකීම් පවරනු ලබයි.

## අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම

2015/16 මූල්‍ය වර්ෂය තුළ අධ්‍යක්‍ෂ මණ්ඩලය 12 වරක් රැස් වී ඇත. සමාගමේ කළමනාකාරීත්වය විසින් අධ්‍යක්‍ෂ මණ්ඩලයට අවශ්‍ය තොරතුරු අධ්‍යක්‍ෂ මණ්ඩල පත්‍රිකා හරහා නිසි කලට ලබා දී ඇත.

## අධ්‍යක්ෂ මණ්ඩල දීමනා

රජය විසින් තීරණය කරන ප්‍රතිපත්ති හා පරිමාණවලට අනුකූලව අධ්‍යක්ෂ මණ්ඩල දීමනා ගෙවනු ලබයි. මීට අදාළ තීරණ සඳහා අධ්‍යක්ෂ මණ්ඩලය මැදිහත් වීමක් සිදු නොකරයි.

## සභාපති

සමස්ත ආයතනික ව්‍යුහය වෙනුවෙන් සභාපතිගේ කාර්යභාරය ඉතා වැදගත් වන අතර ඔහුගෙන් ආයතනය නිවැරැදි දිශාවට ගමන් කරවීම බලාපොරොත්තු වේ. සභාපතිතුමා විසින් ආයතනික යහපාලනයට අදාළ කටයුතු, සෑම අධ්‍යක්‍ෂවරයෙක්ටම එකසේ සැලකීම, වගකීම නිසි පරිදි බෙදාහැරීම, බලය සහ අධිකාරිත්වය සමපාත කිරීම සහ ඔහු සභාපතිත්වය දරන අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් මෙහෙයවීම යන කටයුතු සිදු කරයි. සභාපතිතුමා විශේෂඥ දැනුම උසුලන ක්ෂේත්‍රයේ ක්‍රියාකාරකම් සඳහා ඔහුගේ දායකත්වය අපේක්ෂා කරන අතර අනෙකුත් අංශවල කටයුතුවලට මැදිහත් නොවී, අධීක්‍ෂණ කටයුත්ත පමණක් සිදු කිරීම ඔහුගෙන් අපේක්ෂා කරයි. එසේම අනෙකුත් අධ්‍යක්‍ෂවරුන්ගේ සක්‍රීය ක්‍රියාකාරීත්වයට අනුබල දීම ද සභාපතිතුමා විසින් සිදු කරයි.

## අධ්‍යක්‍ෂ මණ්ඩල ලේකම්

වෘත්තීයව සුදුසුකම්ලත් ලේකම්තුමා විසින් අධ්‍යක්‍ෂ මණ්ඩලයට, අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම්, වාර්ෂික මහ සභා රැස්වීම් පිළිබඳ සහ අධ්‍යක්‍ෂ මණ්ඩලයට අදාළ කොන්දේසි හා රෙගුලාසි පිළිබඳ කඩින් කඩ ඔවුන්ව දැනුවත් කිරීම සිදු කරයි.

ලේකම්තුමා විසින් අධ්‍යක්‍ෂ මණ්ඩල රැස්වීම් සඳහා අදාළ ක්‍රියාවලිය අනුගමනය කරන බව තහවුරු කරන අතර ඔහු විසින් අධ්‍යක්ෂ මණ්ඩලය ඵලදායී ලෙස කටයුතු කරන බවට තහවුරු කිරීම සහ නිසි කලට අදාළ අධ්‍යක්‍ෂ මණ්ඩල පත්‍රිකා අධ්‍යක්‍ෂවරුන් වෙත ලැබීමට සැලැස්වීමට කටයුතු කරයි.

එසේම අධ්‍යක්‍ෂ මණ්ඩල වගකීම්වලට අදාළ මඟ පෙන්වීම් ලබාදීම, අධ්‍යක්‍ෂ මණ්ඩලයට අදාළ වගකීම්, නියමයන් සහ කොන්දේසි පිළිබඳ දැනුවත් කිරීම සහ අධ්‍යක්‍ෂ මණ්ඩලයට අවශ්‍ය උපදෙස් හා සහාය ලබාදීම ද අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්තුමා විසින් සිදු කරයි.

## සාමාන්‍යාධිකාරී සහ ජ්‍යෙෂ්ඨ කළමනාකරණය

සමාන්‍යාධිකාරීතුමා සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වය සමාගමේ ව්‍යාපාර කටයුතු කළමනාකරණය කිරීමේ වගකීම දරයි. ප්‍රතිපත්තීන් ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීම සහ අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණ ක්‍රියාවට නැංවීම ආරම්භ කිරීම සාමාන්‍යාධිකාරීතුමාගේ සහ ඉහළ කළමනාකාරීත්වයේ වගකීමකි. ඔවුන් විසින් අධ්‍යක්‍ෂ මණ්ඩලයේ අවධානයට සහ තීරණ ගැනීමට අවශ්‍ය තොරතුරු හා පැහැදිලි කිරීම්, ඉදිරිපත් කිරීම සිදු කරයි. එසේම ඔවුන් විසින් ආයතනයේ දැක්ම හා මෙහෙවර ළඟා කර ගැනීමට අවශ්‍ය සැලසුම් සහ අයවැය සැකසීම සේම ඵලදායී ආයතනික කළමනාකරණයක් උදෙසා ආයතනයේ පරිපාලන සහ නියාමන කාර්යයන් පවත්වාගෙන යයි.

දීමනා ගෙවීමේ යෝජනාවලට අදාළ උපදෙස් පිළිපැදීම සිදු කරමින් සාමාන්‍යාධිකාරීගේ සහ ඉහළ කළමනාකාරීත්වයේ දීමනා තීරණය කිරීම සිදු කරයි.

## මූල්‍ය වාර්තා

ආයතනයේ වාර්ෂික මූල්‍ය තත්ත්වය හා කාර්ය සාධනය පිළිබිඹු කරමින් නිවැරදි හා සාධාරණ ආකාරයකින් වාර්ෂික මූල්‍ය වාර්තා සැකසීම අධ්‍යක්‍ෂ මණ්ඩලයේ වගකීමකි. 2007 අංක 7 දරන සමාගම් පනත සහ ලංකාවේ භාවිත කරන ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය වාර්තා සැකසීම හා ඉදිරිපත් කිරීම සිදු කළ යුතුයි. අධ්‍යක්‍ෂ මණ්ඩලයට, සාමාන්‍යාධිකාරීතුමාට සහ ජ්‍යෙෂ්ඨ කළමනාකාරීත්වයට තීරණ ගැනීමට සහ වගකීම් ඵලදායීව ඉටු කිරීමට හැකි වන පරිදි සියලු වැදගත් මූල්‍ය තොරතුරු අවශ්‍ය පරිදි, මූල්‍ය ප්‍රකාශන ඔස්සේ හෙළිදරව් කළ යුතුය.

## වාර්ෂික විගණනය

විගණකාධිපති දෙපාර්තමේන්තුවෙන් වාර්ෂික විගණනය සිදු කරනු ලබයි. එම වාර්තාව අධ්‍යක්‍ෂ මණ්ඩලය සමාලෝචනය කරන අතර වාර්ෂික මහ සභා රැස්වීමේදී එය අනුමැතිය සඳහා ඉදිරිපත් කරයි.

## විගණන හා අවදානම් කළමනාකරණ කමිටුව

විගණන හා අවදානම් කළමනාකරණ කමිටුව අධ්‍යක්‍ෂ මණ්ඩලයේ පරිපාලන කටයුතු සඳහා සහාය වෙමින් වැදගත් කාර්යයක් ඉටු කරයි. මෙම කමිටුව සමන්විත වන්නේ අධ්‍යක්‍ෂ මණ්ඩලයේ සිටින විධායක නොවන සාමාජිකයන් තුන්දෙනකුගෙන්ය. මේ අතරට භාණ්ඩාගාරය නියෝජනය කරමින් සුදුසුකම් ලත් පුද්ගලයකු ඇතුළත් වේ. මෙම භාණ්ඩාගාර නියෝජිතයා විගණන කමිටුවේ සභාපතිත්වය දරයි.

# ආයතනයේ සංවිධාන ව්‍යුහය




| | |
|---|---|
| **නි.ක.** | - නියෝජ්‍ය කළමනාකරු |
| **ස.ක.** | - සහකාර කළමනාකරු |
| **ක.ක.** | - කනිෂ්ඨ කළමනාකරු |
| **ක.ස.** | - කළමනාකරණ සහකාර |
| **ප්‍රා.ශි.** | - ප්‍රාථමික ශිල්පීය සේවා ගණයේ සේවක භවතුන් |
| **ප්‍රා.අ.ශි.** | - ප්‍රාථමික අර්ධ ශිල්පීය සේවා සේවක භවතුන් |
| **ප්‍රා.ශි.නො.** | - ප්‍රාථමික ශිල්පීය නොවන සේවා සේවක භවතුන් |

# අවදානම් කළමනාකරණය

## අවදානම් කළමනාකරණ ක්‍රියාවලිය

අවදානම් හඳුනාගැනීම සහ හඳුනාගත් අවදානම අවම කිරීම ආයතනයක අවදානම් කළමනාකරණය තුළින් සිදු වේ. මෙම ක්‍රියාවලිය තුළින් ආයතනයක් හානීන් පිටුදැකීම සහ සිදුවන හානිය අවම කිරීමට අවශ්‍ය ඵලදායී සැලැස්මක් සකස් කර ක්‍රියාත්මක කර ඇති බව තහවුරු කරයි. අවදානම් කළමනාකරණය, අවදානම් හඳුනා ගැනීමට අවශ්‍ය පැහැදිලි හා ව්‍යුහගත මාර්ගයක් ඉදිරිපත් කරයි. සියලු අවදානම් පිළිබඳ පැහැදිලි අවබෝධයක් ලබා ගැනීම තුළින් ආයතනයට අවදානම් පිළිබඳ ඇගයීමක් කර, ඒවා ප්‍රමුඛගත කර අවදානම් අවම කිරීමට අවශ්‍ය පියවර ගැනීමට පහසුකම් සලසයි.

අප සමාගම විසින් ස්ථාපිත කර ඇති ක්‍රියාවලියක් භාවිතා කරමින් යුහුසුලුව අවදානම් හඳුනා ගැනීම, අවම කිරීම හා නොසැලකිලිමත් බව වෙනස් කිරීම සඳහා කටයුතු සිදු කරයි. අපේ අවදානම් කළමනාකරණ පද්ධතියේ මූලික අරමුණ වන්නේ අවදානම් පිළිබඳ පූර්ණ අවධානයකින් යුතුව ආයතනික මෙහෙයුම් කටයුතු සඳහා සහාය වීමයි. අවදානම් හඳුනාගැනීම සහ අවදානම් ඇගයීම කළ යුතු මුඛ්‍ය සහ පරම කාර්යය වේ. හඳුනාගත් අවදානම් මඟ හැරීමට, අවම කිරීමට, හා වෙනස් කිරීමට අවශ්‍ය උපක්‍රමිකයන් සැලසුම් කිරීම දෙවනුව සිදු කරයි. ආයතනයේ මෙහෙයුම් කෙරෙහි අවධානය යොමු කරමින් කටයුතු කරන අවදානම් කළමනාකරණ පද්ධතියක් ක්‍රියාත්මක වන බවට තහවුරු කිරීම සමාගම් අධ්‍යක්ෂ මණ්ඩලය අනිවාර්යයෙන්ම සිදු කළ යුත්තකි.

## ප්‍රධාන අවදානම් සාධක

අවදානම් සාධක කිහිපයකට අප සමාගම නිරාවරණය වී ඇති අතර මෙහෙයුම් ව්‍යුහය තුළ අවිනිශ්චිතතාවයක් දක්නට ඇත. මෙම අවදානම් සාධක හා ඒවා පිටුදැකීමට ගෙන ඇති පියවරයන් පසුව සාකච්ඡාවට ගැනෙනු ඇත.

## උපක්‍රමික අවදානම

අපගේ උපක්‍රමික අරමුණු හා බැඳුණු අවිනිශ්චිතතාවයන් හි ප්‍රයෝජනයට නොගැනුණු අවස්ථාවන් නිසා මතුවන අවදානම උපක්‍රමික අවදානම වේ. මෙවැනි ආකාරයේ අවදානම් පැනනගින්නේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් ආයතන අභිමතාර්ථවලට අනුව ගන්නා තීරණ මතය. උපක්‍රමික අවදානම පසුපස ඇති ප්‍රධානම කාරණය වන්නේ අප විසින් යෝජිත ආයතනික අභිමතාර්ථ ළඟා කර ගැනීමට නොහැකි වීමයි. මෙම කාරණය සැලකිල්ලට ගෙන, අධ්‍යක්ෂ මණ්ඩලය හා කළමනාකරණ කණ්ඩායම ඉදිරි වසර පහ සඳහා අනාගත සංයුක්ත සැලැස්ම, වසර 3 ක ක්‍රියාකාරී සැලැස්ම හා වාර්ෂික සැලැස්ම මත පදනම්ව ක්‍රමානුකූලව සිදු කරන පශ්චාත් සමාලෝචනයක් සිදු කරයි.

## ව්‍යාපාර අවදානම

මෙයට අදාළ වන්නේ පොහොර නිෂ්පාදනය, අලෙවි කිරීම, විකිණීමට අදාළ අවදානම් සේම නිෂ්පාදන පිරිවැයට බලපෑම් වන ආර්ථික අවදානම්, තාක්ෂණික පරිසරයේ සහ ගනුදෙනුකාර තීරණවල වෙනස් වීම නිසා ඇති විය හැකි අවදානම්ය. අපගේ ව්‍යාපාර කටයුතුවලට අදාළ ප්‍රධාන අභ්‍යන්තර අවදානම් වන්නේ දැනට පවතින තරගකාරී නිෂ්පාදන හා කටයුතු කිරීමට නොහැකි වීම හා අලුත් නිෂ්පාදන නිපදවීමේදී ඇතිවන ව්‍යාපාරික අවදානම වේ. පවතින නිෂ්පාදන හා තරඟ කිරීමට නොහැකි වීම කාරණා 4 ක් මත සිදු වේ. ඒවා නම් පාරිභෝගික අවශ්‍යතා නිසි පරිදි හඳුනාගැනීමට නොහැකි වීම, තාක්ෂණය, කාර්මික සහ ආර්ථික සාධක සහ න්‍යායාත්මක අවශ්‍යතාවයන්ය.

පාරිභෝගික තෘප්තිමත්භාවය සහ ඔවුන්ගේ අවශ්‍යතා වෙනස් වීම පිළිබඳ අප ආයතනය ක්‍රමානුකූල අධ්‍යයනයන් සිදු කරයි. නියාමනයන්ගේ සිදුවිය හැකි අනාගත වෙනස්කම් හා ඒ සමගාමීව අප ආයතනය තුළ ක්‍රියාත්මක කළ හැකි නිර්දේශ පිළිබඳ, අප දැනට පවතින ප්‍රධාන පෙළේ මණ්ඩල හා ආයතන සමඟ එක්ව කටයුතු කරයි. මෙලෙස කටයුතු කරන ආයතන ඇතුළට ශ්‍රී ලංකා රජය, පොල් පර්යේෂණ ආයතනය, තේ පර්යේෂණ ආයතනය හා රබර් පර්යේෂණ ආයතනය ඇතුළත් වේ.

අලුත් නිෂ්පාදන අප ඉදිරිපත් කරන්නේ වෙළෙඳපොළ හා පාරිභෝගික අවශ්‍යතා පිළිබඳ පූර්ණ අධ්‍යයනයක් සිදු කිරීමෙන් අනතුරුවය.

## ව්‍යාපාර නොවන අවදානම්

මෙම අවදානම අපගේ මූලික ව්‍යාපාර කටයුතුවලට අදාළ නොවන අතර එය ආයතනයේ දිගු කාලීන මූල්‍ය අවශ්‍යතා සපුරා ගැනීම හා බැඳේ. පස් අවුරුදු සංයුක්ත සැලැස්ම හා තුන් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම

මත පදනම්ව ආයතනයේ දිගු කාලීන මූල්‍ය අවශ්‍යතා පිළිබඳ ඇගයීමක් සිදු කර ඒවා සපුරාලිය හැකි මූලාශ්‍ර අප හඳුනාගත්තේය. වාර්ෂික අයවැය සැලසුම් හා මිලදී ගැනීමේ සැලැස්ම තුළින් ආයතනය තුළට ගලා එන හා ආයතනයෙන් ගලායන මුදල් ප්‍රවාහය කාර්යක්ෂම කිරීමට හැකි විය. කිසිදු අවස්ථාවක ක්ෂණික මුදල් අවශ්‍යතාවයන් හට නොගත්තේය.

## මෙහෙයුම් අවදානම්

මෙමඟින් ආයතනයේ බිම් මට්ටමේදී කුමක් සිදු වන්නේද යන්න පිළිබඳ අවබෝධයක් ලබා දේ. මෙහෙයුම් අවදානම් ප්‍රධාන වශයෙන් ආයතනයේ අභ්‍යන්තර සම්පත්, පද්ධතීන්, ක්‍රියාවලීන් හා සේවකයන් හා බැඳී පවතී. මෙම අවදානම තුළ ස්වභාවිකව සිදුවිය හැකි ගබඩා ක්‍රමවත්ව ක්‍රියා නොකිරීම, යන්ත්‍රෝපකරණ දෝෂ, සේවක පිරිවැය හා අයහපත් කාලගුණය වැනි සිද්ධීන් ද ඇතුළත්ය.

- ප්‍රමාණවත් ගිනි නිවන උපකරණ සහ අනතුරු ඇඟවීමේ සංඥා ඇතුළත් විශාල ගිනි ආරක්ෂණ පද්ධතියක් ආයතනය පවත්වාගෙන යයි.
- ගින්නක් තුළින් ඇතිවිය හැකි හානි පූර්ණය සඳහා ගිනි රක්ෂණ ආවරණයක් ආයතනය ලබාගෙන ඇත. එසේම අධි සංවේදී විද්‍යාගාර උපකරණ වෙනුවෙන් ඉලෙක්ට්‍රොනික රක්ෂණ ආවරණයක් ලබාගෙන ඇත.
- ජංගම මුදල් සහ සාප්පු මුදල් සඳහා රක්ෂණ ආවරණයක් මිලදී ගෙන ඇත. මෙහි අරමුණ වන්නේ සොරසතුරු සහ වංචනික ක්‍රියාවල අවදානම අවම කිරීමයි.
- සියලු ආයතනික නැව්ගත බඩු වෙනුවෙන් මුහුදු රක්ෂණ ආවරණයක් ලබාගෙන ඇත.
- මූල්‍ය හා මූල්‍ය නොවන සේවක අභිප්‍රේරණ වැඩසටහන් නිසා සේවක පිරිවැය අඩු මට්ටමක පවතී.

## මුදල් අවදානම්

ආයතනය මුදල් අවදානමක් දරන අතර ඒ තුළ ණය අවදානම, දුර්වලතා අවදානම හා වෙළෙඳපළ අවදානම ඇතුළත්ය.

## ණය අවදානම

අදාළ පාර්ශ්වයන් එකඟ වූ පරිදි මූල්‍ය වගකීම් ඉටු කිරීම පැහැරහැරිය හොත් ආයතනය මූල්‍ය පාඩුවක අවදානම දරයි. ණය අවදානම් ඇති වන්නේ භාණ්ඩ ණයට විකිණීම නිසා හා මූල්‍ය ආයතනවල ඇති අපගේ තැන්පතු නිසාය.

- බෙදාහරින්නන් පත් කිරීමට පෙර ඔවුන් එකිනෙකාගේ හැකියාව හා ශක්තිමත්භාවය පිළිබඳ පූර්ණ ඇගයීමක් ප්‍රාදේශීය අලෙවිකරුවන්, ප්‍රධාන විගණන නිලධාරී, මූල්‍ය කළමනාකරු සහ සමාගමේ නීති නිලධාරීන්ගෙන් සැදුම්ලත් කණ්ඩායමක් සිදු කරයි.
- ණය පහසුකම් ලබා දීමට පෙර බෙදාහරින්නන්ගෙන් හා අදාළ පාර්ශ්වයන්ගෙන් බැංකු ඇපකර ලබා ගනී.
- බෙදාහරින්නන් සහ අදාළ පාර්ශ්වයන් පිළිබඳ සිදු කරන ණය විශ්ලේෂණයේ නිගමන මත ඔවුන්ගේ ණය සීමාවන් හා ණය කාලසීමාව තීරණය කරයි.

## ද්‍රවශීලතා අවදානම

සමාගම සිය මූල්‍ය වගකීම ඉටු කිරීමට අපොහොසත් වීම ද්‍රවශීලතා අවදානම වේ. ආයතනයේ ද්‍රවශීලතාව පාලනය කිරීමේ ප්‍රවේශය වන්නේ එදිනෙදා හා අනපේක්ෂිත ලෙස ඇතිවිය හැකි වගකීම් කළමනාකරණයට සරිලන මුදල් ප්‍රමාණයක් පවත්වාගෙන යාමයි. අනාගත පස් අවුරුදු සැලැස්ම හා ඉදිරි තුන් අවුරුදු ක්‍රියාකාරී සැලැස්ම ආයතනයෙන් එළියට මුදල් ගලායෑම් සහ ඒවායේ මූලාශ්‍ර මොනවාද යන්න හඳුනාගැනීමට සහ ආයතනයට මුදල් ගලාඒම් සහ ආයතනයෙන් මුදල් ගලායෑම් කාර්යක්ෂම කිරීමට ඉවහල් වේ. එසේම වාර්ෂික වාර්තා හා මිලදී ගැනීමේ සැලැස්ම තුළින් සියලු මූල්‍ය වගකීම් නිසි පරිදි පියවීමට පහසුකම් සපයා ඇත.

## වෙළෙඳපොළ අවදානම

පොලී අනුපාතය සහ විදේශ විනිමය අනුපාතය වෙනස් වීම මත වෙළෙඳපොළ මිළ ගණන් වෙනස් වීම වෙළෙඳපොල අවදානම වේ. මෙමගින් ආයතනයේ ආදායම සහ එහි මූල්‍ය උපකරණ දරා සිටීමේ හැකියාවට බලපෑම් එල්ල වේ.

12.2.9 ඇමරිකානු ඩොලරයක ශ්‍රී ලංකානු රුපියල් වටිනාකමේ සිදුවන වෙනස්වීම් නිසා අප සමාගම විනිමය අනුපාත අවදානමට නිරාවරණය වේ.

## පොලී අවදානම

පොලී අවදානම වනුයේ ස්ථාවර පොලී අනුපාත යටතේ සිදු වූ ණය මිලදී ගැනීම් සඳහා වෙළෙඳපොළ පොලී අනුපාතය වෙනස්වීම සහ බැංකු තැන්පතු සඳහා පොලිය රඳවා තබාගැනීම පොලී අවදානම වේ.

## නියාමන අවදානම

පොහොර ආනයන, නිෂ්පාදනය, බෙදාහැරීම හා පරිභෝජනයට අදාළ රාජ්‍ය නියාමයන් වෙනස්වීම හා පොල් පර්යේෂණ ආයතනය, තේ පර්යේෂණ ආයතනය සහ රබර් පර්යේෂණ ආයතනය වැනි රාජ්‍ය ආයතන සිදු කරන නිර්දේශයන් මත, අප සමාගමට ඊට සරිලන ලෙස කටයුතු කිරීමට නියාමන බලයක් ඇත. සිදුවිය හැකි නියාමන වෙනස්කම් පූර්වයේ හඳුනාගැනීම සඳහා අප සමාගම ඉහත සඳහන් කළ රාජ්‍ය ආයතන හා එක්ව කටයුතු කරයි. කෙසේ වුවද අවදානම් සාධකයන් ඉහත සඳහන් කළ කරුණුවලට සීමා නොවන අතර අප සමාගම එහි මෙහෙයුම් සඳහා බලපෑ හැකි කවර ආකාරයේ අවදානමක් වුවද, ඒ පිළිබද සුපරීක්ෂාකාරීව කටයුතු කරයි.

# විගණන අවදානම් කළමනාකරණ කමිටු වාර්තාව

2016 මාර්තු 31 න් අවසන් වූ මූල්‍ය වර්ෂය තුළ අප කමිටුව අධ්‍යක්ෂ මණ්ඩලය නිර්දේශ කර ඇති වැඩ පාලන රීතීන්ට අනුකූලව කටයුතු කරන ලදි.

## කමිටුවේ සංයුතිය

මෙම කමිටුව පත් කරනු ලබන්නේ අධ්‍යක්ෂ මණ්ඩලය වන අතර එය සමන්විත වනුයේ විධායක නොවන අධ්‍යක්ෂවරුන් තිදෙනෙකුගෙන් සහ භාණ්ඩාගාරය නියෝජනය කරන නියෝජිතයකුය. මෙම භාණ්ඩාගාර නියෝජිතයා කමිටුවේ සභාපතිත්වය දරයි.

1. ජේ.එම්.එස්.ඩී. රත්නායක
   කමිටු සභාපති

2. අනෝජා හේරත්
   කමිටු සාමාජික

3. හේමක ලසිත් බාලසූරිය
   කමිටු සාමාජික

4. ආර්.පී. සුනන්දා පද්මිණි
   නිරීක්ෂක

5. පී.එල්. නාමසේන
   නිරීක්ෂක

## කමිටු රැස්වීම් සහ ඒවායේ සහභාගිත්වය

විගණන කමිටුව රාජකාරි කටයුතු සඳහා මෙම මූල්‍ය වසර තුළ තෙවරක් රැස් විය. ප්‍රධාන අභ්‍යන්තර විගණන නිලධාරියා මෙම කමිටුවේ කැඳවුම්කරු ලෙස කටයුතු කරන අතර කමිටුවේ ආරාධනා කිරීම මත සාමාන්‍යාධිකාරීතුමා, අදාළ ආයතන අංශ ප්‍රධානීන් හා අනෙකුත් නිලධාරීන් කමිටු රැස්වීම්වලට සහභාගි වී කමිටු සාමාජිකයින් හට අදාළ පැහැදිලි කිරීම් සිදු කරයි.

| දිනය | ජේ.එම්.එස්.ඩී. රත්නායක | අනෝජා හේරත් | හේමක ලසිත බාලසූරිය |
|---|---|---|---|
| 2015.05.15 | √ | √ | x |
| 2015.12.15 | √ | √ | √ |
| 2016.03.30 | √ | √ | √ |
| | 3/3 | 3/3 | 2/3 |

## කමිටුවේ රාජකාරීන්

1. ශ්‍රී ලංකාවේ හා ජාත්‍යන්තරව පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව තහවුරු කිරීම සහ ඒවායේ නිවරැදි බව හා සාධාරණතාව සමාලෝචනය කිරීම.

2. ආයතනයේ අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලත්වය තහවුරු කිරීම, තක්සේරු කිරීම හා සමාලෝචනය කිරීම

3. සමාගමේ අවදානම් කළමනාකරණ පද්ධතියේ ඵලදායිතාව සමාලෝචනය කිරීම.

4. බාහිර විගණකයන් සමග සාකච්ඡා කිරීම හා විගණකගේ කළමනාකරණ ලිපිය සමාලෝචනය කිරීම.

5. සමාගමේ ව්‍යවස්ථාව, රෙගුලාසි, නියාමනයන් හා චක්‍රලේඛවලට අනුකූලව සමාගම කටයුතු කරන බව තහවුරු කිරීම.

6. අභ්‍යන්තර හා බාහිර විගණන වාර්තා සමාලෝචනය කිරීම.

7. පොදු ව්‍යවසාය කමිටුවේ නිර්දේශ හා නියෝග ක්‍රියාත්මක කිරීම.

## වසරේ ක්‍රියාකාරකම්

බාහිර පාර්ශ්වයන් වෙත ලබාදෙන තොරතුරුවල නිරවද්‍යතාවය හා යථාකාරී බව තහවුරු කිරීමට පිහිටුවා ඇති මූල්‍ය තොරතුරු වාර්තාකරණ පද්ධතිය සමාලෝචනය කර, ශ්‍රී ලංකාවේ හා ජාත්‍යන්තරව පිළිගැනෙන ගිණුම්කරණ මූලධර්ම පිළිබඳ අවධානයට ලක් කරමින් කමිටුව විසින් සිය නිරීක්ෂණ ඉදිරිපත් කරන ලදී.

## අභ්‍යන්තරයේ විගණනය

ආයතනය සතුව මනාව සංවිධානය වූ අභ්‍යන්තර විගණන ඒකකයක් ඇති අතර එය නියෝජනය කරන්නේ විගණනය, මූල්‍ය, ගණකාධිකරණය, බදු ක්‍රමය හා ව්‍යාපාර පරිපාලනය වැනි විවිධ ක්ෂේත්‍රවල පළපුරුද්ද ඇති වෘත්තිකයන්ය.

## අභ්‍යන්තර විගණන කමිටුවේ මූලික අරමුණු

1. ගිණුම්කරණ හා අභ්‍යන්තර පාලන පද්ධතිය සමාලෝචනය කිරීම

2. මූල්‍ය හා මෙහෙයුම් තොරතුරු සියුම් පරීක්ෂාවට ලක් කිරීම.

3. මෙහෙයුම්වල ආර්ථිකමය තාර්කික බව, ඵලදායිතාව හා කාර්යක්ෂමතාව විශ්ලේෂණය කිරීම.

4. කළමනාකරුවන් හට පවරන ලද මෙහෙයුම් හා වැඩසටහන් පාලනයෙන් යුතුව පවතින බව තහවුරු කිරීම හා සාධාරණ තක්සේරුවක් තුළින් මෙහෙයුම් හා වැඩසටහන් සැලසුම් කළ පරිදි සිදුවන බව සහතික කිරීම සේම මෙහෙයුම් ප්‍රතිඵල සමාගමේ ස්ථාපිත අභිමතාර්ථ හා ඉලක්ක සමඟ සම්මුඛ වන බව තහවුරු කිරීම.

5. නීති රෙගුලාසීන් හා අනෙකුත් බාහිර බැඳීම් ආයතනයේ කළමනාකරණ ප්‍රතිපත්ති සමඟ සම්මුඛ වන බව තහවුරු කිරීම.

6. විශේෂ විමර්ශන සිදු කිරීම.

විගණන කමිටුව විසින් අභ්‍යන්තර විගණන සැලැස්ම, ප්‍රාදේශීය පොහොර ගබඩා සඳහා ඇති විගණන වැඩසටහන්, නියාමන අවදානම් තක්සේරු ක්‍රමවේදය හා අවදානම් මත පදනම් වූ විගණන සැලසුම් යන ඒවා කෙරෙහි අවධානය යොමු කරමින් අභ්‍යන්තර විගණන ක්‍රියාවලිය මෙම කාලපර්ජේදය තුළ අධීක්ෂණය කරන ලදී. මෙම වසර තුළ අභ්‍යන්තර විගණකගේ වාර්තා හා නිර්දේශයන් සලකා බැලීම සඳහා ඔහු සමඟ සාකච්ඡා පවත්වන ලදී.

ප්‍රාදේශීය පොහොර ගබඩා 52ක සහ ප්‍රධාන අංශ 9 ක අභ්‍යන්තර විගණන වාර්තා සමාලෝචනය කළ අතර එහිදී සමාගමේ සමස්ත අභ්‍යන්තර පාලන පද්ධතීන්ගේ සහ අභ්‍යන්තර විගණන ක්‍රියාවලියේ ප්‍රගතියක් නිරීක්ෂණය කරන ලදී.

සමාගමේ ප්‍රධාන අභ්‍යන්තර විගණන කෘෂිකර්ම අමාත්‍යංශයේ කාර්තුවකට වරක් පැවැති විගණන හා කළමනාකරණ රැස්වීමට සහභාගි වි වැදගත් කරුණු සාකච්ඡා කරන ලදි. සහනදායී පොහොර බෙදා හැරීමේදී සිදුවන වංචා හා දූෂණ පිළිබඳ තොරතුරු ලබාදීමට කැමැති මහජනතාව හා උනන්දුවක් දක්වන පාර්ශ්වවලින් රහස්‍යභාවය සුරැකිමින් අදාළ තොරතුරු  ලබා ගැනීම සඳහා තොරතුරු තාක්ෂණ විගණන ඒකකයක් පිහිටුවන ලදි. මෙම තොරතුරු තාක්‍ෂණ විගණන ඒකකය පිහිටු වීමට විගණකාධිපති දෙපාර්තමේන්තුව, නීතිපති දෙපාර්තමේන්තුව හා පොලිස් දෙපාර්තමේන්තුව ලබාදුන් සහයෝගය ඉතා අගය කරමි.

## බාහිර විගණනය

අප සමාගමේ බාහිර විගණක ලෙස විගණකාධිපති දෙපාර්තමේන්තුව කටයුතු කරයි.

## කමිටුවට ලැබුණු සහයෝගය

කමිටුවේ ක්‍රියාකාරීත්වය සඳහා බලාපොරොත්තු වූ සහාය කමිටු සභාපතිතුමාගෙන් හා කළමනාකරණ කමිටුවේ සාමාජිකයින්ගෙන් ලැබුණු අතර මෙම සහාය කමිටුවට ඵලදායී ලෙස මූල්‍ය වර්ෂය තුළ ක්‍රියාත්මක වීමට මහෝපකාරී විය.

## කමිටුව පිළිබඳ තක්සේරුව

කමිටුවේ වැඩ ක්‍රියාපිළිවෙල අධ්‍යක්‍ෂ මණ්ඩලය විසින් සමාලෝචනය කරන අතර ඔවුන්ගේ නිගමනය වූයේ කමිටුවේ වැඩපිළිවෙල ඵලදායී බවයි.

ඔබේ විශ්වාසී,

**ජේ.එම්.එස්.ඩී. රත්නායක**
සභාපති
විගණන හා අවදානම් කළමනාකරණ කමිටුව
2016 නොවැම්බර් 05

# අපගේ භූගෝලීය ආවරණය

**53** දීපව්‍යාප්ත පොහොර බෙදාහැරීම් ජාලය...

**උතුරු පළාත**
කොණ්ඩවිල්
කිළිනොච්චි
වරණි
ඕලුමඩු
මුරන්කන්

**උතුරු මැද පළාත**
පදවිය
මැදවච්චිය
හොරොව්පතාන
නොච්චියාගම
කිරලෝගම
හිඟුරක්ගොඩ
වැලිකන්ද
පොළොන්නරුව

**වයඹ පළාත**
ආණමඩුව
මහව
කුලියාපිටිය
කුරුණෑගල
නාත්තණ්ඩිය
පොල්ගහවෙල

**මධ්‍යම පළාත**
දඹුල්ල
නාගොල්ල
මාතලේ
ගම්පොළ
රිකිල්ලගස්කඩ
නුවරඑළිය

**නැගෙනහිර පළාත**
ත්‍රිකුණාමලය
කන්තලේ
මඩකලපුව
දෙහිඅත්තකණ්ඩිය
සමන්තුරෙයි
අම්පාර
පොතුවිල්

**බස්නාහිර පළාත**
හුණුපිටිය
දොඩංගොඩ
මතුගම
පැලවත්ත

**සබරගමුව පළාත**
කෑගල්ල
කුරුවිට
ඇඹිලිපිටිය

**ඌව පළාත**
මහියංගනය
බිබිල
බදුල්ල
වැලිමඩ
මොණරාගල
වැල්ලවාය

**දකුණු පළාත**
සූරියවැව
වීරවිල
දෙහිගහලන්ද
වීරකැටිය
බට-අත
මැදවියන්ගොඩ
අකුරැස්ස
කොග්ගල

## සීමාසහිත ලංකා පොහොර සමාගම

දීපව්‍යාප්ත පොහොර බෙදාහැරීම් ජාලය







# මූල්‍ය ප්‍රකාශන

2016.03.31 දිනෙන්
අවසන් වර්ෂය සඳහා
ලංකා පොහොර සමාගම

# අධ්‍යක්ෂවරුන්ගේ වගකීම පිළිබඳ ප්‍රකාශය

2007 අංක 07 දරන සමාගම් පනතේ අංක 150 (i) සහ 151 යටතේ එහි සඳහන් අවශ්‍යතා ප්‍රකාරව සෑම මූල්‍ය වසරකම සමාගමේ මූල්‍ය වසර අග පවතින කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ තොරතුරු ඉදිරිපත් කිරීම සේම මූල්‍ය වර්ෂයට අදාළ ලාබ අලාභ පිළිබඳ තොරතුරු ඉදිරිපත් කිරීම ද සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි.

එසේම වගන්ති අංක 148 යටතේ විධිමත් ගිණුම්කරණ සටහන් පවත්වාගෙන ගොස් ආයතනික මූල්‍ය තත්ත්වය සාධනීය නිරවද්‍යතාවයකින් යුතුව අනාවරණය කර ගැනීම, මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සහ එම ප්‍රකාශන හරියාකාරව හා යුහුසුලුව විගණනයට ලක් කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීමකි.

අධ්‍යක්ෂ මණ්ඩලය ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල අඛණ්ඩතාව හා වාස්තවිකත්වය පිළිබඳ වගකීම දරයි. මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී යෝග්‍ය ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරාගෙන ඒවා අඛණ්ඩව උපයෝගී කර ගත් බවට හා ගනුදෙනු සිදු වූ මාධ්‍යය හා ඒවායේ යථා ස්වරූපය පිළිබිඹු වන පරිදි සාධාරණ හා විචක්ෂණ විනිශ්චයන්ට එළඹ කටයුතු කළ බවට අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

එසේම ඔවුන් තහවුරු කරනවා ගිණුම් ප්‍රකාශ පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් (SLFRS) සහ 2007 අංක 07 දරන සමාගම් පනතට අනුකූලව බවට. තවදුරටත් සමාගම් පනත ප්‍රකාරව නිරාවරණය කළ යුතු සියලු තොරතුරු මූල්‍ය ප්‍රකාශන තුළ ඇතුළත් වේ.

අධ්‍යක්ෂ මණ්ඩලය සමාගම පිළිබඳව ඔවුන්ගේ දැනුම, සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරිත්වය පිළිබඳ දැනුම සහ නිශ්චිත විපරම් පදනම්කොට ගෙන ප්‍රකාශ කරන්නේ ඉදිරි වසර තුළ සමාගම පවත්වාගෙන යාමට අවශ්‍ය සම්පත් ප්‍රමාණවත්ව පවතින බවය. එසේම මූල්‍ය ප්‍රකාශ පිළියෙළකොට ඇත්තේ මෙම පදනම මතය.

අධ්‍යක්ෂවරු ආයතනයේ වත්කම් ආරක්ෂා කිරීමට අවශ්‍ය සාධාරණ ක්‍රියාමාර්ග ගෙන ඇති අතර මේ සන්දර්භය තුළ වංචාවන් සහ අනෙකුත් අක්‍රමිකතාවන් අනාවරණය කර ගැනීම අරමුණුකොට ඔවුන් විසින් සුදුසු අභ්‍යන්තර පාලන පද්ධතීන් ද පිහිටුවා ඇත. සමාගම් පනතේ ඡේද 56 (2) යටතේ අධ්‍යක්ෂ මණ්ඩල විසින් දැනට ගෙවීමට යෝජනා කර ඇති ලාභාංශ ගෙවීම් අනුමත කර ඇත. සමාගම් පනතේ 57 ඡේදය ප්‍රකාරව මෙම ලාභාංශ ගෙවීමෙන් පසු සමාගමේ වගකීම් පියවීමේ හැකියාව පිළිබඳ කෙරෙන පරීක්ෂණයකින් සමත් වන බව අධ්‍යක්ෂ මණ්ඩලය එයට ලද තොරතුරු මත පදනම්ව සෑහීමකට පත් විණි. මේ ප්‍රකාරව දැනට යෝජිත ලාභාංශ පදනම්ව නුබුන්වත්භාවය පිළිබඳව සහතිකයක් විගණන නිලධාරීන්ගෙන් ඉල්ලා සිටීමට අධ්‍යක්ෂ මණ්ඩලය කටයුතු කළාය.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 19 වන සංශෝධනය ප්‍රකාරව, ලක් පොහොර සමාගම විගණනයට බලය හිමි විගණකාධිපති හට මූල්‍ය ප්‍රකාශන පිළිබඳ ඔහුගේ මතය ගොඩනඟාගැනීම සඳහා ඔහුට සුදුසු යැයි හැඟෙන පරීක්ෂාවන් කිරීමට අවශ්‍ය සියලු ඉඩහසර ලබා දීමට කටයුතු කළේය.

## අනුකූලතා වාර්තාව

ශ්‍රී ලංකා රජය හා සමාගමේ සේවකයන් ප්‍රකාර සමාගමට ඇති ව්‍යවස්ථාපිත ගෙවීම් සමාගම විසින් ශේෂපත්‍ර දිනට පිය වූ බවට හෝ අවශ්‍ය ආකාරයට වෙන් කිරීම් සිදු කර ඇති බවට අධ්‍යක්ෂ මණ්ඩලය තහවුරු කරයි.

**රෝෂන වඩුගේ**
සභාපති
ලක් පොහොර සමාගම
2016 ජුනි 29

# සභාපතිතුමාගේ සහ මූල්‍ය කළමනාකරුගේ වගකීම පිළිබඳ ප්‍රකාශය

ලංකා පොහොර සමාගමේ 2016 මාර්තු 31 දිනැති මූල්‍ය ප්‍රකාශන පිළියෙලකොට ඉදිරිපත් කරන ලද්දේ පහත අවශ්‍යතාවයන් මතය.

- ශ්‍රී ලංකා වරලත් ගණකාධිකරණ සංගමය විසින් නිකුත් කරන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්
- 2007 අංක 07 දරන සමාගම් පනත
- භාණ්ඩාගාරය විසින් නිකුත් කරන ලද ප්‍රශස්තම ආයතනික යහ පාලන පරිචයන් සංග්‍රහය

මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්හි විස්තර කර ඇති පරිදි භාවිතා කළ විශේෂ ගිණුම්කරණ ප්‍රතිපත්තීන් සුදුසු ඒවා බවට හා ඒවා අඛණ්ඩව භාවිතා කළ බවට අපි තහවුරු කරමු.  නියම කරන ලද ගිණුම්කරණ ප්‍රමිතීන්ගෙන් අපගමණය නොවී ඒවා නිසි පරිදි යොදා ගත්තේය. සුවිශේෂී ආකාරයේ විනිශ්චයකට බඳුන්වන හා සංකීර්ණ බවින් යුතු ගිණුම්කරණ ප්‍රතිපත්තීන් හා ඇස්තමේන්තුගත කිරීම් පිළිබඳ විගණන කමිටුව හා විගණකාධිපති සමග සාකච්ඡා කරන ලදී.

අපගේ වත්කම් සුරක්ෂිත කිරීමට, වංචාවන් වැළැක්වීමට සහ අනාවරණය කර ගැනීමට සහ අනෙකුත් අක්‍රමිකතා හඳුනාගැනීමට අප විසින් අභ්‍යන්තර පාලන පද්ධතීන් සහ ගිණුම්කරණ සටහන් තැබීමේදී සුදුසු හා ප්‍රමාණවත් සැලකිල්ලක් දක්වන ලදී. මෙම පද්ධතීන් නිසි පරිදි සමාලෝචනය කර, ඇගයීමකට ලක්කොට නිරන්තරයෙන් යාවත්කාලීන කරන ලදි. කලින් කලට සිදු කරන ලද අභ්‍යන්තර විගණන ඔස්සේ ආයතනයේ ප්‍රතිපත්ති හා ක්‍රියාවලීන් අනුගමනය කරන බවට සාධාරණ විනිශ්චයකට එළඹීමට හැකි විය. එසේ වුව ද ඕනෑම අභ්‍යන්තර පාලන පද්ධතියක සහ ගිණුම්කරණ පද්ධතියක් මගින් ලබා දෙන සහතිකයක අන්තර්ගත සීමාවන් පිළිබඳ හඳුනාගැනීම සිදු කළ යුතුය.

විගණන කමිටුව අභ්‍යන්තර විගණකයෙන් හා ස්වාධීන විගණකයෙන් කලින් කලට හමු වී විගණනයන්ගේ ඵලදායිතාව සමාලෝචනය කිරීම, විගණන ක්‍රියාවලිය සාකච්ඡා කිරීම හා අභ්‍යන්තර පාලන හා මූල්‍ය වාර්තාකරණ ගැටලු සාකච්ඡා කිරීම සිදු කළේය. අවශ්‍ය ඕනෑම වැදගත් කරුණක් පිළිබඳ සාකච්ඡා කිරීමට විගණකාධිපතිට හා අභ්‍යන්තර විගණකයින්ට විගණන කමිටුව හා සම්බන්ධ වීමේ පූර්ණ පහසුකම් හා ඉඩහසර ඇත.

මූල්‍ය ප්‍රකාශන විගණනයට ලක් කරන්නේ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ විගණකාධිපති විසිනි.

**රෝෂන වඩුගේ**
සභාපති

**ප්‍රියන්ත සමරවීර**
මූල්‍ය කළමනාකරු
2016 ජුනි 29

විගණකාධිපති දෙපාර්තමේන්තුව
கணக்காய்வாளர் தலைமை அதிபதி திணைக்களம்
AUDITOR GENERAL'S DEPARTMENT

ඒජීඑල්/සී/සීඑෆ්සී/1/15/එෆ්ඒ

සභාපති
සීමාසහිත ලංකා පොහොර සමාගම

# සීමාසහිත ලංකා පොහොර සමාගමේ 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ විගණකාධිපති වාර්තාව

සීමාසහිත ලංකා පොහොර සමාගමේ 2016 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරු වල සාරාංශයකින් සමන්විත 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. සමාගමේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. සමාගමේ සභාපති වෙත විස්තරාත්මක වාර්තාවක් 2016 අගෝස්තු 26 දින නිකුත් කරන ලදී.

## 1.2 සමාගම පිහිටුවීම

1957 අංක 49 දරන රාජ්‍ය කාර්මික සංස්ථා පනත යටතේ 1964 වර්ෂයේදී ජර්මන් සමූහාණ්ඩුවේ මූල්‍ය හා තාක්ෂණික දායකත්වය සහිතව ලංකා පොහොර සංස්ථාව ස්ථාපනය කරන ලදී. 1987 අංක 23 දරන රජයට පවරාගත් ආයතන පොදු සමාගම් බවට පත්කිරීමේ පනතට අනුකූලව 1992 සැප්තැම්බර් 15 සිට බලපැවැත්වෙන පරිදි සීමාසහිත ලංකා පොහොර සමාගම නමින් යලි ස්ථාපනය කරන ලද අතර වර්තමානයේ 2007 අංක 07 දරණ සමාගම් පනත යටතේ ලියාපදිංචි කර පවත්වාගෙන යනු ලබයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.4 විගණකගේ වගකීම

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිති වලට (ISSAI 1000 - 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි. මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පටිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පටිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුලත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ.

එම අවදානම් තක්සේරු කිරීම් වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට

අංක 306/72, පොල්දුව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව, . - இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. - No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka
+94-11-2887028-34 +94-11-2887223 oaggov@sltnet.lk www.auditorgeneral.gov.lk

අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.5 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, 2016 මාර්තු 31 දිනට සීමාසහිත ලංකා පොහොර සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති

ප්‍රමිති අංක 16 ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීවිතකාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.78,606,015 ක් වූ වත්කම් සම්පූර්ණයෙන් ක්ෂයකර ඇතත් තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තුගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 8 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ස්ථාවර තැන්පත් හා භාණ්ඩාගාර බිල්පත්වල පොලී ආදායම රු.164,141,923 ක් වුවද මූල්‍ය ප්‍රකාශන අනුව රු.167,801,299 ක් ලෙස දැක්වීම හේතුවෙන් රු.3,659,376 කින් පොලී ආදායම් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) 2016 මාර්තු 31 දිනට ස්ථාවර තැන්පත්වල වටිනාකම රු.3,042,587,476 ක් වුවද ඉදිරිපත් කල මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය අනුව රු.3,046,991,327 ක් ලෙස දැක්වීමෙන් රු.4,403,851 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) ණයවර ලිපි පියවීම වෙනුවෙන් 2013 හා 2014 වර්ෂවලදී ලබාගන්නා ලද රු.21,366,705,534 ක්වූ දිගු කාලීන ණය ජංගම වගකීම් යටතේ දක්වා තිබුණි.

#### 2.2.3 පැහැදිලි නොකළ වෙනස්කම්

(අ) තක්සේරු ආදායම් යටතේ ස්ථාවර තැන්පතු සඳහා ලද පොළී ආදායම රු.125,399,320ක් ලෙස දක්වා තිබුණද සත්‍ය වශයෙන් ලද පොළිය රු.120,995,571ක් වුයෙන් රු.4,403,749 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ආ) තක්සේරු ආදායම් යටතේ භාණ්ඩාගාර බිල්පත් සඳහා ලද පොළී ආදායම රු.29,361,028 ක් ලෙස දක්වා තිබුණද සත්‍ය වශයෙන් ලද පොළී ආදායම රු.29,022,874ක් වූයෙන් රු.338,154 ක වෙනසක් නිරීක්ෂණය විය.

(ඇ) බදු බැර යටතේ කල්පිත බදු වටිනාකම රු.3,307,720 ලෙස දක්වා තිබුණද එම අගය රු.3,224,764 ක් වුයෙන් රු.82,956 ක වෙනසක් නිරීක්ෂණය විය.

### 2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ආයතන තුනකින් ලැබිය යුතු ශේෂ ලෙස ගිණුම්වල දැක්වෙන රු.86,408,870 ක් වර්ෂ 10 කට වැඩි කාලයක සිට අය නොවී පැවතුණි.

(ආ) කොළඹ කටුනායක අධිවේගී මාර්ග ව්‍යාපෘතිය සඳහා අත්පත් කරගත් පර්චස් 28 ක ඉඩම් කොටස වෙනුවෙන් හිමිකම ඉදිරිපත් නොකිරීම නිසා අයවිය යුතු රු.12,600,000ක වන්දි මුදල ලබා ගැනීමට නොහැකිවී තිබුණි.

## 2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීමේ අවස්ථා නිරීක්ෂණය විය.

| නීති රීති, රෙගුලාසි හා කළමණාකරන තීරණවලට යොමුව | අනුකූල නොවීම් |
|---|---|
| (අ) 2011 පෙබරවාරි 11 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 57 හා 2015 ජනවාරි 31 දිනැති ජාතික අයවැය චක්‍රලේඛ අංක 2/2015 හි 08 ඡේදය | විවිධ ප්‍රචාරණ හා අනුග්‍රාහක වියදම් වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේදී රු.2,521,000 ක් අරමුණුවලට පටහැනිව දරා තිබුණි. |
| (ආ) 2012 ජනවාරි 12 දිනැති අංක 11/2360/549/034 දරන අමාත්‍ය මණ්ඩල තීරණය | ප්‍රාදේශීය ගබඩා වෙත පොහොර ප්‍රවාහන ගාස්තු තීරණය කිරීමේ ක්‍රමවේදයක් සකස් කල යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි. 2009 මාර්තු 25 දින අමාත්‍යාංශ ප්‍රසම්පාදන මණ්ඩලය තීරණය කර තිබූ මිල ගණන්, වරින් වර ප්‍රවාහන මිල ගණන් සංශෝධනය කිරීමේ කමිටුවේ නිර්දේශ සභාපති විසින් අනුමත කිරීමෙන් පසු කොන්ත්‍රාත් පිරිනමා තිබූ අතර වසර 7 ක් ගතවී තිබුණද අමාත්‍යාංශ ප්‍රසම්පාදන මණ්ඩලයේ තීරණ ලබාගෙන මිල ගණන් සංශෝධනය කර නොතිබුණි. |
| (ඇ) 2015 මැයි 25 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛ අංක 02/2015 හි 02 ඡේදය | ක්‍රියාකාරී අධ්‍යක්ෂකවරයෙකුට ගෙවිය හැකි උපරිම මාසික දුරකථන ගාස්තුව බදු ඇතුලත්ව රු.10,000 ක් වුවද සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂකට රු.12,000 බැගින් මාසික දුරකථන ගාස්තු ගෙවා තිබුණි. |
| (ඈ) 1958 අංක 15 දරන සේවක අර්ථ සාධක අරමුදල පනතේ 47 වන වගන්තිය | සමාලෝචිත වර්ෂයේ සේවක අර්ථසාධක අරමුදල් ලෙස රු.28,999,236ක මුදලක් ගෙවා ඇති අතර, ඉපයීම් ගණයට ඇතුලත් නොවන අන්තර් දීමනා හා විශේෂ දීමනා ඇතුලත්ව සේවක අර්ථ සාධක අරමුදල් ගෙවා තිබුණි. |

## 2.5 අධිකාරී බලය නොලත් ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ අවස්ථා 05 කදී අනුග්‍රහ හා අධාර වශයෙන් රු.300,000ක් අධ්‍යක්ෂ මණ්ඩලයේ අනුමැතිය ලබා නොගෙන වැය කර තිබුණි.

(ආ) සමාගම සතු ජීප් රථ 03 ක් හා ඩබල් කැබ් රථ 03 ක් සංචිතයේ තිබියදී, සමාගමේ ක්‍රියාකාරී අධ්‍යක්ෂකවරයෙකු සඳහා රු.95,000 ක මාසික කුලියට හයිබ්‍රිඩ් මෝටර් රථයක් ලබාගෙන තිබුණු අතර ඒ සඳහා සමාලෝචිත වර්ෂයේදී රු.1,485,813ක් වැයකර තිබුණි.

# 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් කටයුතුවලින් රු.836,604,005ක බදු පෙර ලාභයක් වූ අතර ඊට අනුරූපිව ඉකුත් වර්ෂයේ බදු පෙර ලාභය රු.520,200,738 ක් වීමෙන් ඉකුත් වර්ෂය හා සැසඳීමේදී සමාලෝචිත වර්ෂයහි බදු පෙර ලාභයෙහි රු.316,403,267ක වැඩි වීමක් නිරීක්ෂණය විය. ආදායම රු.406,779,899 කින් වැඩි වීම හා බෙදා හැරීමේ පිරිවැය රු.43,695,688 කින් අඩුවීම මේ සඳහා ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහකිරීමේදී 2011/2012 වර්ෂයේ රු.159,544,495ක්ව පැවති අතිරික්තය 2015/2016 වර්ෂය වනවිට රු.836,604,005 ක් දක්වා අඛණ්ඩව වර්ධනය වී ඇති බව නිරීක්ෂණය විය.

සේවක පාරිශ්‍රමික, ක්ෂය වෙන්කිරීම් හා රජයට ගෙවූ බදු සැළකිල්ලට ගැනීමේදී 2011/2012 වර්ෂයේ රු.281,337,813 ක් වූ සමාගම් දායකත්වය 2015/2016 වර්ෂය වනවිට රු.1,172,751,116 දක්වා අඛණ්ඩව වර්ධනය වී තිබුණි.

# 4 මෙහෙයුම් සමාලෝචනය

## 4.1 කාර්ය සාධනය

රාජ්‍ය ප්‍රතිපත්තිවලට අනුකූලව ශ්‍රී ලංකා කෘෂිකර්ම හා ගොවිජන සේවා ක්ෂේත්‍රයේ ආදායම් හා ලාභදායීත්වය වැඩිකිරීම සඳහා බහුවිධ වෙළඳපොළ ඉල්ලුමට සරිලන පොහොර නිෂ්පාදනය හා අලෙවිය තුලින් සමාගමේ ලාභදායී තිරසාර පැවැත්ම තහවුරු කිරීමේ මෙහෙවර යටතේ සීමාසහිත ලංකා පොහොර සමාගම ස්ථාපනය කරන ලදී.

## 4.2 කළමණාකරන ක්‍රියාකාරකම්

(අ) බදු කුලී ගෙවනු ලබන ගබඩා 8 න් 3 ක ගිවිසුම් කාලය අවසන් වී මාස 3 ඉක්මවා තිබුණද නව බදු ගිවිසුම්වලට එළඹී නොතිබූ අතර ප්‍රාදේශීය ගබඩා 4 ක බදු ගිවිසුම් ලියාපදිංචි කර නොතිබුණි. අයිතිය තහවුරු නොවූ ස්ථාන 13 ක පොහොර ගබඩා පවත්වාගෙන යනු ලබන අතර එම ගොඩනැඟිලි භාවිතා කිරීම සම්බන්ධයෙන් බදු ගිවිසුම්වලට එළඹීමට කටයුතු කර නොතිබුණි.

(ආ) විධිමත් මුල්‍ය කළමනාකරණයක් නොමැතිවීම හේතුවෙන් මහජන බැංකුවේ පවත්වාගෙන යන ජංගම ගිණුමේ බැංකු අයිරා ලබාගැනීම හේතුවෙන් සමාලෝචිත වර්ෂය තුල රු.1,726,619 ක මුදලක් අයිරා පොළී වශයෙන් ගෙවා තිබුණි.

## 4.3 මෙහෙයුම් ක්‍රියාකාරකම්

සමාගමේ පොහොර ගබඩා වල මෙ.ටො. 676.48 ක් වූ පොහොර වර්ග 38 ක් පමණ චලනය නොවී පවතින අතර රු.2,014,431 ක වටිනාකම වූ මෙම පොහොර තොගය සඳහා වෙන්කර ඇති ඉඩකඩද නිශ්ක්‍රිය බව නිරීක්ෂණය විය.

## 4.4 හානි හා පාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේදී මාදම්පිටියේ ප්‍රාදේශිය ගබඩාවේ තොග ඌනතාවය නිසා සිදුවූ රු.2,382,510 ක අලාභයෙන් තවදුරටත් අයකර ගතයුතුව තිබුණු රු.714,753 ක් අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) 2015 වර්ෂයේදී පැලවත්ත ප්‍රාදේශිය පොහොර ගබඩාවේ සිදු වූ තොග ඌනතාවයක් හේතුවෙන් සමාගමට රු.336,772 ක අලාභයක් සිදුවී තිබුණු අතර මෙයින් රු.104,940 ක් තොග නිලධාරි විසින් සමාගමට ගෙවා තිබුණි. මෙම නිලධාරියාගෙන් තවදුරටත් රු.231,832 ක මුදලක් අයවිය යුතුව තිබියදී ත්‍රිකුණාමලය ප්‍රාදේශිය ගබඩාවේ තොග නිලධාරි ලෙස සේවයේ යොදවා තිබුණු අතර, මේ සම්බන්ධයෙන් 2015 දෙසැම්බර් 14 දින චෝදනා පත්‍ර යවා තිබුණද 2016 ජුලි 08 දින වන විටත් පරීක්ෂණ අවසන්කර නොතිබුණි.

(ඇ) පොතුවිල් පොහොර ගබඩාවේ තොග නිලධාරි විසින් පොහොර අලෙවියෙන් ලද මුදල් රු.21,382,468 ක මුදලක් බැංකුගත නොකිරීම සහ තොග ඌණතාවයන් සිදු කිරීම හේතුවෙන් සමාගමට සිදුකර තිබුණු රු.15,629,218 ක අලාභය අයකර ගැනීම සඳහා 2016 ජුලි 08 වන දින වනවිටත් නීතිමය පියවර ගෙන නොතිබුණි.

## 4.5 නිශ්ක්‍රිය හා ඌණ උපයෝජිත වත්කම්

කෘෂිකර්ම අමාත්‍යාංශය විසින් ලබාදෙන ලද රු.17,617,653 ක් වටිනා රසායනාගාර උපකරණ හා සුදුසුකම්ලත් කාර්ය මණ්ඩලයකින් සමන්විත ප්‍රතීතික මට්ටමේ රසායනාගාරයක් සමාගම සතු වුවද පොහොර ලේකම් කාර්යාලය විසින් වැඩිපුර ගාස්තු ගෙවමින් බාහිර ආයතනවලින් පොහොර සාම්පල් තත්ත්ව පරීක්ෂාවන් සිදුකරමින් පැවතුන බැවින්, මෙම වත්කම් නිශ්ක්‍රියව පැවතුණි.

## 4.6 කොන්ත්‍රාත් පරිපාලනයේ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 වර්ෂයේදී නුවර එළිය සංචාරක බංගලාව ඉදිකිරීම සඳහා රු.27,998,598 ක ඇස්තමේන්තු අනුමත කරගෙන තිබුණු අතර ඇස්තමේන්තු මුදල ඉක්මවා අතිරේක වැඩ සඳහා රු.1,474,655 ක් ගෙවා තිබුණ නමුත් ඒ සඳහා ප්‍රසම්පාදන කමිටුවේ අනුමැතියක් ලබා ගෙන නොතිබුණි. රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.12.2 ඡේදය ප්‍රකාරව උපදේශක සමාගමෙන් වැඩ අවසන් කිරීම පිළිබඳ සහතිකයක් ලබාගත යුතු වුවත් ඒ අනුවද කටයුතු කර නොතිබුණි.

(ආ) සමාගමේ ප්‍රධාන කාර්යාල පරිශ්‍රයේ පාරවල් තාර දැමීම සඳහා කොන්ත්‍රාත්කරුවෙකු සමඟ ගිවිසුමකට එළඹ බැංකු බැඳුම්කරයක් මත රු.8,859,708 ක වැඩ ආරම්භ කිරීමේ අත්තිකාරමක් ගෙවා තිබුණි. පසුව කොන්ත්‍රාත්කරු වැඩ නවතා තිබූ අතර බැංකු බැඳුම්කරයේ වලංගු කාල සීමාව තුල ගෙවූ මුදල් ආපසු ලබා ගැනීමට සමාගම අපොහොසත් වී තිබුණි.

## 4.7 දෘශ්‍ය අක්‍රමිකතා

දිස්ත්‍රික් ගබඩාවලට පොහොර බෙදාහැරීමේ කටයුතු සම්බන්ධීකරණය සඳහා සේවකයින් යෙදවූ බවට සාවද්‍ය ලේඛන ඉදිරිපත් කොට රු.1,324,674 ක මුදලක් ගෙවා තිබුණු අතර, එම සාවද්‍ය පැමිණීමේ හා පිටවීමේ ලේඛන සමාගමේ නිලධාරියෙකු විසින් සකස් කර ඉදිරිපත් කර තිබුණි. මෙම නිලධාරීන්ට එරෙහිව විනය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

## 4.8 කාර්ය මණ්ඩල පරිපාලනය

පහත නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) i) සමාගම කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව විසින් අනුමත කරන ලද සීමාවන් ඉක්මවා සේවකයින් 63 දෙනෙකු සේවයේ යොදවා තිබුණු බව නිරීක්ෂණය විය.

ii) සමාගමේ පරිපාලන කටයුතු සහ සේවක පරිපාලනය සම්බන්ධයෙන් සමාගම විසින්

සකස් කළ සේවක මණ්ඩල කාර්ය පටිපාටියේ නොමැති රීති මාලාවක් ක්‍රියාත්මක කිරීමට 2014 අගෝස්තු 28 දින පැවති සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීමේදී තීරණයකර තිබුණද ඒ සඳහා භාණ්ඩාගාර අනුමැතිය ලබාගෙන නොතිබුණි. රාජකාරි දිනයන්, වේලාවන්, අතිකාල ගෙවීම්, නිවාඩු හා දීමනා ලබාදීම සම්බන්ධයෙන් කරන ලද පරීක්ෂාවේදී සමාගමට අදාල වන සාප්පු හා කාර්යාල සේවක පනත ඉක්මවා කටයුතු කර තිබූ අවස්ථා නිරීක්ෂණය විය.

## 4.9 වෙනත් රාජ්‍ය ආයතන වෙත ලබාදුන් සමාගමේ සම්පත්

සමාගමෙන් වැටුප් ලබන බෙදාහැරීම් අංශයේ කම්කරුවකු 2016 ජනවාරි 01 දින සිට ජනාධිපති මන්දිරයේ රාජකාරි සඳහා යොදවා තිබුණද ඒ සඳහා විධිමත් අනුමැතියක් ලැබී නොතිබුණි.

## 5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය

### 5.1 වාර්ෂික වාර්තා

2002 මැයි 24 දිනැති අංක PF/PE/21 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව 2015/2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සමඟ කෙටුම්පත් වාර්ෂික වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි.

### 5.2 අයවැය පාලනය

සමාලෝචිත වර්ෂයේ අයවැය ගත අයිතම 79 ක තථ්‍ය ආදායම සහ වියදම්වල සියයට 23 සිට සියයට 1654 දක්වා විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලන

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින් වර සමාගමේ සභාපතිවරයා වෙත යොමුකරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|
| (අ) මූල්‍ය පාලනය | සමාගමේ අරමුණු ඉටුවන ආකාරයේ වියදම් දැරීමට හා ලිඛිත සාක්ෂි වලින් ගෙවීම් තහවුරු කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |
| (ආ) කාර්ය මණ්ඩල පරිපාලනය | විධිමත් කාර්ය පටිපාටි සංග්‍රහයක් භාණ්ඩාගාරය මගින් අනුමත කරගෙන නොතිබුණු අතර සාප්පු හා කාර්යාල සේවක පනත, ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසි වලට අනුකූල නොවන අයුරු කටයුතු කර තිබුණු අවස්ථා නිරීක්ෂණය විය. |
| (ඇ) කොන්ත්‍රාත් පාලනය | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයෙන් බැහැරව කටයුතු කල අවස්ථා නිරීක්ෂණය විය. |
| (ඈ) ගබඩා පාලනය | (i) ප්‍රාදේශීය ගබඩා වෙත පොහොර ප්‍රවාහනය සඳහා ක්‍රමවේදයක් සකස් කර නොතිබුණි.<br>(ii) බදු කුලී පදනමට ලබා ගත් ප්‍රාදේශීය ගබඩා සඳහා අදාල ගිවිසුම්වලට එළඹ නොතිබුණි.<br>(iii) ප්‍රාදේශීය පොහොර ගබඩාවල තොග හා මූල්‍ය තත්ත්වයන් පවත්වා ගැනීම සඳහා අභ්‍යන්තර පාලනයක් ක්‍රියාත්මක කර නොතිබුණි. |

**එච්.එම්. ගාමිණී විජේසිංහ**
විගණකාධිපති
2016 දෙසැම්බර් 22

ප්‍රකාශ කිරීම ශ්‍රී ලංකා රුපියල් වලිනි

| | සටහන් | 2016 | 2015 |
|---|---|---|---|
| අයභාරය | 3 | 4,242,769,733 | 3,835,989,834 |
| විකුණුම් පිරිවැය | 4 | (3,145,321,810) | (2,980,431,667) |
| **දළ ලාභය** | | **1,097,447,923** | **855,558,167** |
| අනෙකුත් මෙහෙයුම් ආදායම් | 5 | 122,926,594 | 142,197,667 |
| පරිපාලන වියදම් | 6 | (539,859,112) | (502,180,495) |
| බෙදාහැරීමේ වියදම් | 7 | (11,712,957) | (55,408,645) |
| **මෙහෙයුම් ලාභය** | | **668,802,448** | **440,166,694** |
| ශුද්ධ මූල්‍ය ආදායම | 8 | 169,528,176 | 110,255,269 |
| **මූල්‍ය වියදම්** | 8 | (1,726,619) | (30,221,225) |
| බදු පෙර ලාභය | | **836,604,005** | **520,200,738** |
| ආදායම් බදු | 9 | (233,331,176) | (134,185,932) |
| **වර්ෂය සඳහා ලාභය** | | **603,272,829** | **386,014,806** |
| වෙනත් විස්තීර්ණ ආදායම් | | - | - |
| **වර්ෂය සඳහා සමස්ත ආදායම** | | **603,272,829** | **386,014,806** |
| **කොටසක මූලික ඉපයුම** | **10.1** | **12.01** | **7.68** |
| **ලාභාංශ ඉපයුම** | **10.2** | **3.60** | **2.30** |

වරහන් තුල අගයන් වලින් අඩු කිරීම් පෙන්නුම් කෙරේ
අංක 74 සිට 97 දක්වා පිටුවල දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශවල සංකලික කොටසක් වශයෙන් සැලකිය යුතුය.

# සී/ස ලංකා පොහොර සමාගම
## 2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා
## මූල්‍ය තත්ත්ව ප්‍රකාශය

ප්‍රකාශ කිරිම ශ්‍රී ලංකා රුපියල් වලිනි

| | සටහන් | 2016 | 2015 |
|---|---|---|---|
| **වත්කම්** | | | |
| **ජංගම නොවන වත්කම්** | | | |
| දේපල පිරියත හා උපකරණ | 11 | 1,838,655,988 | 1,865,055,224 |
| නොනිමි වැඩ | 12 | 32,152,294 | 29,982,586 |
| අස්පෘශ වත්කම් | 13 | 79,667 | 115,417 |
| **මුළු ජංගම නොවන වත්කම්** | | **1,870,887,948** | **1,895,153,227** |
| **ජංගම වත්කම්** | | | |
| තොගය | 14 | 251,765,999 | 495,391,114 |
| වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 15 | 30,855,598,803 | 39,729,774,663 |
| සේවක ණය හා අත්තිකාරම් | 16 | 46,209,130 | 33,861,873 |
| කල් පිරිම සඳහා පවත්වාගෙන යන ආයෝජන | 17 | 514,903,604 | 489,125,747 |
| අනෙකුත් මූල්‍ය වත්කම් | 18 | 3,046,991,327 | 1,833,364,544 |
| මුදල් හා මුදල් සමාන දෑ | 19 | 17,002,525 | 72,927,049 |
| **මුළු ජංගම වත්කම්** | | **34,732,471,389** | **42,654,444,990** |
| **මුළු වත්කම්** | | **36,603,359,337** | **44,549,598,216** |
| **හිමිකම් සහ වගකීම්** | | | |
| **හිමිකම්** | | | |
| ප්‍රකාශිත ප්‍රග්ධනය | 20 | 502,456,080 | 502,456,080 |
| ප්‍රත්‍යගණන සංචිත | 21 | 1,833,071,080 | 1,833,071,080 |
| රඳවා ගත් ලාභ | | 2,392,840,203 | 1,869,914,195 |
| **මුළු හිමිකම්** | | **4,728,367,363** | **4,205,441,355** |
| **ජංගම නොවන වගකීම්** | | | |
| සේවක පාරිතෝෂිත බැඳීම | 22 | 61,731,050 | 50,189,133 |
| රාජ්‍ය පදාන | 23 | 2,889,117 | 12,941,616 |
| විලම්භිත බදු | 24 | 40,928,542 | 44,132,427 |
| **මුළු ජංගම නොවන වගකීම්** | | **105,548,709** | **107,263,176** |
| **ජංගම වගකීම්** | | | |
| වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | 25 | 3,799,678,633 | 8,587,796,896 |
| ගෙවිය යුතු ණය | 26 | 27,460,439,996 | 31,304,325,268 |
| තැන්පතු හා අත්තිකාරම් ලැබීම් | 27 | 142,371,790 | 164,340,003 |
| බදු වගකීම් | 28 | 180,984,083 | 53,690,008 |
| උපචිත වියදම් හා වෙන්කිරීම් | 29 | 164,200,505 | 120,185,335 |
| බැංකු අයිරා | 19 | 21,768,258 | 6,556,178 |
| **මුළු ජංගම වගකීම්** | | **31,769,443,265** | **40,236,893,688** |
| **මුළු හිමිකම් හා වගකීම්** | | **36,603,359,337** | **44,549,598,219** |
| | | | |
| **කොටසක ශුද්ධ වත්කම් අගය** | | **94.11** | **83.70** |

සමාගමෙහි මෙම මූල්‍ය ප්‍රකාශණ කට්ටලය 2007 අංක 7 දරණ සමාගම් පනතෙහි අවශ්‍යතාවයන්ට අනුරූපව පිළියෙල කර ඇති බවට මම සහතික කරමි

මූල්‍ය කළමණාකරු

අධ්‍යක්ෂක මණ්ඩලය මෙම මූල්‍ය පකාශණ පිළියෙල කිරිම හා ඉදිරිපත් සම්බන්ධයෙන් වගකීමට බැදේ.
අධ්‍යක්ෂක මණ්ඩලය වෙනුවට අනුමත කර අත්සන් කළේ

සභාපති

අධ්‍යක්ෂක

වරහන් තුල අගයන් වලින් අඩු කිරීම් පෙන්නුම් කෙරේ
අංක 74 සිට 97 දක්වා පිටුවල දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශවල සංකලික කොටසක් වශයෙන් සැලකිය යුතය.

ප්‍රකාශ කිරීම ශ්‍රී ලංකා රුපියල් වලිනි

| | ප්‍රකාශිත ප්‍රාග්ධනය | ප්‍රත්‍යගණන සංචිත | රදවාගත් ලාභ | එකතුව |
|---|---|---|---|---|
| **2014 අප්‍රේල් 01 දිනට ශේෂය** | **502,456,080** | **1,835,723,580** | **1,500,363,432** | **3,838,543,092** |
| ලාභාංශ | - | - | 386,015,851 | 386,015,851 |
| ලාභාංශ 2013 /2014 | - | - | (19,117,588) | (19,117,588) |
| ලාභාංශ 2014 /2015 | - | (2,652,500) | 2,652,500 | - |
| **2015 මාර්තු 31 දිනට ශේෂය** | **502,456,080** | **1,833,071,080** | **1,869,914,195** | **4,205,441,355** |
| වර්ෂය සඳහා ලාභය | - | - | 603,272,829 | 603,272,829 |
| පසු වර්ෂයේ ගැලපීම් | - | - | 35,457,620 | 35,457,620 |
| ප්‍රත්‍යාගණන වත්කම් අපහරණය | - | - | (115,804,442) | - |
| **2016 මාර්තු31 දිනට ශේෂය** | **502,456,080** | **1,833,071,080** | **2,392,840,203** | **4,844,171,805** |

වරහන් තුල අගයන් වලින් අඩු කිරීම් පෙන්නුම් කෙරේ
අංක 74 සිට 97 දක්වා පිටුවල දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශවල සංකලික කොටසක් වශයෙන් සැලකිය යුතුය.

ප්‍රකාශ කිරිම ශ්‍රී ලංකා රුපියල් වලිනි

| | 2016 | 2015 |
|---|---|---|
| **මෙහෙයුම් ක්‍රියාකරකම් වලින් ජනිත වු මුදල් ප්‍රවාහ ප්‍රකාශය** | | |
| බදු පෙර ලාභය | 836,604,005 | 520,200,738 |
| **ගැලපීම්** | | |
| ක්ෂයවීම් | 29,148,977 | 34,667,000 |
| දේපල පිරියත හා උපකරණ නවීකරණය සඳහා වෙන්කිරීම් | - | (680,000) |
| අස්පෘෂ්‍ය වත්කම් ක්‍රමක් ක්ෂය | 107,750 | 324,300 |
| රාජ්‍ය ප්‍රධාන ක්‍රමක් ක්ෂය | (5,643,699) | (7,586,175) |
| දේපල පිරියත හා උපකරණ විකිණීමේ ලාභය/ අලාභය | (6,527,192) | (527,317) |
| වෙළඳ ලැබිය යුතු දෑ සඳහා හානිකරණය | 992 | 35,153,452 |
| වර්ෂය සඳහා සේවක පාර්තෝෂිත වෙන් කිරීම් | 17,591,797 | 4,589,102 |
| නිශ්චල තොග හානිකරණය | - | 645,582 |
| පොලි ආදායම | (169,528,176) | (110,255,269) |
| බොල් ණය කපාහැරීම | 24,874 | 1,157,815 |
| පොලී වියදම | 1,726,619 | 30,221,225 |
| පූර්ව වර්ෂ ගැලපීම් | 35,457,620 | (19,117,588) |
| **ප්‍රාග්ධන වෙනස් මෙහෙයුම් ලාභය** | **738,963,570** | **488,792,865** |
| තොගය | 243,625,115 | (127,278,662) |
| වෙළෙඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ | 8,874,149,993 | (7,059,908,259) |
| සේවක ණය හා අත්තිකාරම් | (12,347,257) | 64,779 |
| වෙළෙඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ | (4,903,922,705) | (2,775,173,251) |
| තැන්පතු හා අත්තිකාරම් ලැබීම් | (21,968,213) | 48,078,206 |
| උපචිත වියදම් හා වෙන්කිරීම් | 44,015,170 | (52,969,512) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ජනිත වු මුදල් ප්‍රවාහය** | **4,962,515,673** | **(9,478,393,834)** |
| ගෙවු සේවක පාර්තෝෂිත | (6,049,880) | (4,589,102) |
| ගෙවු පොලී | (1,726,619) | (30,221,225) |
| ගෙවු බදු | (95,290,494) | (47,590,798) |
| **මෙහෙයුම් ක්‍රියාකාරකම්වලින් ජනිත වු ශුද්ධ ප්‍රවාහය** | **4,859,448,679** | **(9,560,794,959)** |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වු මුදල් ප්‍රවාහය ප්‍රකාශය** | | |
| දේපල පිරියත හා උපකරණ අත්පත්කර ගැනීම් | (5,698,774) | (19,867,919) |
| අස්පෘෂ්‍ය වත්කම් අත්පත්කර ගැනීම් | (72,000) | (95,000) |
| නොනිමි වැඩ | (3,629,474) | (29,982,586) |
| දේපල පිරියත හා උපකරණ විකිණීමෙන් ලැබු මුදල් | 6,527,191 | 527,317 |
| භාණ්ඩාගාර බිල්පත්වල ශුද්ධ ආයෝජන විකිණීම් | (1,479,404,640) | (17,290,811) |
| අනෙකුත් මුල්‍ය වත්කම් ශුද්ධ ආයෝජන | 240,000,000 | (1,064,758,502) |
| ලැබුණු පොලී | 155,577,685 | 110,225,269 |
| **ආයෝජන ක්‍රියාකාරකම්වලින් ජනිත වු ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(1,086,700,012)** | **(1,021,242,231)** |
| **මුල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වු මුදල් ප්‍රවාහය** | | |
| රාජ්‍ය පදාන | - | 10,546,350 |
| වර්ෂය තුල ලාභංශ ගෙවීම් | - | (53,537,836) |
| වර්ෂය තුල ණය ගැණුම් | 14,023,172,748 | 17,993,705,500 |
| වර්ෂය තුල ණය පියවීම් | (17,867,058,020) | (7,335,864,000) |
| **මුල්‍ය ක්‍රියාකාරකම්වලින් ජනිත වු ශුද්ධ මුදල් ප්‍රවාහය** | **(3,843,885,272)** | **10,614,850,014** |
| **මුදල් හා මුදල් හා සමාන දෑ වර්ෂය තුළ සිදුවු ශුද්ධ වෙනස් වීම්** | (71,136,605) | 32,812,824 |
| වර්ෂය ආරම්භයේ මුදල් හා මුදල් හා සමාන දෑ | 66,370,872 | 33,528,048 |
| **වර්ෂය අවසානයේ මුදල් හා මුදල් හා සමාන දෑ (සටහන් 19)** | (4,765,733) | 66,340,872 |

වරහන් තුල අගයන් වලින් අඩු කිරීම් පෙන්නුම් කෙරේ
අංක 74 සිට 97 දක්වා පිටුවල දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මුල්‍ය ප්‍රකාශවල සංකලික කොටසක් වශයෙන් සැලකිය යුතුය.

**01. ආයතනික තොරතුරු**

**1.1 සාමාන්‍ය**

සීමාසහිත ලංකා පොහොර සමාගම ශ්‍රී ලංකාවේ ස්ථාපනය කරන ලද නිත්‍යවාසි හා සීමිත වගකීම් සහිත සියලුම අයිතීන් ශ්‍රී ලංකා රජය සතු සමාගමකි.

**1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් හා මෙහෙයුම් ස්වභාවය**

සමාගම ප්‍රධාන ක්‍රියාකාරකම ලෙස වී, තේ, පොල්, රබර් සහ අනෙකුත් අස්වනු සඳහා අවශ්‍ය පොහොර ආනයනය, මිශ්‍ර කිරීම හා අලෙවිකරනය සිදු කරයි.

**1.3 මූල්‍ය වර්ෂය**

සමාගමේ මූල්‍ය වාර්තාකරණ කාල සීමාව මාර්තු 31 දිනෙන් අවසන් වේ.

**1.4 ලියාපදිංචි කාර්යාලය**

සමාගමේ ලියාපදිංචි කාර්යාලය බිශොප්හීල්, හුණුපිටිය, වත්තල, පිහිටා ඇත.

**1.5 සේවක සංඛ්‍යාව.**

2016 මාර්තු 31 දිනට සමාගමේ සේවක සංඛ්‍යාව 416 කි. (2015-420)

**1.6 මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා අනුමත කිරීම**.

2016 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ප්‍රකාශන නිකුත් කිරීම සඳහා වර්ෂ 2016 ක් වූ මාර්තු 20 දිනැති අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාවෙන් අනුමැතිය ලබා දී ඇත.

## 2. සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති

**2.1 පිළියෙල කිරීමේ පදනම**

මෙම මූල්‍ය ප්‍රකාශණ පිළියෙල කර ඇත්තේ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන්ට අනුකූලවය. ඓතිහාසික පිරිවැය සංකල්පය පදනම්ව පිළියෙල කර ඇති මෙම මූල්‍ය ප්‍රකාශන වල ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණනයෙන් වෙනස් කර ඇත. ශ්‍රී ලංකා මූල්‍ය වාර්තා කරන ප්‍රමිතීන්ට අනුකූලව මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමණාකරණයට නිශ්චිත හා තීරණාත්මක වන ගිණුම්කරන ඇස්තමේන්තු භාවිතා කිරීමට සිදුවේ. එසේම ගිණුම්කරණ ප්‍රතිපත්ති භාවිතා කිරීමේදී කළමණාකරණයේ මතයන් යොදා ගැනීමද අවශ්‍ය වේ. ඉහළ පරාසයක විමසුමක් හෝ සංකීර්ණතාවයක් හෝ නිගමණයන් ඇස්මේන්තු හා සම්බන්ධ වන විශේෂිත අනාවරණයන් මෙම මූල්‍ය ප්‍රකාශන වල සටහන් 2.26 දක්වා ඇත.

මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය පහත සඳහන් ඓතමයන් හැර ඓතිහාසික පිරිවැය පදනම මත සමාගමේ මූල්‍යය ප්‍රකාශය සකස් කර ඇත.

- අර්ථ ප්‍රතිලාභ වගකීමක්, අර්ථ ප්‍රතිලාභ වගකීමක් වර්තමාන වටිනාකම ලෙස හඳුනා ගැනේ
- සින්නක්කර ඉඩම් හා ගොඩනැගිලි ප්‍රත්‍යාගණන ලද දිනය වන සාධාරණ අගය වන තක්සේරු ප්‍රමාණයක් දී අත්පත් කර ගැනීම හා ඊට පසුව කරන අවස්ථාවේ දී පිරිවැය මනිනු ලැබේ

සමාගමේ මූල්‍ය ප්‍රකාශන හා මූල්‍ය ප්‍රතිපත්ති සටහන් සමන්විත වන්නේ පවත්නා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය විස්තීර්ණ අදායම් ප්‍රකාශය හිමිකම් වෙනස් වීමේ ප්‍රකාශය සහ 2007 අංක 07 දරණ සමාගම් පනතේ අවශ්‍යතාවන් පරිදි ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් නිකුත් කර ඇති ශ්‍රී ලංකා ගණකාධිකරණ ප්‍රමිතීන් සහ ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් වලට අනුකූල වන පරිදි වේ

## 2.2 ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීම්

වෙනත් ආකාරයට සඳහන් කර නොමැති අවස්ථාවලදී සමාගම විසින් පෙර මූල්‍ය වර්ෂවලදී අනුගමනය කල ගිණුම්කරණ ප්‍රතිපත්ති ඒ ආකාරයෙන්ම ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිත මුල් වරට භාවිතා කල මෙම වර්ෂයට අදාළ කරගෙන ඇත. වඩා හොඳ ඉදිරිපත් කිරීමක් හා වර්තමාන වර්ෂය සමඟ සැසඳීම සඳහා අවශ්‍ය අවස්ථාවලදී පෙර වර්ෂයේ මූල්‍ය වාර්තා වෙනස් කර ඇත.

## 2.3 විදේශ මුදල් ගණුදෙනු

2.3.1 මෙහෙයුම් හා ඉදිරිපත්කරන මුදල් ඒකකයන්

මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කර ඇති අතර, එය සමාගම මෙහෙයුම් කටයුතු සඳහා භාවිතාකරණ ප්‍රධාන මුදල් ඒකකය වේ.

2.3.2 ගණුදෙනු හා ශේෂයන්

තත්කාලීනව බලපවත්නා වූ අනුපාතිකය අනුව සියළුම විදේශ විනිමය ගණුදෙනු ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කෙරේ. විදේශ වලංගු මුදල් වලින් දක්වා ඇති මූල්‍ය වත්කම් හා වගකීම් වර්ෂය අවසානයේදී පැවැති විදේශ විනිමය අනුපාතය අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කෙරේ. ඒ අනුව ලබන්නා වූ ලාභය හෝ අලාභය විස්තීරණ ආදායම් ප්‍රකාශයේ ගිණුම්ගත කෙරේ. මූල්‍ය නොවන වත්කම් හා වගකීම් ඓතිහාසික පිරිවැය මත මනිනු ලබන අතර මුල් ගණුදෙනුව සිදුකල දිනයේදී පැවැති විදේශ විනිමය අනුපාතිකයට අනුව ශ්‍රී ලංකා රුපියල් වලට පරිවර්තනය කෙරේ.

2.4.1 දේපල, පිරියත හා උපකරණ

දේපල, පිරියත හා උපකරණ පිරිවැය ලෙස මූලික වශයෙන් ගැණුම් පිරිවැය සහ වැඩ කල හැකි හා භාවිතා කල හැකි තැනට, තත්ත්වයට පත් කිරීම සඳහා දරණ වියදම් වල එකතුවෙන් වාර්තා කර ඇත.

සමාගමේ මූල්‍ය තත්වයෙහි දේපල, පිරියත හා උපකරණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුව වාර්තා කර ඇත. ඉඩම් හා ගොඩනැගිලි හැර අනෙකුත් දේපල, පිරියත හා උපකරණ පිරිවැය අගයෙන් වාර්තා කර ඇත. ඉඩම් හා ගොඩනැගිලි හැර අනෙකුත් දේපල, පිරියත හා උපකරණ සමුච්චිත ක්ෂය හෝ සමුච්චිත හානිකරණය පිරිවැයෙන් අඩුකොට වාර්තා කර ඇත. 2010 වර්ෂයේ සමාගම ඉඩම් හා ගොඩනැගිලිවල ප්‍රත්‍යගණන අගය ගණනය කොට වත්කමේ සාධාරණ අගයේ සිදුවූ වෙනස්කම් ස්කන්ධ ප්‍රකාශනයට හඳුනාගෙන ඇත.

දේපල, පිරියත හා උපකරණ අලුත් වැඩියාවේදී හා නඩත්තු කිරීමේදී මුල් තක්සේරු ක්‍රියාකාරි ප්‍රමිතියේදී බලාපොරොත්තු වූ ඉදිරි ආර්ථික ප්‍රතිලාභ නැවත ඇති කිරීමට දරණ වියදම් ප්‍රාග්ධනික කරනු ලබන අතර අනෙකුත් වියදම් අදාළ වර්ෂයේදී විස්තිරණ ආදායම් ප්‍රකාශයට ගලපනු ලබයි.

ඉඩම් හැර අනෙකුත් වත්කම් සරළ මාර්ග ක්‍රමයට පිරිවැය හෝ ප්‍රත්‍යාගණන අගය මත වත්කමේ ප්‍රයෝජනවත් ජීවකාලය තුලදී පහත අනුපාතයන්ට ක්ෂය කරනු ලබයි.

| | |
|---|---|
| ගොඩනැගිලි | අවුරුදු 40 |
| යන්ත්‍රාගාර හා උපකරණ | අවුරුදු 05 - 10 දක්වා |
| මෝටර් රථ | අවුරුදු 05 |
| පාපැදි | අවුරුදු 03 |
| කාර්යාලීය ගෘහ භාණ්ඩ | අවුරුදු 03 |
| කාර්යාලීය උපකරණ | අවුරුදු 03 |
| වැඩ පොළ මෙවලම් | අවුරුදු 05 |
| රසායනාගාර උපකරණ | අවුරුදු 03 |
| වෙනත් උපකරණ | අවුරුදු 03 |
| භෝජනාගාර උපකරණ | අවුරුදු 05 |
| පරිඝනක උපාංග | අවුරුදු 03 |

වත්කමක ධාරණ අගය එම වත්කමෙන් නැවත අයකරගත හැකි අගයට වඩා අඩුවන විට ධාරණ අගය නැවත අයකරගත හැකි අගය දක්වා ක්ෂය කරනු ලබයි.

2.4.2 අස්පෘශ්‍යය වත්කම්

අත්පත්කර ගන්නා ලද පරිඝනක මෘදුකාංග හා මෙහෙයුම් පද්ධති අත්පත් කර ගැනීමට හා වැඩකර ගත හැකි තත්වයකට පත් කිරීමට දරනු ලබන වියදම් ප්‍රාග්ධනික කර ඇත. අස්පෘශ්‍යය වත්කම් ඒවායේ පිරිවැය අගයෙන් සමුච්චිත ක්‍රමක් ක්ෂය හෝ සමුච්චිත හානිකරණයන් අඩුකොට වාර්තා කර ඇත. මෙම පිරිවැය පහත පරිදි වත්කමේ ඵලදායි ජීවිතකාලය පුරා ක්‍රමක් ක්ෂය කරයි.

පරිඝනක මෘදුකාංග අවුරුදු 03

පරිඝනක මෘදුකාංග හා මෙහෙයුම් පද්ධති නඩත්තු කිරීම සඳහා දරණ වියදම් වියදමක් ලෙස හඳුනා ගැනේ.

2.4.3 මූල්‍ය නොවන වත්කම් හානිකරණය

සෑම වාර්තාකරණ දිනයකදීම වත්කම්, හානිකරණය වීමේ සංඥාවක් ඇත්දැයි සමාගම තක්සේරු කරයි. යම් වත්කමක් සඳහා එවැනි සංඥාවක් ඇත්නම් සමාගම වත්කමෙහි නැවත අයකරගත හැකි අගය ඇස්තමේන්තු කරයි. එකිනෙක වත්කමෙහි නැවත අයකරගත හැකි අගය ගණනය කිරීම අපහසු අවස්ථා වල සමාගම මුදල් උත්පාදන ඒකකයන් වල නැවත අයකල හැකි අගයන් ගණනය කරනු ලබයි.

වත්කමක නැවත අයකර ගත හැකි අගය එහි සාධාරණ අගයට හෝ වත්කම භාවිතයේ ආර්ථික ප්‍රතිලාභයන්ට වඩා අඩුවන විට වත්කම නැවත අයකරගත හැකි අගය දක්වා ක්ෂය කරනු ලබයි.

වත්කමේ නැවත අයකරගත හැකි අගයට වඩා වත්කමේ සාධාරණ අගය වැඩිවන විට එම වත්කම නැවත අගය කල හැකි වටිනාකම දක්වා විස්තීර්ණ ආදායම් ප්‍රකාශයට කපා හරිනු ලබයි.

**2.5 මූල්‍ය වත්කම්**

2.5.1 සමාගම මූලික හඳුනාගැනීමේදී තම මූල්‍ය වත්කම් පහත පරිදි වර්ගීකරණය කරයි.

අ) කල්පිරීම තෙක් පවත්වා ගන්නා මූල්‍ය වත්කම්

ආ) ණය සහ ලැබිය යුතු දෑ

(අ) කල්පිරීම තෙක් පවත්වා ගන්නා මූල්‍ය වත්කම්

සමාගම විසින් කල්පිරීම තෙක් රඳවා තබා ගැනීමේ අභිප්‍රායෙන් හා හැකියාවෙන් යුක්තව තබාගෙන ඇති නිශ්චිත හෝ ස්ථිර වූ ගෙවුම්වලින් සමන්විත ව්‍යුත්පන්න කල නොහැකි මූල්‍ය වත්කම් මේ නමින් හැඳින්වේ. කල්පිරීම තෙක් පවත්වා ගන්නා මූල්‍ය වත්කම් ජංගම වත්කම් යටතේ වර්ග කර ඇත.

(ආ) ණය හා ලැබිය යුතු දෑ

ව්‍යුත්පන්න කල නොහැකි මූල්‍ය වත්කම් වන ණය හා ලැබිය යුතු දෑ උපලබ්ධි වීමට නියමිත තක්සේරු කල වටිනාකම මත පදනම්ව වාර්තා කර ඇත.

ජංගම නොවන වත්කම් යටතේ දක්වා ඇති වාර්තා කරන දිනයේ සිට මාස 12 කට පසු උපලබ්ධි වීමට නියමිත ණය සහ ලැබිය යුතු දෑ හැර අනෙකුත් ණය හා ලැබිය යුතු දෑ ජංගම වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. සමාගමේ ණය හා ලැබිය යුතු දෑ, ලැබිය යුතු සහනාධාර, වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු දෑ ප්‍රතිමිළදී ගන්නා රාජ්‍ය බැඳුම්කර, ස්ථාවර තැන්පතු, පෙර ගෙවීම්, අත්තිකාරම්, තැන්පතු, සේවක ණය සහ වාර්තාකරණ දිනට මුදල් හා මුදල් සමාන දෑ වලින් සමන්විත වේ.

2.5.2 හඳුනාගැනීම හා මූලික මැණීම්

සමාගමේ ණය හා ලැබිය යුතු දෑ සහ තැන්පතු ඒවා ඇති වූ දිනට මූලික වශයෙන් හඳුනාගනු ලැබේ. අනෙකුත් මූල්‍ය වත්කම් මුල්වරට හඳුනාගැනීමේදී වෙළදාම් සිදුවූ දිනට එනම්, සමාගම මූල්‍ය උපකරණයන්හි ගිවිසුම්ගත බැඳීමේ පාර්ශවයන් බවට පත් වූ දිනට හඳුනාගත යුතු මූල්‍ය වත්කමක් වශයෙන් අගය කරනුයේ සාධාරණ අගයට ලාභ හෝ අලාභ තුළින් සාධාරණ අගය යන වර්ගීකරණයට අයත් නොවන්නා වූ අයිතමයන්ට අදාළ අත්පත් කර ගැනීමට හෝ නිකුත් කිරීමට අදාළ කරගත හැකි ගණුදෙනුවල පිරිවැයට එකතු කල අගයයි. සමාගම විසින් එහි මූල්‍ය වත්කම් හදුනා ගැනීම නවතා දමනුයේ මූල්‍ය වත්කම් තුළින් මුදල් ලැබීමට ඇති ගිවිසුම්ගත බැඳීම කල්පිරීමකදී හෝ එම මූල්‍ය වත්කම්වලට අදාළ සියලු අවධානම් හා ප්‍රතිලාභයන් වෙනත් පාර්ශවයක් වෙත පරිවත්‍ය කරන අවස්ථාවකදී ය.

2.5.3 පසුකාලීන මැණීම්

(අ) කල්පිරීම තෙක් පවත්වා ගන්නා මූල්‍ය වත්කම්

කල්පිරීම තෙක් පවත්වා ගන්නා මූල්‍ය වත්කම් සඵල පොළී අනුපාතිකය භාවිතා කර ක්‍රමක් ක්ෂය වූ පිරිවැයෙන් හානිකරණයත් අඩුකල පසු අගයට අගය කරනු ලැබේ. අත්පත් කර ගැනීමේ වත්කම් හෝ අධිභාරයන් සහ ගණුදෙනු පිරිවැය මූල්‍ය වත්කමේ ක්‍රමක් ක්ෂය පිරිවැය ගණනයේදී සලකා බලයි.

(ආ) ණය හා ලැබිය යුතු දෑ

මුල් වරට අගය කිරීමෙන් පසුව ණය හා අනෙකුත් ලැබිය යුතු දෑ සඵල පොළී අනුපාතිකය භාවිතා කර ක්‍රමක් ක්ෂය වු පිරිවැයෙන් හානි කරණයන් අඩුකල පසු අගයට වාර්තා කරයි.

2.5.4 මූල්‍ය වත්කම් හානිකරණය

**ක්‍රමක් ක්ෂය පිරිවැයට පවත්වාගෙන යනු ලබන වත්කම්**

සමාගම සෑම ගිණුම් කාල පරිච්ඡේදයක් අවසානයේදී තම මූල්‍ය වත්කම් හානිකරණයට ලක්වී ඇති බවට සාක්ෂි තිබේද නැද්ද යන්න පිළිබඳව විමසා බැලිය යුතුය. මූල්‍ය වත්කමක් හානිකරණය කිරීම සහ එම හානිකරණ අලාභය දැරිය යුත්තේ මුල්වරට හදුනාගැනිමෙන් පසුව ඇති වු එක් හේතුවක් (සිදුවීමක්) හෝ හේතු කිහිපයක් නිසා වු බවට සාක්ෂි ඇත්නම් පමණක් හා එම අලාභ සිදුවීමෙන් අනාගත මූලය ප්‍රවාහයන් මත ඇති වන්නා වු බලපෑම විශ්වාසනීය ලෙස ආගණනය කල හැකිනම් පමණි. ක්‍රමක් ක්ෂය වු පිරිවැය මත පවත්වාගෙන යනු ලබන ණය සහ ලැබිය යුතු දෑ වල හානිකරණ අලාභ හඳුනාගත යුත්තේ වත්කම් පවත්වාගෙන යන අගය හා එම වත්කමේ අනාගත මුදල් ප්‍රවාහයන් සඵලදායි පොළි අනුපාතය මත වට්ටම් කල පසු අතර ඇති වෙනසයි. (අනාගත මුදල් ප්‍රවාහයන් සැලකීමේදී දරණු නොලබන අනාගත අපේක්ෂිත අලාභ ඉවත් කරයි.) වත්කමේ පවත්වාගෙන යනු ලබන අගය හා කපා හල යුතු අගය අතර අලාභය විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සඳහා හඳුනාගත යුතුය.

යම් හෙයකින් පසු කාල පරිච්ඡේදයේදී හානිකරණ අලාභය අඩු වුවහොත් එම අඩුවීම හානිකරණය හඳුනාගත් ගැනීමෙන් පසු ඇති වු කිසියම් සිදුවීමකට අදාල කළ හැකි නම් පමණක් කලින් හඳුනාගත් හානිකරණ අලාභය ප්‍රත්‍යාවර්ථනය කල හැකිය.

**2.6 තොගය**

තොගය (සෘජු හා මිශ්‍ර පොහොර) පිරිවැය අගයෙන් සහනාධාර අඩු කර දක්වා ඇත. පිරිවැය ගණනය කරනු ලබන්නේ පළමු ලබාගත් තොග පළමු බැහැර කිරීමේ ක්‍රමයටය. මිශ්‍ර පොහොර තොග පිරිවැය අමුද්‍රව්‍ය, සෘජු වේතන, අනෙකුත් සෘජු පිරිවැයන් හා නිෂ්පාදන පොදු කාර්ය පිරිවැයන්ගෙන් සමන්විත වේ. දේශීයව මිළදී ගත් පොහොර පිරිවැයට වාර්තා කර ඇත. සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී විකිණීමට බලාපොරොත්තු වන මිළෙන් එයට අදාළ වියදම් අඩුකිරීමෙන් ශුද්ධ උපලබ්ධි අගය ගණනය කර තිබේ.

පාරිභෝගික ද්‍රව්‍ය හා ඇසුරුම් ද්‍රව්‍ය ඊට අදාළ පිරිවැය යටතේ දක්වා ඇත.

**2.7 වෙළඳ ලැබිය යුතු දෑ**

සාමාන්‍ය ව්‍යාපාර චක්‍රය තුලදී භාණ්ඩ විකිණීමෙන් ලැබිය යුතු මුදල් වෙළඳ ලැබිය යුතු දෑ වේ. ණය එකතු කිරීම සාමාන්‍ය මෙහෙයුම් ක්‍රියාවලිය තුලදී බලාපොරොත්තු වන අතර, ඒවා ජංගම වත්කම් ලෙස වර්ග කර ඇත. පළමු හඳුනාගැනිමේදී වෙළඳ ලැබිය යුතු ඉන්වොයිස් වටිනාකම වන සාධාරණ අගයට හඳුනාගැනේ. පසුව ඉන්වොයිස් අගයෙන් හානිකරණයන් අඩුකිරීමෙන් හඳුනාගැනේ.

සමාගම සෑම ගිණුම්කාල පරිච්ඡේදයක් අවසානයේදීම තම වෙළෙඳ ලැබිය යුතු දෑ හානිකරණයට ලක් වී තිබේද නැද්ද යන්න පිළිබඳ විමසා බලයි. සමාගමේ ණය එකතු කිරීම පිළිබඳ අතීත පලපුරුද්ද, ගෙවීම් ප්‍රමාණ වීමේ දින ගණන උපරිමය දින 90 ට වැඩිවීම යනාදිය හානිකරණය ගණනයේදී සලකා බලයි. වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය හා එම හානිකරණ අලාභය දැරිය යුත්තේ එම හානිකරණය පිළිබඳ සාක්ෂි ඇත්නම් පමණි. සියලුම වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය සඳහා තනි තනිව සලකා බලයි.

වෙළඳ ලැබිය යුතු දෑ හානිකරණය නිර්ණය කිරීමේ පදනම හා ආකෘතිය පහත පරිදි වේ. තනි තනිව ඇගයීමේ ක්‍රමය ඨ හානිකරණය ගණනය කිරීම සඳහා පහත දැක්වෙන වෙළඳ ලැබිය යුතු දෑ තනි තනිව ආගණනය කර ඇත.

i) විවිධ සේවා සමූපකාර සමිති
ii) ගොවිජන සේවා මධ්‍යස්ථාන
iii) බලයලත් නියෝජිතයන්
iv) රාජ්‍ය හා ආයතන හා දෙපාර්තමේන්තු

**2.8 මුදල් හා මුදල් සමාන දෑ**

මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේදී අතැති මුදල්, ඉල්ලුම් තැන්පතු, අනෙකුත් මාස 03 අඩු කාලයකින් කල් පිරෙන ඉහළ ද්‍රවශීලතාවයකින් යුත් ආයෝජන, මුදල් හා මුදල් සමාන දෑ ලෙස වර්ගීකරණය කෙරේ.

**2.9 ප්‍රකාශිත ප්‍රාග්ධනය**

ශ්‍රී ලංකා රජයට නිකුත් කරන ලද සාමාන්‍ය කොටස් හිමිකම ලෙස වර්ගීකරණය කරයි.

**2.10 මූල්‍ය වගකීම්**

සමාගම මූල්‍ය වගකීම් අනෙකුත් මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත. සමාගමේ අනෙකුත් මූල්‍ය වගකීම් ලෙස ණය, වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ සහ බැංකු අයිරා ඇතුලත් වේ. අනෙකුත් මූල්‍ය වගකීම් මූලිකවම සෘජුව වෙන්කර හැකි අනෙකුත් වියදම් සමග සාධාරණ අගයට හඳුනා ගනී. පසුව සඵල පොළී අනුපාතිකය භාවිතා කරමින් හානිකරණ පිරිවැය මත පදනම්ව හඳුනාගනී. සමාගම ගිවිසුම්ප්‍රකාර බැඳීම් ඉවත් කිරිමේදී, අවලංගු කිරීමකදී හෝ කල් ඉකුත්වීමකදී මූල්‍ය වගකීම් හඳුනාගැනීම නවතා දමයි.

**2.11 වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ**

සාමාන්‍ය ව්‍යාපාර කටයුතුවලදී භාණ්ඩ හා සේවා අත්පත් කර ගැනීම නිසා ඒවාට ගෙවීමට ඇති වූ බැදියාව වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ලෙස වර්ග කරයි. ව්‍යාපාරයේ සාමාන්‍ය කටයුතුවලින් පැන නැගී වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ ජංගම වගකීම් ලෙස වර්ගීකරණය කරයි.

වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු දෑ මූලිකව ඒවායේ ගණුදෙනු වටිනාකම වන සාධාරණ අගයට හදුනා ගනි. පසුව මුදලෙහි කාලීන වටිනාකම වැදගත් නොවන විට සහ කෙටිකාලීනව ගෙවීමට බලාපොරොත්තු වන විට ඒවායේ නියමිත ඉන්වොයිස් වටිනාකමට හඳුනා ගනි.

**2.12 ණය ගැණුම්**

ණය ගැණුම් මුලිකව වාර්තා කල ශුද්ධ ගණුදෙනු වටිනාකමට, සාධාරණ අගයට හදුනා ගනි. පසුව සඵල පොලී අනුපාතිකය භාවිතා කරමින් ක්‍රමක් ක්ෂය වු වටිනාකමට හඳුනාග නි.

**2.13 ණය ගැනුම් පිරිවැය**

වර්ෂය තුල ණය ගැනුම් පිරිවැය විස්තීර්ණ අදායම් ප්‍රකාශයෙන් ගැලපා ඇත

**2.14 රාජ්‍ය ප්‍රදාන**

රාජ්‍ය ප්‍රදානයන් ලැබෙන බවට සෑහීමකට පත්විය හැකි තහවුරුවක් ලැබීමත්, සමාගම විසින් අදාළ කොන්දේසි සපුරන්නේ නම් රාජ්‍ය ප්‍රදාන ඒවායේ සාධාරණ අගයට හඳුනා ගනි.

ආනයන වියදම් පියවීම සඳහා ලැබෙන සහනාධාරවලට අදාළ වියදම් එම වියදම දරනු ලබන්නා වු කාල පරිච්ඡේදයේදී විස්තිරණ ආදායම් ප්‍රකාශයට හඳුනා ගැනේ. දැනටමත් දරා ඇති ආනයන වියදම් සඳහා ලැබෙන සහනාධාර ඒවා ලැබීම පිළිබද සෑහීමකට පත්විය හැකි තහවුරුවක් ලැබේ නම් ලැබිය යුතු සහනාධාර ලෙස හදුනා ගැනේ.

දේපල, පිරියත හා උපකරණ සඳහා ලැබුනු රාජ්‍ය ප්‍රදාන විලම්භිත රාජ්‍ය ප්‍රදාන ලෙස ජංගම නොවන වගකිම්වලට ඇතුළත් කර ඇත. ඒවා වත්කමේ අපේක්ෂිත ආයු කාලය තුල සරළ මාර්ග ක්‍රමයට විස්තිරණ ආදායම් ප්‍රකාශයට හදුනා ගනි.

**2.15 වර්තමාන හා විලම්භිත බදු**

කාල පරිච්ඡේදය සඳහා අදාළ බදු වියදම වර්තමාන බදු වියදම හා විලම්භිත බදු වියදමෙන් සමන්විත වේ. බදු වියදම විස්තිරණ අදායම් ප්‍රකාශයට හදුනාගනු ලබන්නේ ඒවා අනෙකුත් විස්තිරණ අදායම් ප්‍රකාශයේ අයිතමයන් ලෙස හඳුනාගත් ප්‍රමාණය දක්වා පමණි.

වර්තමාන වසර සඳහා ආදායම් බදු වගකීම දේශීය ආදායම් පනතේ විධි විධානයන්ට අනුකූලව ආදායම් බදු අධිකාරිය වෙත ගෙවීමට අපේක්ෂිත ප්‍රමාණය දක්වා හඳුනාගනු ලැබේ.

මූල්‍ය වාර්තාවල වත්කම් හා වගකිම් වල ධාරණ අගයේ සහ බදු පදනම අනුව වත්කම් හා වගකීම් වල ධාරණ අගයේ ඇති වෙනස්වීම් මත විලම්භිත ආදායම් බදු හදුනාගැනේ.

බදු සඳහා හදුනාගත් සියලුම තාවකාලික වෙනස්වීම් මත විලම්භිත ආදායම් බදු වගකීම හඳුන්වාදී ඇත. එසේ නොවන්නේ ව්‍යාපාර සංයෝජනයක් නොවන ගණුදෙනුවකදී හා ගණුදෙනුව කරන අවස්ථාවේදී ගිණුම්කරන ලාභයට හෝ බද්ධට යටත් ලාභයට හෝ පාඩුවට බලනොපාන මූලිකව වත්කමක් හෝ වගකීමක් හෝ විමලම්භිත බදු වගකීම සිදුවන අවස්ථාවේදී ය. වත්කමේ උපලබ්ධි වූ විට හෝ වගකීමෙන් නිදහස් වූ විට ඒකී වසර සඳහා බලපැවැත්වෙන්නා වූ බදු අනුපාතය පදනම් කරගෙන හා ප්‍රඥප්ති කල හෝ පසුව මූල්‍ය තත්ව ප්‍රකාශන දිනය වන විට බලපැවැත්වෙන බදු නීති මත විලම්භිත ආදායම් බමු වගකීම හෝ වත්කම හඳුනා ගනි.

ප්‍රවර්ථන ආදායම් බදු වගකීම්වලට එරෙහිව ප්‍රවර්ථන බදු වත්කම් හිලව් කිරීමට නෛතිකව පැණ වු අයිතියක් ඇත්නම් ද විලම්භිත ආදායම් බදු එකම අඩු බදු අයකරන ඒකකයට හෝ එකම බදු අධිකාරියකට සම්බන්ධ නම්ද විලම්භිත ආදායම් බදු වත්කම් හා විලම්භිත ආදායම් බදු වගකීම් හිලව් කරනු ලැබේ.

2.16 සේවක ප්‍රතිලාභ

සමාගම අර්ථ ප්‍රතිලාභය හා නිර්වචනය කරන ලද දායක සැලසුම් දෙකම ඇත.

(අ) නිශ්චිත දායකත්ව සැලසුම්

නිශ්චිත දායකත්ව සැලසුම් පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුමක් වන අතර, සමාගම විසින් ස්ථාවර දායකත්වයක් වෙනත් ආයතනයකට ඒ වෙනුවෙන් සපයයි. සමාගමට මෙම දායකත්වයන් සම්බන්ධයෙන් හා ඒවා ගෙවීම සම්බන්ධයෙන් තවදුරටත් නිතිමය හෝ වෙනත් ආකාරයක බැදීමක් නොමැත.

සමාගම සේවක භාරකාර අරමුදල හා සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල වෙනුවෙන් පිළිවෙලින් 15 හා 3 ප්‍රමාණයන් සේවක දළ වැටුපට අනුව ගෙවයි.

(ආ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම්

නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් යනු පශ්චාත් සේවක ප්‍රතිලාභ සැලසුමකි. නිශ්චිත දායකත්ව සැලසුම් ගණයට අයත් නොවන මූල්‍ය තත්ව ප්‍රකාශ දිනට මූල්‍ය ප්‍රකාශයන් තුළ නිශ්චිත ප්‍රතිලාභ සම්බන්ධයෙන් දක්වා ඇති වගකීම් හඳුනාගෙන ඇත්තේ එම නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වගකීමෙහි වර්තමාන අගයයි. මූල්‍ය තත්ව ප්‍රකාශ දිනට නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වගකීම සුදුසුකම්ලත් ජීවගණනවරයෙකු ලවා පුරෝකතනය කරන ලද ඒකක බැර ක්‍රමය භාවිතා කරමින් තක්සේරු කර ඇත. ජීව ගණන තක්සේරු ක්‍රමය තුළ වට්ටම් අනුපාතිකය සම්බන්ධව සිදුකරන උපකල්පනයන් සේවක වැටුප් වර්ධක අනුපාතිකයන් හා සේවකයන්ගේ ඉතිරි සේවා කාලය යන දෑ අන්තර්ගත වේ. මෙම සැලසුමෙහි පවන්නා දිගු කාලින ස්වභාවය හේතු කොටගෙන තක්සේරු අගයන් තුල සැලකිය යුතු අවිනිශ්චිත තාවයන් අන්තර්ගත වන අතරඒවා වාර්තා වූ කාල පරිච්ඡේදයේ විස්තිරන ආදායම් ප්‍රකාශයට හදුනා ගැනේ.

එම වගකීම බාහිරව ආයෝජනය කර නොමැත.

(ඇ) කෙටි කාලීන සේවක ප්‍රතිලාභ

සේවකයන් විසින් සපයනු ලබන සේවයට ගෙවීමට බලාපොරොත්තු වන වටිනාකම වට්ටම් නොකර වාර්තා කරයි.

**2.17 වෙන් කිරීම් හා අසම්භාව්‍ය වගකීම්**

පසුගිය සිද්ධීන් නිසා ආර්ථික ප්‍රතිලාභ ගලායාමක් හා එම ප්‍රමාණය ගැන සෑහීමට පත් විය හැකි ආකාරයෙන් ගණනය කල හැකි විට එම වගකීම පියවීම සඳහා නිතිමය හෝ වෙනත් ආකාරයක බැඳීමක් ඇත්නම් ඒවා මෙහෙයුම් වියදම් ලෙස හඳුනා ගැනේ.

වාර්තාකරන දිනයේදී වෙන් කිරීමක් පියවීම සඳහා ඇති වර්තමාන බැඳීම නිවැරදිව සෑහීමට පත්විය සාධක මත පදනම්ව අවධානම හා අසම්භාවයතාවයන් ඇතුලත්ව වෙන්කිරීම හඳුනා ගැනේ.

සියළුම අසම්භාව්‍ය වගකීම් මූල්‍ය වාර්තා සඳහා වන සටහන් තුල දක්වා වාර්කා කර ඇති අතර ඒවා පියවීම සඳහා අවශ්‍ය වන ආර්ථික ප්‍රතිලාභයන් හෝ ප්‍රමාණය නිශ්චිත හෝ විශ්වාසදායක ලෙස මැන දැක්වීමක් කල නොහැකි අසම්භාව්‍ය වගකීම් මූල්‍ය වාර්තා තුල හඳුනා නොගන්නා අතර හෙළි දරව් කිරීමක් පමණක් සිදු කරනු ලැබේ.

**2.18 ආදායම් හඳුනාගැනීම්**

ලැබිය යුතු හා ලැබුණු සහනාධාර වටිනාකම සහ භාණ්ඩ විකිණීමෙන් පෙන්නුම් කරන ලැබිය යුතු ප්‍රමාණයන්ය. එකතු කල අගය මත බද්ධ (එ.අ.බ.) හා ජාතිය ගොඩනැගීමේ බද්ධ (ජ.ගො.බ) අඩු කිරීමෙන් ආදායම් හඳුනා ගනි. අනාගත ආර්ථික ප්‍රතිලාභයන්ගේ ප්‍රමාණය නිශ්චිත හෝ විශ්වාස දායක ලෙස මැන දැක්වීමක් කල හැකි වීම සාමාගම ආදායම හඳුනා ගනි.

ආදායම හඳුනා ගැනීමේ ප්‍රධාන ආකාරයන් පහත පරිදි වේ.

(අ) පොහොර විකිණීම

සමාගම සෘජු සහ මිශ්‍ර පොහොර ආනයනය කර තොග හා සිල්ලර වශයෙන් විකිණීම කරයි. භාණ්ඩ සම්බන්ධ ප්‍රධාන අවධානම් සහා ප්‍රතිලාභ පාර්භෝගිකයාට මාරුවන අවස්ථාවේදී එනම්, ගබඩාවෙන් භාණ්ඩ නිකුත් කරනු ලබන අවස්ථාවේදී ආදායම හඳුනා ගනි.

(ආ) පොළී ආදායම

සඵල පොළී අනුපාතිකය භාවිතා කර පොළී ආදායම හඳුනාගනී.

(ඇ) කුළී ආදායම

කල්බදු ගිවිසුමට අනුව උපචිත පදනමට කුළී ආදයම හඳුනා ගනී.

(ඈ) දේපල, පිරියත හා උපකරණ ඉවත් කිරීමේ ලාභ හා පාඩු

දේපල, පිරියත හා උපකරණ වල ධාරණ අගයන් ඉවත් කිරීමෙන් ලැබෙන වටිනාකමත් සංසන්දනය කර විස්තිරණ ආදායම් ප්‍රකාශයට ලාභය හෝ පාඩුව හඳුනා ගනී.

(ඉ) අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

### 2.19 වියදම්

වාර්තා කරණ කාල පරිච්ඡේදයේ ලාභය ගණනය කිරීමේදී මෙහෙයුම් ක්‍රියාකාරකම් සඳහා දායක වූ සියලුම වියදම සලකා බලයි.

### 2.20 ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවීම්

ශේෂ පත්‍ර දිනයෙන් පසු සිදුවූ සියලුම වැදගත් සිද්ධීන් සලකා බලා අවශ්‍ය අවස්ථාවල කරන ලද ගැලපීම් හෝ අනාවරණයක් මෙම ප්‍රකාශන සඳහා වන සටහන් වල දක්වා ඇත.

### 2.21 වගකීම්

වාර්තාකරණ දිනය මූල්‍ය ප්‍රකාශවල හඳුනාගත යුතු හා ගැලපිය යුතු සියලුම වගකීම් මූල්‍ය ප්‍රකාශ සඳහා වන සටහන් තුල දක්වා ඇත.

### 2.22 වැදගත් ගිණුම්කරණ ඇස්මේන්තු හා උපකල්පනයන්

මෙම මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී කළමනාකාරිත්වය විසින් වත්කම්, වගකීම්, ආදායම්, වියදම් මැනීම සඳහා පවතින තොරතුරු විනිශ්චය කිරීම, ඇස්තමේන්තු සකස් කිරීම සහ උපකල්පනයන් සිදු කරයි.

2.22.1 පහත දැක්වෙන ගිණුම්කරණ ප්‍රතිපත්ති අනුගමනය කිරීමේදී විශේෂ විනිශ්චයන් කරනු ලබන අතර ඒවා මූල්‍ය වාර්තා වලට විශේෂිත බලපෑමක් ඇති කරයි.

(අ) විලම්භිත බදු වත්කම් හඳුනා ගැනීම

විලම්භිත බදු වත්කම් භාවිතා කල හැකි අනාගත බදුවන ආදායමේ තක්සේරුව මත විලම්භිත බදු වත්කම් ප්‍රමාණය තීරණය වේ.

2.22.2 වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් හඳුනා ගැනීමේදී සහ මැණීමේදී විශේෂිත බලපෑමක් කරන ඇස්මේන්තු සහ නිගමනයන් පහත පරිදි වේ.

(අ) ක්ෂය කල හැකි වත්කම් ඵලදායි ජීව කාලය

අපේක්ෂිත භාවිතිය මත කලමනාකාරිත්වය විසින් සෑම වාර්තාකරණ දිනයකටම ක්ෂය කලහැකි වත්කම් වල ඵලදායි ජීවකාලය පිළිබඳව වන ඇස්මේන්තු නැවත විමසා බලයි. තාක්ෂණික යල්පැනීන් හේතු කොටගෙන ඇස්මේන්තු වල සිදුවන අවිනිශ්චිත තාවයන් නිසා මෘදුකාංග සහ තොරතුරු තාක්ෂණ උපකරණ වල ඵලදායි ජීවකාලය පිළිබඳ වෙනස් වීම් සිදුවිය හැක.

(ආ) නිශ්චිත ප්‍රතිලාභ සැලසුම

ආයු ගණක පදනම මත භාවිතා කල සාධක රාශියකගේ නියමනයන් මත නිශ්චිත ප්‍රතිලාභ සැලසුම් වල වර්තමාන අගය රදා පවති. මෙම උපකල්පනයන් සහ වට්ටම් අනුපාතය භාවිතා කරමින් ශුද්ධ පිරිවැය හා බැදීම තිරණය කරයි. නිගමනයන්ගේ වෙනස්වීම් මත ඇති වන බලපෑම නිශ්චිත ප්‍රතිලාභ බැදීමෙහි ධාරණ අගයට ගලපනු ලැබේ.

**2.23 නිකුත් කර ඇති මුත් ක්‍රියාත්මක නොවි ප්‍රමිත**

විස්තරාත්මකව විමර්ශණය කරන තෙක් පහත සදහන් නව ගිණුම්කරණ ප්‍රමිත ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරින්ගෙ ආයතනය මගින් නිකත් කොට ඇති මුත් 2016.3.31 වර්ෂය තුල ගිණුම් පිළියෙල කිරීමේදී ගැලපිම් කර නොමැත

නිකුත් කොට ඇති නමුත් බලාත්මක නොවන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්

ගිණුම්කරණ ප්‍රමිත නිකුත් කර ඇතත් මුල්‍ය ප්‍රකාශන නිකුත්කරන දිනට බලාත්මක කර නොමැති ප්‍රමිතීන් පහත දැක්වේ ප්‍රමිතින් බලාත්මක වීමෙන් පසුව අදාල කර ගැනීමට බලපොරෝත්තුවේ

ශ්‍රී ලංකා මුල්‍ය වාර්තා ප්‍රමිති 9 මුල්‍ය මෙවලම්

හදුනා ගැනීම හා මැනීම මුල්‍ය මෙවලම් සම්බන්දයෙන් පවතී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 වෙනුවට 2014 වර්ෂයේදී (ශ්‍රී ල මු වා ප්‍ර 9)

නිකුත් කර ඇත (ශ්‍රී ල මු වා ප්‍ර 9) මුල්‍ය වත්කම් හනිකරණය ගණනය කිරීම සදහා අපේක්ෂා ණය පාඩු ආකෘතියද ඇතුලත්ව මුල්‍ය මෙවලම් වර්ගීකරණය හා මැනීම් පිලිබදව සහ නව සාමාන්‍ය හෙජ් මුල්‍ය අවශ්‍යතාවන් පිළිබද මගපෙන්වීම් ශ්‍රී ගී ප්‍ර 09 බලාත්මක කිරීමේ දිනය 2018 ජනවාරි 01 දින වේ

ප්‍රකාශ කිරීම ශ්‍රී ලංකා රුපියල් වලිනි

| | | | 2016 | 2015 |
|---|---|---|---|---|
| **3** | **අයභාරය** | | | |
| | පොහොර විකුණුම් | | **4,242,769,733** | **3,835,989,834** |
| **4** | **විකුණුම් පිරිවැය** | | | |
| | ගැණුම් | 4.1 | 2,195,444,513 | 2,343,962,264 |
| | සෘජු වියදම | 4.2 | 706,080,500 | 755,041,799 |
| | **නිෂ්පාදන පිරිවැය** | | **2,901,525,014** | **3,099,004,063** |
| | අප්‍රේල් 01 දිනට නිම් තොගය | | 472,387,199 | 353,814,803 |
| | මාර්තු 31 දිනට නිම් තොගය | | (228,590,402) | (472,387,199) |
| | | | **3,145,321,810** | **2,980,431,667** |
| **4.1** | **ගැණුම්** | | | |
| | ආයනික පොහොර නීතීගත කළ වටිනාකම | | 15,494,384,181 | 13,525,770,075 |
| | රක්ෂණය | | 8,205,729 | 9,618,360 |
| | තීරුබදු හා තීරුබදු අධිභාරය | | 31,066.00 | 19,142 |
| | වරාය හා ගුවන් තොටුපළ සංවර්ධන බදු | | 787,110,378 | 648,096,063 |
| | විවිධ වියදම් (ශ්‍රී ලංකා වරාය අධිකාරිය) | | 4,636,760 | - |
| | නැව්භාණ්ඩ පරිහරණ ගාස්තු | | 5,385,523 | 3,253,942 |
| | ගොඩබෑමේ ගාස්තු | | 27,475,553 | 27,598,917 |
| | නිෂ්කාශන වියදම් | | 239,059,065 | 186,022,743 |
| | තීරුබදු ගාස්තු | | 2,151,751 | 6,569,185 |
| | මෙහෙයුම් වියදම් | | - | 9,122,404 |
| | ප්‍රමාද ගාස්තු | | 2,332,998 | 397,299 |
| | නියදි පරික්ෂණ ගාස්තු | | 5,592,308 | 5,100,348 |
| | ප්‍රවාහන හා පරිහරණ ගාස්තු | | 272,739,942 | 262,655,716 |
| | ණයවර ලිපි ගාස්තු | | 68,143,522 | 109,247,482 |
| | බැංකු ගාස්තු | | 559,029 | 963,118 |
| | දේශිය ගැණුම් | | 47,666,700 | 47,123,580 |
| | ඇසුරුම් ද්‍රව්‍ය | | 31,578,628 | 28,335,653 |
| | තොගභාර ඇප සඳහා ගාස්තු | | 4,382,014 | 1,945,082 |
| | දේශීය නියෝජිත කොමිස් | | 2,616,387 | 878,183 |
| | හුවමාරුව (ලාභ) / අඩු කිරීමට | | 789,636,490 | 162,241,068 |
| | සහනාධාර ඉල්ලීම් | | (15,598,243,511) | (12,690,996,096) |
| | | | **2,195,444,513** | **2,343,962,264** |
| **4.2** | **සෘජු වියදම** | | | |
| | මිශ්‍රණ වියදම් | | 26,470,825 | 23,313,443 |
| | නිශ්චල තොග සදහා වෙන් කිරීම | | - | 645,582 |
| | හැසිරවීමේ වියදම් | | 158,218,034 | 145,291,035 |
| | සේවක කුලී වියදම් | | 15,223,069 | 19,949,101 |
| | ද.පො.ග වලට ප්‍රවාහනවියදම් | | 514,489,459 | 439,429,234 |
| | වෙළඳ තොගය අතිරික්ත හිගය | | (640,667) | - |
| | තොගය මාරු කිරීම ගැළපීම | | (7,680,219) | 126,413,404 |
| | | | **706,080,500** | **755,041,799** |

වරහන් තුල අගයන් වලින් අඩු කිරීම් පෙන්නුම් කෙරේ
අංක 74 සිට 97 දක්වා පිටුවල දක්වා ඇති ගිණුම් ප්‍රතිපත්ති හා සටහන් මූල්‍ය ප්‍රකාශවල සංකලික කොටසක් වශයෙන් සැලකිය යුතය.

ප්‍රකාශ කිරීම ශ්‍රී ලංකා රුපියල් වලිනි

| | | 2016 | 2015 |
|---|---|---|---|
| **5** | **අනෙකුත් මෙහෙයුම් ආදායම්** | | |
